# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,841 — 1969 පෙබරවාරි 14 වැනි සිකුරාදා — 1969.2.14

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට |
|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 229 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 242 |
| ටෙන්ඩර් කැඳවීමේ දන්වීම ... ... ... | 242 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දන්වීම ... ... | 257 |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 258 |
| කොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | 259 |
| ආණ්ඩුවේ නොවන දන්වීම ... ... ... | |
| රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | |
| වෙන්දේසි කිරීම පිළිබඳ දන්වීම ... ... | |
| විවිධ දන්වීම ... ... ... | |


## තනතුරු — ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ මැටුපෙන් සියයට 7½ කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිය යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එම්ට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා මෙහි සිටින්නන් හැර සෙසු සෑම ලංකාවේ කම්ර පෙදෙසක මූවක් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දන්වීම පිළිබඳ**

### විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

6. **වෛද්‍ය පරීක්ෂණය.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් අමෙරිකා එක්සත් ජනපදයේ අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට රජය විසින් පත් කරනු ලබන විශෙෂ වෛද්‍ය මණ්ඩලයක් මගින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

7. බලාපොරොත්තුවන පුහුණුව අයදුම්කරුවන් විසින් දැනට දරන තනතුරෙහි වැඩි වේතනයක් හෝ උසස්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේ ය.

8. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරැදි ප්‍රකාශයක් කර ඇති බව තෝරාගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එයින් නුසුදුසු බවට පත්වේ. තෝරා ගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

9. තෝරාගනු ලැබූ අපේක්ෂකයෙකු තෝරාගැනීමෙන් පසු නාම යෝජනා කරනු ලැබීම හෝ නාමයෝජනා කිරීමෙන් පසු ප්‍රදානයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කළහොත්, අවුරුදු දෙකක කාලපරිච්ඡේදයක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

10. කිසියම් අපේක්ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාම යෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතුය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සම්පූර්ණයෙන්ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදුවන්නක් හෙයිනි.

11. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබා ගැනීමට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන් ම එම අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

12. මේ නිවේදනයේ හා අයදුම්පත් ආකෘතියේ සඳහන් අවශ්‍යතාවන් සියල්ල සැම ආකාරයෙන්ම සම්පූර්ණ නොකෙරෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ ය.

13. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශෙෂ ආකෘතියක පිළියෙල කළ යුතු අයදුම්පත් 1969. 2. 26 වැනි දින හෝ ඉන් පෙර ලැබෙන සේ, කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත කෙලින්ම එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. අයදුම් පත් ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් එවිය යුතු නොවේ.

14. සැම අයදුම්පතක් සම්බන්ධයෙන් ම රුපියල් 10 ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතු වන්නේ ය. අයදුම්පත් ආකෘතියේ මුල් පිටුවේ ඒ සඳහා වෙන්කොට ඇති කොටුවේ ඇති රුපියල් 10 ක මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යෙදීමෙන් අවලංගු කළ යුතුය. කවර හේතුවක් නිසාවත් මුද්දර ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

15. සියළුම අයදුම්පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම්පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7 ක් ඇතුළත අයදුම් පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම්කරු ගැන සළකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1969 පෙබරවාරි මස 6 වැනිදා,
කොළඹ 2,
මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දී ය.

**2-409—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය**

---

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පෙරදිග සහාය සංගීත පරීක්ෂක තනතුරු

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ සහාය සංගීත පරීක්ෂක තනතුරු සඳහා මෙහි පහත දක්වා ඇති සුදුසුකම් ලබා ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පහත සඳහන් කරනු ලබන ආකෘති පත්‍රයට අනුව එවිය යුතු ඉල්ලුම් පත්‍ර 1969 පෙබරවාරි මස 27 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ, කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ සාමාන්‍ය පරිපාලන ශාඛාවේ ස්ථිර ලේකම් වෙත එවිය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුර සඳහා නියමිත වැටුප් ක්‍රමය රු. 1,980න් පටන් ගෙන රු. 120 වාර්ෂික පඩි වැඩිවීම් 16 කින් රු. 3,900 දක්වා නඟී. රු. 2,820 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ද වේ.

3. **සේවයට බඳවා ගැනීමේ නියමයන්.**—(i) තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මුල් අවස්ථාවේදී පත්වීම ලබා අවුරුදු තුනක් ගත වන තුරු ආධුනික තත්ත්වයේ සිටිය යුතුය.

(ii) වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. කාන්තාවක් මෙම තනතුරට පත් කරනු ලැබුවහොත්, ඇය අර්ථ සාධක අරමුදල් ප්‍රතිලාභයන්ට හිමිකාරියක් වන අතර ඒ සඳහා ඇය විසින් ඇයගේ වැටුපෙන් සියයට පහක දායක මුදලක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ගෙවිය යුතුය. දස වසක මුළු සේවා කාලය සම්පූර්ණ කිරීමට ප්‍රථම ඕනෑම අවස්ථාවක දී නිලධාරිනියක් විසින් තවදුරටත් අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවන්නේ ද, විශ්‍රාම වැටුප් ක්‍රමයට මාරු කළ යුතුද යන්න ගැන සිය මනාපය දක්වා සිටිය යුතුය. පාසල් ගුරු විශ්‍රාම වැටුප් රෙගුලාසිය යටතේ හා/හෝ රජයේ අර්ථ සාධක අරමුදලට අයත් තනතුරක දස වසක සේවාවක් සම්පූර්ණ කර තිබේ නම් තනතුරට පත්වී මාස 6 ක් තුලදී සිය මනාපය ප්‍රකාශ කළ යුතුය.

(iii) දැනටමත් විශ්‍රාම වැටුප් හිමි ස්ථිර තනතුරක් දරණ නිලධාරියෙකු තෝරා ගනු ලැබුවහොත් ඔහු මුල් අවස්ථාවේදී මෙම තනතුරෙහි වැඩ බැලීම සඳහා පත් කරනු ලැබේ.

4. **සේවා කොන්දේසි.**—රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා නව ප්‍රවේශකයෙකු නම් —

(i) ඔහුගේ/ඇයගේ ආධුනික/පරීක්ෂණ කාලය අවුරුදු තුනක් විය යුතුය.

(ii) ඔහු/ඇය 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවතින්නා වූත් හෝ මතුවට පනවනු ලැබිය හැකි වූ හෝ යම් නීති රීති වලට සහ ව්‍යවස්ථාවලටත් එකඟව කටයුතු කිරීමේ කොන්දේසිය පිළිගත යුතුය.

(iii) ඔහුගේ/ඇගේ ආධුනික/පරීක්ෂණ කාලය තුළදී රාජ්‍ය භාෂාව වන සිංහලෙන් වැඩ කිරීමට සෑහෙන දැනුමක් ලබාගත යුතුය.

(iv) ආධුනික/පරීක්ෂණ කාලය අවසානයේදී පත්වීම ස්ථිර කිරීම, අනිකුත් කරුණු අතර පත්වීමේ දිනයේ සිට පිළිවෙලින් අවුරුද්දක්, අවුරුදු දෙකක් සහ අවුරුදු 3 ක් ඇතුළත I වැනි ශ්‍රේණියේ II වැනි ශ්‍රේණියේ සහ III වැනි ශ්‍රේණියේ පරීක්ෂණයන්ගෙන් (නැතහොත් අදාල වන අවස්ථාවල අවුරුද්දක් සහ අවුරුදු 2 ක් ඇතුළත I වැනි ශ්‍රේණියේ සහ II ශ්‍රේණියේ පරීක්ෂණයන්ගෙන්) සමත්වීම උඩ රඳා පවතී. නියමිත කාලසීමාවන් තුළදී නියමිත පරීක්ෂණයන්ගෙන් සමත් නොවුවහොත් එය ඔහුගේ වැටුප් වැඩිවීම් අත්හිටුවීමට හේතු වේ. නියමිත කාලයෙන් පසු තවත් සමසක් ගත වන්නට පෙර පරීක්ෂණයෙන් සමත් නොවුවහොත්, වැටුප් වැඩිවීම්, අත්හිටුවීම, වැටුප් වැඩිවීම් නතර කිරීමකට පරිවර්තනය කර පරීක්ෂණය සමත්වන තෙක් හෝ මෙහි පහත v වන ඡේදයේ ඇති විධිවිධාන අදාල වන කාලය එනතෙක් හෝ එම නතර කිරීම ක්‍රියාත්මකව තබනු ඇත.

(v) ආධුනික/පරීක්ෂණ කාලය අවසාන වන විට නියමිත සිංහල ප්‍රවීණතා තත්ත්වය ලබා නොගතහොත් අංක 120 සහ 121 යන පරිපාලන රෙගුලාසිවල විධිවිධාන අදාල වනු ඇත.

(vi) තෝරා ගනු ලබන අයදුම්කරු රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, පාලන රෙගුලාසි, මුදල් රෙගුලාසි, අමාත්‍යාංශ නියෝග හා කලින් කල රජයේ නිකුත් කරනු ලබන නියෝග වලට ද යටත් වනවා ඇත.

(vii) රු. 2,820 වැටුප් තලයට පෙර එළඹෙන කාර්යක්ෂමතා කඩඉමෙන් උසස් කිරීම පිණිස ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාග තත්ත්වයේ හෝ උසස් විභාගයක දී සිංහල භාෂාව විෂයයෙන් හෝ සිංහල සාහිත්‍යය විෂයයෙන් සමත්විය යුතුය. එසේ සමත්වීමට අපොහොසත්වීම වැටුප් වැඩිවීම විලම්බනය කිරීමට හේතු වේ.

(ඉහත සඳහන් iii, iv සහ v යන කොන්දේසි සිංහල මාධ්‍යයෙන් සේවයට බඳවා ගනු ලැබූවන්ට අදාල නොවේ.)

5. **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.**—සැම අයදුම්කරුවකුම —

(i) 1969.2.27 දිනට වයස අවුරුදු 23 ට වැඩි හා 40 ට අඩු විය යුතුය. දැනටමත් රජයේ සේවයෙහි නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව නොයෙදේ.

(ii) (අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් ; හෝ

(ආ) දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව, අංක ගණිතය/ගණිතය ඇතුලුව විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ; හෝ

(ඇ) ඊට සම හෝ උසස් විභාගයකින් සමත් වී සිටිය යුතුය.

(iii) පිළිගත් විශ්ව විද්‍යාලයක පෙරදිග සංගීත පිළිබඳ ඩිප්ලෝමා සහතිකයක් නැතහොත් ඊට සමාන වෙනත් පිළිගත් සහතිකයක්, හෝ රජයේ ලලිතකලා ආයතනයේ/රජයේ සංගීත විද්‍යාලයේ පෙරදිග සංගීතය පිළිබඳ සය අවුරුදු පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර ලබාගත් සහතිකය හෝ ලංකා ගාන්ධර්ව සභාවේ පෙරදිග සංගීතය පිළිබඳ අවසාන සහතිකය හෝ ලබා සිටිය යුතුය.

(iv) යටත් පිරිසෙයින් සතර වර්ෂයක ඉගැන්වීමේ පළපුරුද්දක් ලබා සිටිය යුතුය.

**සංලක්ෂ්‍යය.**—සිංහල ජන සංගීතය හා දේශීය නැටුම් පිළිබඳව මනා අවබෝධයක් හා ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති අය ගැන විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

6. ඉල්ලුම්කරුවන් විසින් මෙහි පහත දක්වෙන ලියකියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ) ස්වකීය ඉල්ලුම් පත්‍ර වලට ඇමිණිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සංලක්ෂ්‍යය.—බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්‍යයන් සඳහා නිකුත් කරණ ලද සහතික භාරගනු නො ලැබේ.)

(ආ) ශාස්ත්‍රීය සහ/හෝ වෘත්තීය සුදුසුකම් පිළිබඳ ලබා තිබෙන උසස්ම සහතික පත්‍ර.

(ඇ) ඉල්ලුම්කරුගේ අධ්‍යාපන සුදුසුකම්, කල්ක්‍රියාව හා තනතුරට පත් කරනු ලැබීමට යෝග්‍යතාව පිළිබඳ මෑතදී ලබාගත් සහතික තුනක් (සංලක්ෂ්‍යය.—දැනට රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් විසින් මේ අනුඡෙදය යටතේ සහතික ඉදිරිපත් කිරීම අනවශ්‍ය ය.)

7. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන ඡෙදයේ ආරම්භයේ පළ කර තිබෙන රජයේ සේවයේ තනතුරු වලට පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසිවලට සැලකිල්ල යොමු කරනු ලැබේ.

8. මුද්‍රිත අයදුම් පත්‍ර සපයනු නො ලැබේ. ආකෘති පත්‍ර පහත පෙනෙන ආදර්ශ ආකෘති පත්‍රයෙන් පිටපත් කර ගත යුතුය.

9. දැනට රජයේ සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනයෙන් පසු මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත් භාරගනු ලබන්නේ ඒවා නියමිත දිනයට කලින් දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ලැබී තිබුණ හොත් හා අයදුම්පත් පමාවීමට සැහෙන හේතූන් දක්වමින් එම අයදුම්පත් භාරගන්නා ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානීන් නිර්දේශ කළහොත් පමණි.

10. සියලුම අයදුම් පත්‍ර ලැබුණ බව දන්වා එවනු ලැබේ. අයදුම් පත්‍ර භාර ගැනීම අවසන් කොට සති 3 ක් ඇතුළත එසේ දන්වා එවනු නොලැබූ අයදුම්කරුවන් විසින් ඒ බව සාමාන්‍ය පරිපාලන ශාඛාවේ, ස්ථිර ලේකම් තැනට වහාම දන්වා එවිය යුතුය. මෙම නියමය නොපිළිපැදීම අයදුම් කරුවෙකු ගැන සලකා බැලීම සඳහා ඇති අයිතිවාසිකම් නැතිවීමට හේතු වනවා ඇත.

---

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

සාප/22/93,
1969 පෙබරවාරි මස 5 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දී ය.

ආදර්ශ ආකෘති පත්‍රය

### පෙරදිග සහාය සංගීත පරීක්ෂක තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ලිපිනය :————.

3. 1969 පෙබරවාරි මස 27 වැනි දිනට නිවැරදි වයස :————.
අවු :————. මාස :————. දින :————.

4. ජාතිය හා එය ලද අන්දම :————.

5. උපන් ස්ථානය :—
(අ) ඉල්ලුම්කරු :————.
(ආ) ඔහුගේ/ඇගේ පියා :————.
(ඇ) පියාගේ පියා :————.
(ඈ) පියාගේ පියාගේත් පියා :————.

6. (අ) පෙරදිග සංගීතය පිළිබඳව ලබා ඇති සහතික පත්‍ර :————.
(ආ) පෙරදිග සංගීතය පිළිබඳව ලත් පළපුරුද්ද :—

| පාඨශාලාවේ හෝ විද්‍යාලයේ නම | දරූ තනතුර | ඇතුළත් වූ දිනය | අස් වූ දිනය | සේවා කාලය අවු. මා. දින | අස්වීමට හේතුව |
|---|---|---|---|---|---|
| | | | | | |

7. පහත සඳහන් භාෂාවන් පිළිබඳ දැනීම :—
(අ) සිංහල :————.
(ආ) ඉංග්‍රීසි :————.

8. ඉගෙනීම ලැබූ විද්‍යාලය, සංගීත ආයතන හා විශ්ව විද්‍යාල :————.

9. දැනට යෙදී සිටින රක්ෂාව විස්තර සහිතව (ගුරුවරයෙකු නම් ලියා පදිංචි කළ අංකය, පාඨශාලාවේ නම, දැනට ලබන වාර්ෂික වැටුප, වැටුප් ක්‍රමය හා මීළඟ වැටුප් වැඩිවීමේ දිනය) :————.

10. යුද්ධ සේවය ඇත්නම් කාලය (අස්වීමේ සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය) :————.

11. චරිත සහතික ලබාගත් අයගේ (ඥාතීන් නොවේ) නම් හා නිලතල (චරිත සහතික තුනක පිටපත් (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුය.) රජයේ සේවකයන් සම්බන්ධයෙන් මෙය අනවශ්‍යය : ————.

12. වෙනත් විස්තර :————.

මෙම අයදුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි. මේ අයදුම් පත්‍රයේ යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් ලියා තිබෙන බව තේරීමට කලින් අනාවරණය වුවහොත් මා මෙම තනතුරට පත්වීමට නුසුදුස්සෙකු බවට පැමිණෙනවා පමණක් නොව, තේරීමෙන් පසු ව ඒ බව දැනගන්නට ලැබුනහොත්, කිසිම වන්දි ගෙවීමක් රහිතව, මා රාජකාරියෙන් පහකර දැමීමට යටත් වන බව මම දනිමි.

දිනය :————. ———— අයදුම්කරුගේ අත්සන.

2–410—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

## ලංකා යුද්ධ හමුදාවේ නිලධාරි තනතුර සඳහා ඇබෑර්තු

1. ලංකා යුද හමුදාවේ කෘෂිකර්ම නිළධාරි තනතුර සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. තෝරා පත්කර ගනු ලබන අපේක්ෂකයා ලංකා යුද හමුදාවේ ලුතිනන් නිළයෙහි ස්ථිර අධිකාරි පත්වීම් පිරිනමනු අතර ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකායට ඇතුළත් කරනු ලැබේ.

3. (අ) පත්වීම් ලැබීමේදී තෝරා පත් කර ගනු ලබන ඉල්ලුම් කරු 1961 යුද හමුදා වැටුප් සංග්‍රහයන්හි නියම කර ඇති පරිදි ඔහුගේ නිළයට අනුකූල වූ වැටුප් හා දීමනා ගෙවනු ලැබේ. මේජර් නිලය දක්වා ගෙවනු ලබන මූලික වැටුප් ප්‍රමාණයන් පහත දක්වා ඇති පරිදි වේ :—

ලුතිනන්—වාර්ෂික වැටුප රු. 4,860—රු. 180 වැඩිවීම් 2 සහ රු. 360 වැඩිවීම් 1—රු. 5,580.

කපිතන්.—වාර්ෂික වැටුප රු. 6,660—රු. 180 වැඩිවීම් 6—රු. 7,740.

මේජර්.—වාර්ෂික වැටුප රු. 8,820—රු. 180 වැඩිවීම් 6—රු. 9,900.

(ආ) පහත සඳහන් දීමනා ද ගෙවනු ලැබේ :—

(i) නිළධාරීන් සඳහා වූ නේවාසිකාගාරයක නවාතැන් පහසුකම් සලසා නොමැති නිළධාරීන්ට, රජයේ නිළධාරීන්ට ගෙවීමට රජයෙන් අවසර දී ඇති ගෙවීම් ප්‍රමාණයන්ට අනුව, ජීවනාධාර සහ විශේෂ ජීවනාධාර, නේවාසිකාගාරයක ඉඩකඩ පහසුකම් ලබා දී ඇති නිළධාරීන්ට යුද හමුදා වියදමෙන් කෑම් බීම් සපයනු ලබන අතර, ඔවුන්ට මෙම දීමනා අහිමි වේ.

(ii) සේවා හෝ රජයේ විවාහක නිවාසයක් ලබා දී නොමැති විවාහක නිලධාරියෙකුටත්, නේවාසිකාගාර ඉඩකඩ පහසුකම් හෝ ඔහුගේ පදවියට නියමිත විශේෂ නිවාසයක් ලබා දී නොමැති අවිවාහක නිළධාරියෙකුටත්, රජයේ නිළධාරීන්ට ගෙවීමට රජයෙන් අවසර දී ඇති ගෙවීම් ප්‍රමාණයන්ට අනුව සහ නියමිත කොන්දේසි උඩ ගෙවල් කුලී දීමනා.

(iii) නේවාසිකාගාරය තුළ වාසය කිරීමට අණ ලැබ, නේවාසිකාගාර පහසුකම් සපයනු ලැබ, යුද හමුදා වියදමෙන් කෑම බීම සපයනු ලබන කාලපරිච්ඡෙදයන් තුළ සෑම සම්පූර්ණ පැය 24 ක කාලයක් වෙනුවෙන් විවාහක නිළධාරියෙකුට රු. 1.50 ගෙවීම් ප්‍රමාණය අනුව වෙන්වීමේ දීමනාවක් ගෙවනු ලැබේ. එවැනි කාලපරිච්ඡෙදයක් තුළ ජීවනාධාර, විශේෂ ජීවනාධාර, යැපීම් සහ වෙනත් නවාතැන් ගාස්තු ගෙවනු නොලැබේ.

(iv) රජයේ නිළධාරීන්ට ගෙවීමට රජයෙන් අවසර දී ඇති ගෙවීම් ප්‍රමාණයන්ට සහ නියමිත කොන්දේසිවලට අනුව ගමන් වියදම් දීමනා (යැපීම්, නවාතැන්, සැතපුම් ගාස්තු, ස්ථාන මාරු දීමනා) ගෙවනු ලැබේ.

(v) 1961 යුද හමුදා වැටුප් සංග්‍රහයෙහි නියම කර ඇති පරිදි අනිකුත් දීමනා (ඇඳුම් පැළඳුම්, නිළ ඇඳුම්, නඩත්තු හා මෙහෙකරු දීමනා) ගෙවනු ලැබේ.

(ඇ) නිළධාරීන්ගේ වැටුප්, මතු බලාපොරොත්තු හා සේවා කොන්දේසි සම්බන්ධයෙන් පහත සඳහන් රෙගුලාසි ඔවුන් කෙරෙහි බලපවත්වනු ඇත :

(i) 1961 අප්‍රේල් මස 28 වැනි දින අංක 12,395 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරණු ලැබ, කලින් කල සංශෝධිත 1961 යුද්ධ හමුද වැටුප් සංග්‍රහය.

(ii) 1949 ඔක්තෝබර් මස 10 වැනි දින අංක 10,028 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, කලින් කල සංශෝධිත 1949 නිළධාරින්ගේ රෙගුලාසි.

(iii) 1961 සැප්තැම්බර් මස 28 වැනි දින අංක 12,680 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරණු ලැබ, කලින් කළ සංශෝධිත 1961 විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය.

වෙනත් වැඩි විස්තර කොළඹ, යුද්ධ හමුද මූලස්ථානයෙන් ලබා ගත හැක.

4. අපේක්ෂකයින් විසින් පහත සඳහන් කොන්දේසි සපුරාලිය යුතුයි :—

(අ) ජාතිය.—ඉල්ලුම්කරුවන් ලංකාවේ පුරවැසියන් විය යුතුයි.

(ආ) වයස.—ඉල්ලුම්කරුවන් 1969 මාර්තු මස 1 වැනි දිනට වයස අවුරුදු 28 ට නොවැඩි විය යුතුයි.

(ඇ) අධ්‍යාපනික හා වෘත්තිය සුදුසුකම්.—පහත සඳහන් සුදුසුකම් ඔවුනට තිබෙන බවට අපේක්ෂකයින් විසින් සතුටුදයක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(i) පිළිගත් විශ්ව විද්‍යාලයකින් කෘෂිකර්ම පිළිබඳ උපාධියක්

සහ

කෘෂිකර්ම පිළිබඳව අඩු වශයෙන් අවුරුදු 3 ක පළපුරුද්දක්.

(ඈ) සෞඛ්‍ය තත්ත්වය.—අයදුම්කරුවන් යුද හමුදවට අවශ්‍ය සෞඛ්‍ය තත්ත්වය සපුරාලීමට සුදුසුකම් ලබා සිටිය යුතු යි.

5. පහත දක්වා ඇති අන්දමට ඉල්ලුම් පත් තම අත් අකුරින් විය යුතු අතර, 1969 මාර්තු මස 1 වැනි දිනට දහවල් 12.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ යුද හමුද මූලස්ථානය, තැ. පෙ. 553, කොළඹ යන ලිපිනයට ඉදිරිපත් කළ යුතු යි. ඉල්ලුම් පත් බහාලන කවරයෙහි '' යුද්ධ හමුදවේ කෘෂිකර්ම නිළධාරි තනතුර සඳහා ඉල්ලුම් පත'' යනුවෙන් සඳහන් කළ යුතුයි. අයදුම් පත් භාරගනු ලබන දිනයට හා වේලාවට පසු මෙම මූලස්ථානයට ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ. අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

6. රජයේ සේවයේ යෙදී සිටින නිළධාරින්ගේ ඉල්ලුම් පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු අතර, යම්කිසි නිළ-ධාරියෙකු තෝරා පත් කර ගනු ලැබුවහොත්, ඔහු සේවයෙන් නිදහස් කළ හැකි බවට සහතික කළ යුතු ය. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය අඩංගු නොකළ හොත්, රජයේ විශ්‍රාම වැටුප් හිමි සේවා කාලය හමුද විශ්‍රාම වැටුපට ගණන් ගනු නොලැබේ.

7. පහත සඳහන් ලියකියවිලිවල පිටපත් ඉල්ලුම් පතට අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) තමා ලබා ඇති අධ්‍යාපනික සහතිකය/වෘත්තීය සුදුසුකම් පිළිබඳ උසස්ම සහතිකය.

(ඇ) අඩු ගණනේ චරිත සහතික පත් දෙකක්, මෙම සහතික පත් ඉල්ලුම් කරු පුද්ගලිකව දන්නා හඳුනන වගකිව යුතු පුද්ගලයන්ගෙන් මෑත දී ලබා ගත් ඒවා විය යුතු ය.

8. ලැබෙන ඉල්ලුම් පත් සංඛ්‍යාව ගැන සලකා බලා, අවශ්‍ය වුවහොත් ඉහත සඳහන් සුදුසුකම් ඇති අය අතුරෙන් මූලික තේරීමක් කරනු ලැබේ. අවසාන තෝරා පත් කර ගැනීම කරනු ලබන්නේ, එසේ තෝරා ගත් ඉල්ලුම් කරුවන් ආරක්ෂක අමාත්‍යාංශය විසින් පත් කරනු ලබන තේරීම් මණ්ඩලයක සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසුවය. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගන්නා ඉල්ලුම්කරුවනට, එය පවත්වන ස්ථානය දිනය සහ වේලාවන් ලියා දන්වනු ඇත. සම්මුඛ පරීක්ෂණය කොළඹ පැවැත්වෙන අතර, ඒ සඳහා ගමන් වියදම් හෝ අනිකුත් වියදම් රජයෙන් ගෙවනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු නොලබන ඉල්ලුම් කරුවන්ට ඒ බව දන්වනු ඇත.

9. තෝරා පත් කර ගනු ලබන ඉල්ලුම්කරු විසින් රජයේ භාෂා ප්‍රති-පත්තිය ක්‍රියාවේ යෙදවීමට සහ විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පණත ක්‍රියාත්මක කිරීම අරභයා දනටමත් පනවා ඇති හෝ මීන් පසුව පනවනු ලැබිය හැකි නීති රීතිවලට අනුකූලව කටයුතු කිරීම අවශ්‍ය වේ.

10. සන්නද්ධ සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල සඳහා තම දයක මුදල වශයෙන් තම මූලික වැටුපෙන් සියයට 4 ක මුදලක් අඩුකර ගැනීම සඳහා තම කැමැත්ත ප්‍රකාශ කරන ලියවිල්ලක් තෝරා ගනු ලබන අපේක්ෂකයා විසින් දිය යුත්තේය.

එම්. එල්. ඩී. ජේ. පෙරේරා,
කර්නල්,
යුද හමුද ආඥපති වෙනුවට.

1969 පෙබරවාරි මස 7 වැනි දින.

**ලංකා යුද්ධ හමුදවේ කෘෂිකර්ම නිළධාරි තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නාම (පැහැදිලි අකුරෙන්) :————.

2. ජාතිය :————.
(ලාංකිකයෙකු වූයේ පෙළපතින්ද නැතහොත් ලියාපදිංචි කිරීමෙන්ද? ලියාපදිංචි කිරීමෙන් නම් සහතිකයේ අංකය සහ දිනය සඳහන් කරන්න).

3. ලිපිනය :—.
කාර්යාලයේ :————.
වාසස්ථානයේ :————.

4. උපන් දිනය :————.
1969.3.1 වැනි දිනට වයස :—.
අවුරුදු :————, මාස :————, දින :————.

5. සම්පූර්ණ නම, උපන් ස්ථානය, සහ දැන් ලිපිනය :—.
මවගේ :————.
පියාගේ :————.

6. ඔබ විවාහක ද ? අවිවාහක ද ? :————.

7. පාසැලේදි හෝ විශ්ව විද්‍යාලයේ දී ඔබ විසින් කීර්තිය ලබා ඇති වෙනත් ක්‍රීඩා ශූරත්වයන් :————.

8. පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේ දී ඔබ විසින් කීර්තිය ලබා ඇති වෙනත් ක්‍රීඩාවන් :————.

9. සන්නද්ධ සේවයේ හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍ය භට බලකායේ හෝ බාල දක්ෂ ව්‍යාපාරයන් හි හෝ ඔබ ඉහතින් කිනම් සේවයක් කර තිබේ ද :————.

10. මෙම පදවිය ලැබීමට ඔබ සතු වෙනත් විශේෂ සුදුසුකම් මොනවාද : ————.

11. මීට ඉහතින් යම්කිසි සන්නද්ධ සේවයකට බැඳීමට ඉල්ලුම් කෙලෙහිද ? එසේ නම් එහි ප්‍රතිඵලය වූයේ කුමක් ද? :————.

12. ඔබගේ පාසැල් සමය විශ්ව විද්‍යාල සමය පිළිබඳ පහත සඳහන් විස්තර සයන්නා :—
පාසැලේ හෝ විශ්ව විද්‍යාලයේ නාමය :————.
ඇතුල් වූ දිනය :————.
අස් වූ දිනය :————.
සමර්ථ වූ ප්‍රසිද්ධ පරීක්ෂණ :————.

13. පාසැලෙන් හෝ විශ්ව විද්‍යාලයෙන් අස් වූ දින සිට ඔබ නියුක්ත වී සිටි රැකියාවන් පිළිබඳ පහත සඳහන් විස්තර දක්වන්න :—
ස්වාමි පක්ෂය :————.
රැකියාවේ ස්වභාවය :————.
සේවය කළ කාලය :————. දින සිට :————දින දක්වා

14. ඔබට චරිත සහතික දුන් අයගේ නම් සහ ලිපිනයන් :————.

මෙම අයදුම් පතෙහි මවිසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මම මෙයින් සහතික කරමි.

————
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

2–418—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන අමාත්‍යාංශයේ නගර හා ග්‍රාම නිර්මාණ අංශය

### සැලසුම්කරු තනතුරු

පළාත් පාලන අමාත්‍යාංශයේ නගර හා ග්‍රාම නිර්මාණ අංශයේ II වන පංතියේ සැලසුම්කරු තනතුරු දෙකක් සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව පිළියෙල කර ගත් ඉල්ලුම්පත්‍ර 1969 මාර්තු මස 2 වැනි දිනට හෝ ඊට පෙර මා වෙත ලැබිය යුතුය.

**2. වැටුප් දීමනා හා සේවා කොන්දේසි :**

(1) මෙම තනතුර සඳහා නියමිත වැටුප් ක්‍රමය මෙසේය: රු. 1,260 න් පටන් ගෙන වර්ෂයකට රු. 120 බැගින් රු. 3,870 දක්වා වැඩිවන වාර්ෂික වැටුපක් මේ තනතුර සඳහා ගෙවන අතර රු. 2,820 දී කාර්යක්ෂමතා කඩඉමක් ද වෙයි.

සැ. යු.—තෝරාගත් අයදුම්කරුවන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද ගැන සලකා බලා මූලික වැටුපට වැඩි වැටුපක් පටන් ගැනීමේ දී භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව ගෙවිය හැක.

**3. සේවා කොන්දේසි :**

මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම අවුරුදු 3ක ආධුනික කාලයකට යටත්වනු ඇත.

**4. අවශ්‍ය සුදුසුකම් :**

සෑම අයදුම්කරුවෙක් ම—

(අ) වයසින් අවුරුදු 20 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි බවත්, මනා චරිතයකින් හා ශාරීරික සනීපයකින් යුක්ත බවත්,

(ආ) ලංකා කාර්මික විද්‍යාලයේ සැලසුම්කරුවන් පිළිබඳ වූ අවුරුද් දක පූර්ණකාලීන පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කළ අයෙකු බව හෝ ඒ සමාන තත්ත්වයේ වෙනත් අධ්‍යයන

පාඨමාලාවක් (උදා. මිනින්දෝරු සැලසුම්කරුවන් පිළිබඳ අධ්‍යයන මාලාව) සමග අවුරුදු දෙකක ආධුනිකත්වයක්, හෝ

(ii) අවුරුද්දක ආධුනිකත්වයක් සහිතව ලංකා කාර්මික විද්‍යාලයේ සුළු පරිපාලකවරුන් පිළිබඳ අධ්‍යයන මාලාව හෝ කණිෂ්ඨ කාර්මික නිලධාරීන් පිළිබඳ අධ්‍යයන මාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කළ බව, හෝ

(iii) ප්‍රසිද්ධ ඉංජිනේරු සමාගමක හෝ වරලත් ඉංජිනේරුවන් හෝ ගෘහ නිර්මාණ ශිල්පීන් යටතෙහි අවුරුදු හතරක නිත්‍ය ආධුනිකයෙකු වශයෙන් සේවය කොට අවුරුදු තුනක කාල යක් ලංකා කාර්මික විද්‍යාලයේ විවිධ ශ්‍රේණියන්හි පස්වරු පංතිවලට පැමිණි අයෙකු (මෙම සුදුසුකම් ඇති අයදුම් කරුවන් රු. 1,620 ක වාර්ෂික පටන් ගැනිමේ වැටුපට හිමිය.) හෝ

(iv) 1947 ට පෙර ලංකා කාර්මික විද්‍යාලයේ ගොඩනැගිලි තැනීම පිළිබඳ දෙවැනි පෙළ සමත්, රජයේ දෙපාර්තමේන්තුවක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක සැලසුම්කරුවකු වශයෙන් හෝ උපකරණ ද්‍රව්‍ය ඇස්තමේන්තු කරන්නෙකු වශයෙන් අවුරුදු දෙකකට වැඩි කාලයක් සේවය කළ අයෙකු, හෝ

(v) අවුරුදු 5 ක කාලයක් සැලසුම්කරුවෙකු වශයෙන් ප්‍රසිද්ධ ඉංජිනේරු සමාගමක හෝ වරලත් ඉංජිනේරුවන් හෝ ගෘහ නිර්මාණ ශිල්පීන් යටතෙහි සේවය කළ අයෙකු හෝ

බවත් ඔප්පු කිරීමට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

5. අයදුම්කරුවන් විසින් තම අයදුම්පත්වලට පහත සඳහන් සහතික පත්වල පිටපත් අමුණා එවිය යුතුය :—

(i) උප්පැන්න සහතිකයේ පිටපතක් (සැ.යු.—බෞතීස්ම පිළිබඳ සහතික පත්‍ර හෝ ආධාර ලබන පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් වන කටයුතු සඳහා දෙනු ලබන සහතික පත්‍ර හෝ භාරගනු නොලැබේ.)

(ii) අයදුම්කරු ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර.

(iii) ළඟදී ලබාගත් චරිතය පිළිබඳ සහතික පත් 3 ක්.

මෙම ගැසට් පත්‍රයේ ප්‍රථම භාගයේ දෙවැනි ඡේදයේ මුලින් දක්වෙන රාජ්‍ය සේවයේ තනතුරුවලට පත්කිරීම පිළිබඳ වූ සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

ඩබ්ලිව්. පත්මනාදන්,
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන හා ගිණුම්),
පළාත් පාලන අමාත්‍යාංශය.

ඩී. ආර්. විජයවර්ධන මාවත,
කොළඹ 10,
1969 පෙබරවාරි මස 6 දින.

## පළාත් පාලන අමාත්‍යාංශයේ නාගර හා ග්‍රාම නිර්මාණ අංශය

### II වන පංතියේ සැලසුම්කරුවන්ගේ තනතුරු පිළිබඳ වූ ආකෘති පත්‍රය

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය හා ස්ථානය :————.
4. ජාතිය :————.
5. දැනට රක්ෂාවක් කරයි නම් එය :————.
6. දැනට රක්ෂාවක් නොකරයි නම් අන්තිමවරට කළ රක්ෂාව : ————.
7. අධ්‍යාපනික සුදුසුකම් :————.
8. කාර්මික සුදුසුකම් :————.
(සමර්ථ වූ විභාග සඳහන් කරන්න)
9. පුහුණුවීම හා පළපුරුද්ද පිළිබඳ විස්තර, දින සහිතව :————.
10. කලින් කරන ලද රක්ෂාවන් සහ ලබන ලද පළපුරුද්ද පිළිබඳ විස්තර දින සහිතව :————.
11. කලින් රජයේ දෙපාර්තමේන්තුවක සේවය කළේ නම් ඉන් අස් වීමට හේතුව :————.
12. අපරාධ නඩුවක් සම්බන්ධයෙන් උසාවියකින් දඬුවම් ලබා ඇත්නම් වරද හා දඬුවම් පිළිබඳ විස්තර :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

2–407—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

### ජනපද නිලධාරි තනතුරු

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ දෙවැනි ශ්‍රේණියේ ජනපද නිලධාරි තනතුරු සඳහා අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ. මෙම දැන්වීම කෙළවර ඇති ආකෘතියේ ආකාරයට අයදුම්කරුවන් විසින්ම පිළියෙල කර ගත යුතු ඉල්ලුම්පත්, 1969 මාර්තු මස 5 වැනි දින හෝ ඊට පෙර හෝ ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් " ඉඩම් කොමසාරිස්, තැ. පෙ. 500, කොළඹ 1 " යන ලිපිනය වෙත එවිය යුතුය. ලිපි කවරයෙහි ඉහළ වම් කෙළවර " ජනපද නිලධාරි තනතුර " යන්න සඳහන් කළ යුතුය. නියමිත ආකෘතියට අනුව පිළියෙල නොකළ අයදුම්පත් භාරගනු නොලැබේ.

2. **වැටුප් ක්‍රමය.—**

II වැනි ශ්‍රේණිය.—වසරකට රු. 1,380—120—රු. 3,780.

I වැනි ශ්‍රේනිය—වසරකට රු. 3,180—120/180/240—රු. 5,820.

I **සටහන.**—කෘෂිකර්මය පිළිබඳ උපාධිධාරීන් හා කෘෂිකර්මය පිළිබඳ ප්‍රායෝගික පළපුරුද්ද ඇති උපාධිධාරීන් වර්ෂයකට රු. 1,380—120—3,780 වැටුප් ක්‍රමයේ වර්ෂයකට රු, 1,620 වැටුප් පියවරෙහි තබනු ඇත.

3. **වයස් සීමාව.**—අයදුම්කරුවන් ලාංකිකයන් විය යුතු අතර, 1969 මාර්තු මස 5 වැනි දිනට වයස අවුරුදු 20 ටත් 30 ටත් අතර විය යුතුය. (දැනට දෙපාර්තමේන්තුවේ සේවය කරන I වැනි ශ්‍රේණියේ ඉඩම් කච්චේරි ඕවර්සියර්වරුන් කෙරෙහි උපරිම වයස් සීමාව බලපවත්වනු නොලැබේ.)

4. **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.—**

අයදුම්කරුවන් විසින්—

(i) (අ) පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ උපාධි විභාග යෙන්, හෝ

(ආ) කෘෂිකර්මය පිළිබඳ ප්‍රායෝගික පළපුරුද්ද ඇති පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධි විභාගයෙන්, හෝ

(ඇ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන්, හෝ

(ඈ) දෙකකට නොවැඩි වාර ගනනකදී, සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) පෙළ විභාග යෙන්, හෝ

(ඉ) ඊට සම හෝ උසස් විභාගයකින් සමත්වී සිටිය යුතුය. (විද්‍යා විෂයයන්ගෙන් සමත්වී ඇති අයදුම්කරුවන්ට විශෙෂ සැලකිල්ලක් දක්වනු ඇත.), සහ

(ii) කෘෂිකර්ම පාසැලෙහි ජ්‍යෙෂ්ඨ සහතිකය, (ප්‍රායෝගික කෘෂිකර්ම පාඨශාලා සහතිකය නොවේ), හෝ

(iii) 1943 අංක 2 දරන ආහාර නිෂ්පාදන (වතු) ආඥපනත යටතේ ආහාර නිෂ්පාදන (වතු) පරීක්ෂකයෙකු වශයෙන් පළ පුරුද්ද, හෝ

(iv) ආහාර නිෂ්පාදන නිලධාරියෙකු වශයෙන් පළපුරුද්ද, හෝ

(v) අළුත් රබර් වැවීමේ ව්‍යාපාරයේ දිස්ත්‍රික් නිලධාරියෙකු හෝ තලාවක් භාර නිලධාරියෙකු ලෙස හෝ පළපුරුද්ද, හෝ

(vi) ගල් ඔය සංවර්ධන මණ්ඩලයේ කාර්මික පුහුණු කිරීමේ ආය තනයේ දෙවසක කෘෂිකර්ම පාඨමාලාව සමාර්ථ ලෙස හැදෑරීම.

I **සටහන.**—අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනලද කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය ඇත්තාවූද, ගොවිකම් පාසැල් පුහුණුවක් ඇති බැව් ඔප්පු කිරීමට සහතික පතක් ඇත්තාවූද, I වැනි ශ්‍රේනියේ අවුරුදු 4 ක සේවයක් සම් පූර්ණ කර ඇත්තාවූද, වසකට රු. 1,254 ක වැටුපක් ලබන්නාවූද, වැඩ හා හැසිරීම සතුටුදායක වූද I වැනි ශ්‍රේණියේ ඉඩම් කච්චේරි ඕවර්සියර්වරුන්.

II **සටහන.**— 4. (1) (අ) හා (ආ) ඡේදයේ දක්වා ඇති සුදුසුකම් ඇති අයදුම්කරුවන්ට (ii) සිට (vi) දක්වා ඇති සුදුසුකම් බලපාන්නේ නැත.

5. **සේවය පිළිබඳ කොන්දේසි.—**

(1) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම දෙනු ලබන්නේ අවුරුදු 3 ක ආධුනික කාලයකට යටත්වය. (තෝරාගනු ලබන දෙපාර්තමේන්තු අයදුම්කරුවන් ප්‍රථමයෙන් නියමිත කාලසීමාවක් සඳහා වැඩ බැලීමට පත් කරනු ලැබේ.)

(2) තෝරාගනු ලබන අයදුම්කරුවන් තනතුරුවලට පත් කිරීමට ප්‍රථම වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය. දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට බැඳිය යුතුය.

(3) තෝරාගනු ලැබූ අයදුම්කරුවන් විසින් මෝටර් බයිසිකලයක් වැනි අනුමත කරනලද වාහනයක් සපයා ගත යුතුය. රජයේ මුදල් රෙගුලාසි අනුව ඔවුන්ට ගමන් ගාස්තු ගෙවනු ලැබේ.

(4) තෝරාගනු ලැබූ අයදුම්කරුවන් රු. 1,500 ක ඇපයක් තැබීමට සූදානම් විය යුතුය.

(5) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම පිණිස දැනට පනවා ඇති නීති හා මින් මතු පනවන නීතිවලටද විශෙෂයෙන් 1956 අංක 33 දරන රජයේ භාෂා පණතේ සඳහන් විධි විධාන ක්‍රියාත්මක කිරීමේ නීති වලටද තෝරාගනු ලැබූ අපේක්ෂකයින් බැඳී සිටිය යුතුය.

6. තම චරිතය පිළිබඳව මෑතකදී ලබාගත් සහතික පත්‍ර දෙකක පිටපත් අයදුම්පත්‍ර සමග ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

8. මෙම ගැසට් පත්‍රයෙහි I වැනි කොටසෙහි (II) වැනි ඡේදයේ මුල පළවූ රාජ්‍ය සේවාවේ තනතුරු වලට කරන පත්කිරීම් වලට අදාලවූ පොදු කොන්දේසිද බලන ලෙස ඉල්ලමි.

කේ. එන්. වීරක්කොඩි,
ඉඩම් කොමසාරිස්.

1969 පෙබරවාරි 5 දින,
කොළඹ 1,
ඉඩම් කොමසාරිස් කාර්යාලයේදී ය.

## ආකෘති පත්‍රය

**ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ජනපද නිලධාරි තනතුර**

1. සම්පූර්ණ නම :————.
2. මූලකුරු සහිත නම :————.
3. ලිපිනය :————.
4. (අ) ජාතිය :————.
   (ආ) ඔබ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් ද යන බව :————.
5. උපන් දිනය සහ උපන් ස්ථානය :—
   (අ) අයදුම්කරුගේ (උප්පැන්න සහතික පත්‍රයේ පිටපතක් (මුල් පිටපත නොවේ) ඇමිණිය යුතුය) :————.
   (ආ) අයදුම්කරුගේ පියාගේ :————.
   (ඉ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.
   (ඊ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මී මුත්තාගේ :————.

   (අයදුම්කරු ලංකාවේ ඉපදුනි නම්, ඉහත සඳහන් (අ) සමග (ආ) හෝ (ඉ) සහ (ඊ) යන දෙකම පිරවිය යුතුය. අයදුම්කරු ලංකාවේ නොඉපදුනි නම්, (අ) සමග (ආ) සහ (ඉ) සහ (ඊ) යන දෙකම පිරවිය යුතුය.)

6. අධ්‍යාපනික සුදුසුකම්, සමර්ථ වූ දින සහිතව (සහතිකයේ පිට පතක් (මුල් පිටපත නොවේ) ඇමිණිය යුතුය) :————.
7. කෘෂිකර්ම කටයුතු පිළිබඳ ප්‍රායෝගික පළපුරුද්ද (සහතික පත් වල පිටපත් (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුය :————.
8. වෙනත් සුදුසුකම් :————.
9. පාඨශාලාවෙන් අස්වූ දින සිට කරන ලද රක්ෂාවල් පිළිබඳ සම්පූර්ණ විස්තර සහ දැනට රක්ෂාවක් කරන්නේ නම්, එයින් ලැබෙන වැටුප සහ වැටුප් ක්‍රමය :————.
10. යුධ සේවයෙහි යෙදී සිටියේ නම් ඒ පිළිබඳ විස්තර :————.
11. අමුණා ඇති සහතික පිටපත්වල ගණන :————.
12. අයදුම්කරුගේ චරිතය පිළිබඳ සහතික පත් නිකුත් කර තිබෙන දෙදෙනාගේ නම්, ලිපිනයන් සහ තනතුරු :—

    1. නම :————.
       ලිපිනය :————.
       තනතුර :————.

    2. නම :————.
       ලිපිනය :————.
       තනතුර :————.

13. මා විසින් මේ අයදුම්පතෙහි සඳහන්කොට ඇති විස්තර නිවැරදි හා සත්‍ය බවත්, මා අධිකරණ උසාවියක වැරදිකරු වී නැති බවත්, මීට පෙර රජයේ සේවයෙන් පහ කරනු ලැබ නැති බවත් සහතික කරමි. මෙහි සඳහන් කරනලද විස්තර අසත්‍ය හෝ වැරදි හෝ බැව් සොයාගනු ලැබුවහොත්, පත් කිරීමට මා නුසුදුස්සකු කිරීමට තරම් වන බවත්, පත්කර ගැනීමෙන් පසුව සොයා ගනු ලැබුවහොත් වන්දියක් නැතිව සේවයෙන් පහකර දැමීමට මා යටත් බවත්, මම හොඳාකාර දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

2–300—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

**ඡායාරූප ශිල්පී සහ විද්‍යාගාර සහකාර තනතුර**

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පර්යේෂණ සහ අධ්‍යාපන අංශයේ ඡායාරූප ශිල්පී සහ විද්‍යාගාර සහකාර තනතුරක් සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘති පත්‍රයේ ප්‍රකාර පිළියෙල කළයුතු ඉල්ලුම්පත් කොළඹ 2, තැ. පෙ. 509, වැඩ බලන වන සංරක්ෂක වෙත 1969 මාර්තු මස 1 දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රුපියල් 1,620—120—රු. 3,780 කි. (රුපියල් 2,820 ට පෙර කාර්යක්ෂමතා කඩඉම සමග.)

3. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

4. **අවශ්‍ය සුදුසුකම් :**

(i) යටත් පිරිසෙයින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඊට සමාන උසස් විභාගයක් හෝ අංක ගණිතය සහ රසායන විද්‍යාව සමග සමර්ථ වී ඇති බව, හෝ
  දෙකකට නොවැඩි වාර ගණනකදී අංක ගණිතය සහ රසායන විද්‍යාව ඇතුලුව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයෙන් විෂයයන් හයකින් සමර්ථ වී ඇති බව.

(ii) ඡායාරූප ශිල්පීය වැඩ කිරීමට හැකියාවක් තිබිය යුතු අතර, ඡායාරූප ශිල්පය පිළිබඳ දැනුමක් සහ ප්‍රායෝගික පළපුරුද්ද අත්‍යාවශ්‍යය.

(iii) අඳුරු කාමරය තුළ ප්‍රොසෙස් කිරීම සහ රසායන ද්‍රව්‍ය පිළිබඳ 5 අවුරුදු කාලයකට නොඅඩු පළපුරුද්දක් ද, fපිල්ම් ස්ට්‍රිප් ලැන්ටර්ස් ස්ලයිඩ් නිෂ්පාදනයෙහි මනා දැනුමක් තිබිය යුතුය.

(iv) සූක්ෂ්ම ඡායාරූපී ශිල්පය පිළිබඳ දැනුමක් හා චලන චිත්‍ර කැමරා මෙහෙයවීමට හැකියාවක් තිබිය යුතුය.

5. අයදුම්කරුවන් විසින් පහත දක්වන ලිපි ලේඛණවල පිටපත් (මුල් ලිපි නොවේ) සිය ඉල්ලුම්පත්වලට ඇමිණිය යුතුය :—

(අ) උප්පැන්න සහතික පත්‍ර (භෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලාවල රෙගුලාසි මාලාව වෙනුවෙන් නිකුත් කළ සහතික පත් භාරගනු නොලැබේ.)

(ආ) අධ්‍යාපන සහතික පත්‍රය.

(ඇ) අයදුම්කරුගේ චරිතය හා තනතුරට පත්වීමට ඇති යෝග්‍යතාවය පිළිබඳව ළඟදී ලබාගත් සහතික පත් තුනක් (දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගෙන් එවැනි සහතික පත් අනවශ්‍යය.)

6. මේ ගැසට් පත්‍රයේ පළමුවන භාගයේ දෙවන ඡේදයේ ආරම්භයේ දක්වා ඇති රජයේ සේවයේ පත්වීම්වලට බලපාන සාමාන්‍ය කොන්දේසි බලන්න.

7. නියමිත දිනයෙන් පසුව මේ කාර්යාලයට ලැබෙන ඉල්ලුම්පත් ගැන සළකා බලනු නොලැබේ.

8. ඉල්ලුම්පත් හෝ තනතුර පිළිබඳ අනිකුත් ලිපි ඇත්නම්, ඒවා වැඩ බලන වන සංරක්ෂකට මිස මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුට පෞද්ගලිකව එවිය යුතු නොවේ.

ඩබ්ලිව්. ආර්. එච්. පෙරේරා,
වැඩ බලන වන සංරක්ෂක.

1969 ජනවාරි 30 දින,
කොළඹ 2, තැ. පෙ. 509,
වන සංරක්ෂණ කාර්යාලයේ දීය.

## ආකෘති පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. ලිපිනය :————.
3. ලාංකිකයෙකු වනුයේ පරම්පරාවෙන්ද, ලියා පදිංචි කිරීමෙන්ද යනවග :————.
4. (අ) උපන් දිනය :————.
   (ආ) 1969 මාර්තු 1 වන දිනට වයස: අවුරුදු :————, මාස :————.
5. දැනට තනතුරක් දරන්නේ නම්, ඒ කුමක්ද ? :————.
6. උසස්ම අධ්‍යාපනික සුදුසුකම් :————.
7. කලින් රැකියාවන්හි යෙදී සිටියේ නම් විස්තර :————.
8. විශේෂ සුදුසුකම් ඇත්නම්, ඒවා දක්වන්න :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

2–397—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

## ගාළු දිස්ත්‍රික්කයේ නැගෙනහිර බෙන්තර වලල්ලාවිට කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිටිගල වැසිහේන ගම්කායෝ සහා ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂකවරයෙකු පත්කිරීම

ගාළු දිස්ත්‍රික්කයේ නැගෙනහිර බෙන්තර වලල්ලාවිට කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිටිගල වැසිහේන ගම්කායෝ සහා ප්‍රදේශය තුළ හදිසි මරණ පරීක්ෂක තනතුර සඳහා අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආදර්ශ ආකෘතියේ ප්‍රකාර ඉල්ලුම්පතක් සකස්කොට වර්ෂ 1969 ක්වූ මාර්තු මස 30 වෙනි දින පස්වරු 3 ට හෝ ඊට ප්‍රථම නැගෙනහිර බෙන්තර වලල්ලාවිට කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරිට ලැබෙන්ට ඔහුගේ පහත සඳහන් ලිපිනයට යැවිය යුතුය :—

" ප්‍රා. ආ. නි., බෙන්තර වලල්ලාවිට කෝරලේ නැගෙනහිර, ඇල්පිටිය "

2. මෙම තනතුර නිර්වේතනවේ. එහෙත් මරණ පරීක්ෂණය සඳහා එකකට රු. 7.50 ක් බැගින් දීමනාවක් ගෙවනු ලැබේ.

3. අවශ්‍ය සුදුසුකම් :—

(අ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්තවීම.

(ආ) ගාළු දිස්ත්‍රික්කයේ නැ. බෙ. ව. කෝ. ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ පිටිගල වැසිහේන ගම්කායෝ සහා කොට්ඨාශ සීමාව තුළ ස්ථිර පදිංචියක් තිබීම.

(ඇ) (i) 1925 සහ 1944 අතර තුර කාලයෙහි පාඨශාලා හැරයාමේ සහතික පත්‍ර විභාගයෙන් හෝ සිංහල භාෂාව සහිතව අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ

(ii) සිංහල භාෂාව සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා විභාගයෙන් හෝ ඊට උසස් විභාගයකින් හෝ සමර්ථවී ඇති බවට සැහෙන සහතික ඉදිරිපත් කළ යුතුයි.

(ඈ) රජයේ හෝ පළාත්පාලන ආයතනවල සේවකයින් නො විය යුතුයි.

(ඉ) පළාත්පාලන ආයතනවල නියෝජිතයින් නොවිය යුතුයි.

(ඊ) ඉල්ලුම්පත්‍ර භාරගන්නා දිනට වයස අවුරුදු 30 ට නොඅඩු හා 60 ට නොවැඩි විය යුතුයි. (69.3.30)

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ ඉල්ලුම්පත්‍ර සමග පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම සුදුසුකම් පිළිබඳ සහතික.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. ඉල්ලුම්පත්‍ර ලැබුන බව දන්වනු නොලැබේ.

පී. ඒ. ටී. ගුණසිංහ,
ගාළු දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1969.2.1.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

### ගාළු දිස්ත්‍රික්කයේ නැගෙනහිර බෙන්තර වලල්ලාවිට කෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිටිගල වැසිහේන ගම්කායෝ සහා ප්‍රදේශයට හදිසි මරණ පරීක්ෂක ධුරය

(1) අයදුම්කරුගේ නම සහ ලිපිනය (පැහැදිලි අකුරින්) :—

අගට යෙදෙන නම :————.

අනෙක් නම් :————.

(2) ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.

(3) වර්ෂ 1969 මාර්තු මස 30 දිනට වයස :—

අවුරුදු :——, මාස :——, දින :——.

(4) විවාහක හෝ අවිවාහක භාවය :————.

(5) අධ්‍යාපනික සුදුසුකම් :————.

(6) දැනට කරන රක්ෂාව :————.

(7) ණය කරදර තිබේද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

(8) තමා සතු දේපලවල වටිනාකම හා ප්‍රමාණය :————.

(9) ඉල්ලුම්කරු කිසිම චෝදනාවකට අධිකරණය මගින් දඬුවම් ලබා තිබේද ? :————.

(10) මේ තනතුර සඳහා වෙනත් හිමිකම් පිළිබඳ විස්තර :————.

(11) මීට පෙර රැකියාවක් කළේද, එසේනම් ඒ පිළිබඳ විස්තර ————.

(12) පළාත් පාලන ස්ථානයක නියෝජිතයෙකුද ? :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

2–335— 69.2.14 දන අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග හා කර්මාන්ත අංශයට විශේෂ ආධුනිකයින් බඳවා ගැනීම

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග හා කර්මාන්ත අංශයේ ගොඩනැගිලි, දුම්රිය මාර්ග, පාලම්, සංඥා හා ගල් කැඩීම පිළිබඳ ශාඛාවල දෙවැනි ශ්‍රේණියේ ෆෝර්මන් තනතුරේ ඇබෑර්තු පිරවීමට පුහුණුවක් ලබාදෙනු පිණිස විශේෂ ආධුනික තනතුරු සඳහා පිරිමි අපේක්ෂකයින්ගෙන් ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ.

2. අවශ්‍ය සුදුසුකම් :

(අ) අපේක්ෂකයෝ ලාංකිකයන් විය යුත්තාහ.

(ආ) ඉල්ලුම්පත්‍ර භාරගනු ලබන අවසාන දිනට ඔව්හු වයසින් අවුරුදු 16 ට නොඅඩුවූත්, අවුරුදු 21 ට නොවැඩිවූත් මනා ශරීර සෞඛ්‍යයෙන් යුතුවූත් අය විය යුත්තාහ.

(ඇ) ඔව්හු විෂයයක් වශයෙන් ගණිතය සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ උසස් විභාගයකින් ගණිතය සහිතව සමත්වී හෝ

සිංහල/දෙමළ භාෂාව හා ගණිතය ඇතුළු තවත් විෂයයන් හතරකින් (එනම් විෂයයන් හයකින්) දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සමත්වී සිටිය යුත්තාහ.

(ඈ) ඔව්හු අවිවාහකයන් විය යුත්තාහ.

**සංලක්ෂ්‍යය.**—ඉහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සහිත දුම්රිය සේවකයින්ට ඉල්ලුම්පත්‍ර භාරගනු ලබන අවසාන දිනට වයස අවුරුදු 21 ට වැඩි වුවත් වයසින් අවුරුදු 30 ට නොවැඩි නම් මේ සඳහා ඉල්ලුම් කළ හැක.

3. (i) මෙම ගැසට් පත්‍රයෙහි මුල දැක්වෙන සාමාන්‍ය කොන්දේසි අනුව වයස පිළිබඳ අනුග්‍රහයට හිමිකම් කියන සේවා මුක්ත භටයින් සතුටුදායක සේවා කාලයක් ඇති බව තහවුරු කෙරෙන සේවයෙන් අස්වීමේ මුල් සහතික ඉදිරිපත් කළ යුතුය. තවද, මෙම සහතිකයෙහි සේවා කාලසීමාව පැහැදිලි වශයෙන් සඳහන්වී තිබිය යුතුය.

(ii) අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඇති පසුගිය යුද සමයෙහි සිර කරුවන්ව සිටි අයට අවශ්‍ය නම් තමන් සිර අඩස්සියේ සිටි වග පිළිගැන්වෙන සාක්ෂි ඉදිරිපත් කළහැකි වුවහොත්, නියමිත වයස් සීමාව ගණන් ගැනීමේදී සිර භාරයෙහි ගතකළ කාලය වයසින් අඩුකරන්නට ඉඩදෙනු ලැබේ.

(iii) අද්මිරාල් තීයුත්, ගුවන් අමාත්‍යාංශයන් යටතේ ලංකාවේ පිහිටි එක්සත් රාජ්‍ය සතු විවිධ ආයතන වලින් ඉවත් කරන ලද සේවා වසමට අයත් නොවූ අයට—

(අ) අවශ්‍ය අන් සියළු සුදුසුකම් ද,

(ආ) එම සේවය අඛණ්ඩව ද, සතුටුදායකවද තිබුණි නම් නියමිත වයස් සීමාව ගණන් ගැනීමේදී එක්සත් රාජධානියේ සේවාවන් යටතේ යෙදුනු කාලය වයසින් අඩුකරන්නට ඉඩදෙනු ලැබේ.

**සංලක්ෂ්‍යය.**—මෙම ඡේදයේ දැක්වෙන ගණවලට අයත් අයදුම්කරුවන්ට හා දුම්රිය සේවකයින්ට විවාහවී සිටීම නුසුදුසු කමක් නොවනු ඇත.

4. ඉල්ලුම්කරුවන් විසින් ස්වකීය ඉල්ලුම් පත්‍ර වලට (**මුල් සහතික නොව**) පහත සඳහන් සහතිකවල පිටපත් ඇමිණිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (පාඨශාලාවලට ඇතුළත්වීම සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතික, දිව්රුම් සහතික හෝ බෞතීස්ම සහතික උප්පැන්න සහතිකය වෙනුවට පිළිගනු නොලැබේ.)

(ආ) අධ්‍යාපන සහතික.

5. වගකිවයුතු අයෙකුගෙන් ලබාගත් යහපත් චරිතය පිළිබඳ සහතිකයක් ඉල්ලුම්පතට ඇමිණිය යුතුය. ඉල්ලුම්කරු රජයේ හෝ උපකෘත පාසලක අධ්‍යාපනය ලැබුවකු නම් චරිත සහතිකය ඔහු අවසාන වරට අධ්‍යාපනය ලත් රජයේ හෝ උපකෘත පාසලේ ප්‍රධානාචාර්යවරයාගෙන් විය යුතුය. නැතහොත්, එම සහතිකය සමාදාන විනිශ්චකාරවරයෙකු, අද්වකාත් කෙනකු, පෙරකදෝරු හෝ නොතාරිස් කෙනකු, ප්‍රාදේශීය ආදායම් පාලක නිළධාරියකු හෝ රු. 2,400 හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන ආණ්ඩුවේ ස්ථිර

නිලධාරියකු හෝ සාමාන්‍යයෙන් කියතහොත් ලෙහෙසියෙන් තොර තුරු ලබාගත හැකි ප්‍රකට පුද්ගලයෙකුගෙන් විය යුතුය. සහතික නිකුත් කරන අයගේ නම, තනතුර හා ලිපිනය සහතිකයේ පැහැදිලිව සඳහන් වී තිබිය යුතුය. (දැනටමත් රජයේ සේවයේ නියුක්තව සිටින අයට මෙම උප ඡේදය යටතේ සහතිකයක් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.)

6. ඉල්ලුම්පත්‍ර පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රය අනුව ඉල්ලුම් කරුගේම අත් අකුරින් පිරවිය යුතු අතර සියළුම සහතිකවල පිටපත් ද සමග එවිය යුතුය. මුල් සහතික සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය. මුද්‍රිත ඉල්ලුම්පත්‍ර නොමැත.

7. ඉල්ලුම්පත්‍ර ලියා පදිංචි කරන ලද තැපැලෙන් 1969 පෙබරවාරි මස 27 වෙනි දින පස්වරු 4.30 ට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන පරිදි එවිය යුතුය :—

දුම්රිය සාමාන්‍යාධිකාරී,
දුම්රිය සාමාන්‍යාධිකාරීගේ කාර්යාලය,
ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව,
තැ. පෙ. අංකය : 355,
කොළඹ 10.

ඉල්ලුම් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුට පුද්ගලිකව නොඑවිය යුතුය.

ඉල්ලුම් පත්‍රයක් තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාදවූ බවට කෙරෙන පැමිණිලි පිළිබඳව සළකා බලනු නොලැබේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි ඉල්ලුම් කරුවන් විසින්ම විඳ දරාගත යුතුය.

8. නියමිත දිනයට පසුව මෙම කාර්යාලයට රජයේ සේවකයින් ගෙන් ලැබෙන ඉල්ලුම්පත්‍ර පිළිගනු ලබන්නේ එම ඉල්ලුම්පත්‍ර අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නියමිත දිනට කලින් ලැබුණු බවත් ප්‍රමාදයට පිළිගත හැකි හේතූන් ද ඉදිරිපත් කර ඉල්ලුම්පත්‍ර භාර ගන්නා ලෙසට දෙපාර්තමේන්තු ප්‍රධානියා නිර්දේශ කළහොත් පමණී.

9. තෝරාගනු ලබන අපේක්ෂකයින් ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බව නිගමණය කිරීම පිණිස පැවැත්වෙන අක්ෂි දෘෂ්ඨ පරීක්ෂණය ද ඇතුළු වෛද්‍ය පරීක්ෂණයකින් තොරාගත් විගස සමත්විය යුතුය.

10. **සේවා කොන්දේසි :**

(i) තෝරාගනු ලැබූ ඉල්ලුම්කරුවන් සිව්වසක පුහුණුවක් ලැබිය යුතුය. ඔවුන්ට නියම කරනු ලබන අංශයට අදාළ ප්‍රායෝගික පුහුණු වීමේ පාඨමාලාව පහත සඳහන් පරිදි වේ :—

**ගොඩනැගිලි අංශය :**

මාස 6 ක් : රත්මලානේ වැඩපල.

අවුරුදු 1 ක් : සැලසුම් කාර්යාලය හා භූමි මානක ශාස්ත්‍රය (මූලික).

අවුරුදු 2½ ක් : කායශීලය හා වේලාව සටහන් කිරීම, හා ප්‍රායෝගික පළපුරුද්ද.

ප්‍රථම වර්ෂයේදී මෙය ලැබිය යුත්තේ කොළඹ දිස්ත්‍රික්කයක දීය.

**දුම්රිය මාර්ග අංශය :**

මාස 6 ක් : රත්මලානේ වැඩපල හා දෙමටගොඩ දුම්රිය මාර්ග වැඩපල.

මාස 6 ක් : සැලසුම් කායශීලය හා භූමි මානක ශාස්ත්‍රය (මූලික).

අවුරුදු 1 ක් : කායශීලය හා වේලාව සටහන් කිරීම හා ප්‍රායෝගික පළපුරුද්ද—කොළඹ දිස්ත්‍රික්කයකදී ලැබීම වඩාත් යෝග්‍ය වේ.

අවුරුදු 2 ක් : ප්‍රායෝගික පළපුරුද්ද.

**පාලම් අංශය :**

මාස 6 ක් : රත්මලානේ වැඩපල.

අවුරුදු 1 ක් : පාලම් වැඩපල හා අංගනය හා භූමි මානක ශාස්ත්‍රය (මූලික).

අවුරුදු 2½ ක් : කායශීලය හා සැළසුම් කායශීලය, වේලාව සටහන් කිරීම හා ප්‍රායෝගික පළපුරුද්ද. ප්‍රථම වර්ෂය දෙමටගොඩ සැළසුම් කාර්යාලය හා අංගනයේ විය යුතුය.

**සංඥා අංශය :**

මාස 6 ක් : රත්මලානේ වැඩපල.

අවුරුදු 1 ක් : දෙමටගොඩ සංඥා ඉංජිනේරුගේ වැඩපල.

අවුරුදු 2½ ක් : කාර්යාලය හා සැළසුම් කාර්යාලය, වේලාව සටහන් කිරීම හා ප්‍රයෝගික පළපුරුද්ද. ප්‍රථම වර්ෂය සැලසුම් කාර්යාලයේ, සංඥා කාර්යාලයේ හා කොළඹ ප්‍රදේශයේ විය යුතුය.

**ගල් කඩන අංශය :**

මාස 9 ක් : රත්මලානේ වැඩපල.

මාස 3 ක් : සැළසුම් කාර්යාලය හා භූමි මානක ශාස්ත්‍රය (මූලික).

අවුරුදු 3 ක් : ගල් කැඩීම පිළිබඳ ප්‍රදේශීය කාර්යාල කටයුතු, වේලාව සටහන් කිරීම හා ගල් කැඩීමේ කටයුතු පිළිබඳ ප්‍රාදේශික පළපුරුද්ද.

(ii) පුහුණුවීමේ කාලය තුළදී "ඒ" උපලේඛනයෙහි නියමිත විෂයයන් හැදෑරීමද ලංකා කාර්මික විද්‍යාලයෙහි නියමිත පන්තිවලට සහභාගිවීම ද අවශ්‍ය සහතික ලබාගැනීමද ආධුනිකයින්ගෙන් අපේක්ෂා කරනු ලැබේ.

(iii) ආධුනික කාලසීමාවේ තුන්වැනි වර්ෂය අවසන් වන්නට ප්‍රථම ආධුනිකයින් විසින් දෙපාර්තමේන්තු ව්‍යවස්ථා, වේලාව සටහන් කිරීම හා අවශ්‍යවන නිර්දේශ පත්‍රිකාවෙහි වෙනත් විෂයයන් පිළිබඳ පරීක්ෂණයකින් සමත්විය යුතුය. ඉන් සාමාර්ථය ලබන තෙක් ඊළඟ අවස්ථාවේ පුහුණුවට ඉඩදෙනු නොලැබේ. හතර වැනි වර්ෂය අවසානයේදී සාමාර්ථයය ලැබීමට අපොහොසත් වුවහොත් ආධුනිකයින්ගේ සේවාව නතර කරනු ලැබේ. පස්වැනි වර්ෂය අවසාන වීමට ප්‍රථම කාර්මික විෂයයන් පිළිබඳ තවත් පරීක්ෂණය කින් ඔවුන් සමත්විය යුතුය. මෙයින් සමර්ථවීමට අපොහොසත්වීම සේවය නතර කිරීමට හේතුවනු ඇත.

(iv) ආධුනික කාලය තුළදී ඔව්හු සිංහල භාෂා විෂයයෙහි ප්‍රවීණතා වයක් ලබාගත යුතුය. දෙවැනි ශ්‍රේණියේ ෆෝර්මන් තනතුරට පත් කිරීම අවශ්‍ය අනෙකුත් සුදුසුකම් සපුරාලීම අතර සිංහල භාෂා විෂයය පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත්වීම මත රඳා පවතී.

ආධුනිකයින් රාජ්‍ය භාෂා පණතේ විධිවිධාන වලටත්, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියළුම නීති රීති හා ව්‍යවස්ථාවලටත් මතුවට පණවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

(v) පරීක්ෂණයේ කොටස් දෙකම සම්පූර්ණ කිරීමෙන් පසු හා වර්ෂ හතරේ ආධුනික කාලසීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් පසු ආධුනිකයින් සුදුසු නම් පුහුණුව අවසාන වන විට අදාළ වැටුප් පරිමාණයේ සේවයේ රඳවාගනු ලැබේ. ඔව්හු යෝග්‍ය නම්, දෙවැනි ශ්‍රේණියේ ස්ථිර ෆෝර්මන් තනතුරේ වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප මත දෙවැනි ශ්‍රේණියේ ෆෝර්මන් තනතුරට ඇබෑර්තු ඇති වන පරිදි උසස් කිරීමට සුදුසු වේ.

පුහුණුව සම්පූර්ණ කිරීමෙන් පසු ස්ථිර රක්ෂාවක් ලබාදීමට බැඳීමක් නොමැත.

(vi) බලපවත්නා නියමිත කාලවේලා අනුව ආධුනිකයින් වැඩකළ යුතුය. "ජී" 261 දරණ ආකෘති පත්‍රයෙහි ස්වකීය වත්කම් පිළිබඳ ප්‍රකාශණයක් ද ඔවුන් විසින් සැපයිය යුතුය.

(vii) ආධුනිකයින් දැනට බලපත්නා දෙපාර්තමේන්තු නීතිරීති පිළිපැදිය යුතුය. විනය කඩකිරීමට, විෂමාචාරයට හා වෙනත් වැරදි වලට දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් හෝ ඔහු විසින් පත්කරනු ලබන වෙනත් නිලධාරියකු විසින් හෝ තීරණය කරනු ලබන පරිදි දඬුවම් ලැබේ.

(viii) අධුනිකයින් රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථාවන්ට ද, මුදල් රෙගුලාසිවලට ද, කාර්ය සංවිධාන සංග්‍රහයේ රෙගුලාසි වලට ද, දුම්රිය දෙපාර්තමේන්තු නියෝගයන්ට හා රජය හා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් විටින් විට නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගයන්ට අවනත විය යුතුය.

### "ඒ" උපලේඛනය

දෙවැනි ශ්‍රේණියේ ෆෝර්මන් තනතුරට උසස් කිරීමට ප්‍රථම අධ්‍යයනය කළ යුතු විෂයයන් —

**ගොඩනැගිලි අංශය :** දුම්රිය දෙපාර්තමේන්තු හා උප දෙපාර්තමේන්තු නීතිරීති හා වේලාව සටහන් කිරීම ; ගොඩනැගිලි ඉදිකිරීම (මූලික) ඇස්තමේන්තු හා පරිමාවන් ගණන් බැලීම.

**දුම්රිය මාර්ග අංශය :** මූලික සැළසුම් හා කටුසටහන්, දුම්රිය දෙපාර්තමේන්තුවේ හා උප දෙපාර්තමේන්තුවල නීතිරීති හා වේලාව සටහන් කිරීම. "කෝල්" හෝ වෙනත් අනුමත කළ දුම්රිය මාර්ග පිළිබඳ අත්පොතකින් හෝ විස්තර කෙරෙන උදාහරණ හා ඒ පිළිබඳ ලිහිල් ගණිතයටත් අදාළ ප්‍රශ්න.

**පාලම් අංශ :** දුම්රිය දෙපාර්තමේන්තු හා උප දෙපාර්තමේන්තු නීතිරීති හා වේලාව සටහන් කිරීම, යාන්ත්‍ර විද්‍යාව : ව්‍යවහාරික හා මූලික.

**සංඥා අංශය :** දුම්රිය දෙපාර්තමේන්තු හා උප දෙපාර්තමේන්තු නීතිරීති හා වේලාව සටහන් කිරීම. යාන්ත්‍ර විද්‍යාව : ව්‍යවහාරික හා මූලික.

**ගල් කඩන අංශය :** දුම්රිය දෙපාර්තමේන්තු හා උප දෙපාර්තමේන්තු නීතිරීති හා වේලාව සටහන් කිරීම. යාන්ත්‍ර විද්‍යාව : ව්‍යවහාරික හා මූලික. ගල් කැඩීමට අදාළ ආරක්ෂක නීතිරීති.

11. සම්පූර්ණ ආධුනික කාලසීමාව (වර්ෂ 4 යි) සහ දෙවැනි ශ්‍රේණියේ පෝර්මන් තනතුරට පත් වීම් ලැබූ දින සිට තව පස් වසක් ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය කරන බවට ආධුනිකයින් (සහ ඔවුන්ගේ දෙමව්පියන්/භාරකරුවන්) ගිවිසුමකට අත්සන් තැබිය යුතුය.

12. ආධුනිකයෙකුගේ හැසිරීම සතුටුදායක නොවනවා නම් හෝ පුහුණුවෙන් සතුටුදායක ප්‍රගතියක් නොලබනවානම් හෝ ආධුනිකයාට තව දුරටත් පුහුණුව ලබාදීමෙන් සේවයට කිසියම් ප්‍රයෝජනයක් නොවන බව දුම්රිය සාමාන්‍යාධිකාරීට වැටහුනොත් කලින් දැන්වීමක් නොකර ගිවිසුම අවසන් කිරීමට දුම්රිය සාමාන්‍යාධිකාරීට බලය තිබේ.

13. විවිධ අවස්ථාවන්හිදී ලබන වැටුප් පරිමාණයන්—

**ආධුනික කාලය**

1 වැනි අවුරුද්ද දිනකට රු. 2.20

2 වැනි අවුරුද්ද දිනකට රු. 2.60

3 වැනි අවුරුද්ද දිනකට රු. 3.00

*4 වැනි අවුරුද්ද දිනකට රු. 3.40

†5 වැනි අවුරුද්ද දිනකට රු. 3.80

* පළමුවැනි දෙපාර්තමේන්තු පරීක්ෂණයෙන් සමත් වීමෙන් පසු.

† දෙවැනි දෙපාර්තමේන්තු පරීක්ෂණයෙන් සමත් වීමෙන් පසු.

**II වෙනි ශ්‍රේණියේ පෝර්මන්**

රු. 1,860—120—රු. 3,780 වාර්ෂික

**I වැනි ශ්‍රේණියේ පෝර්මන්**

රු. 3,900—180—රු. 5,340 වාර්ෂික

14. පුහුණුවීමේ එක් අවස්ථාවකින් ඊළඟ අවස්ථාවලට යැමට ප්‍රථම ආධුනිකයෙකු විසින් ස්වකීය ආසන්නතම ජ්‍යෙෂ්ඨ නිලධාරියාගෙන් තමාගේ ප්‍රගතිය පිළිබඳව හොඳ සහතිකයක් ලබා ගත යුතුය. ඔහුගේ පැමිණීම, කලට වේලාවට කටයුතු කිරීම, රාජකාරියට ලැදිකම, සාමාන්‍ය හැකියාව, මනා හැසිරීම, අවලත්වය හා කම්කරු පාලනයෙහි දක්ෂකම පරීක්ෂණයට භාජනය වේ. අසනීපය නිසා හෝ නිවාඩු ලබා හෝ නොලබා හෝ වැඩට නොපැමිණීමෙන් වැඩ නොකළ කාලය, පුහුණු කරවීමේ ක්‍රමයේ ඊළඟ අවස්ථාවලට යැමට පෙර පියවන මෙන් ආධුනිකයෙකුට නියම කළ හැකිය. වැටුප් වැඩිවීම් රඳා පවතුයේ සතුටුදායක ප්‍රගති අනුවය.

15. II වැනි ශ්‍රේණියේ පෝර්මන් තනතුරේ සිට I වෙනි ශ්‍රේණියේ පෝර්මන් තනතුරට උසස් වීම් දීම, ඇබෑර්තු හට ගැනීම හා අදාල සේවකයාගේ යෝග්‍යතාවය අනුව සිදු කෙරේ.

16. කිසිදු හේතුවක් පල නොකර ඕනෑම ඉල්ලුම් පත්‍රයක් ප්‍රතික්ෂේප කිරීමේ බලය දුම්රිය සාමාන්‍යාධිකාරීට තිබේ.

17. මෙම ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (II) වෙනි ඡෙදයෙහි පළවී ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට කෙරෙන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කෙරේ.

බී. ඩී. රම්පාල,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

තැ. පෙ. 355,
කොළඹ, 10.
1969 පෙබරවාරි 5 වෙනි දින.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග හා කර්මාන්ත අංශයේ විශේෂ ආධුනික තනතුර**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. සම්පූර්ණ තැපැල් ලිපිනය (පැහැදිලි අකුරින්) :————.

3. ජාතිය :————.

(අ) පරම්පරාවෙන් ලංකා රටවැසියකුද, නැතහොත්,

(ආ) ලියාපදිංචි කිරීමෙන් ලංකා රටවැසි බව ලද්දෙක්ද? යන බව සඳහන් කරන්න :————.

පරම්පරාවෙන් ලංකා රටවැසි බව ලද්දෙක් නම් පහත සඳහන් තොරතුරු සැපයිය යුතුය :————.

(අ) ඉල්ලුම්කරු උපන් ස්ථානය :————.

(ආ) ඉල්ලුම්කරුගේ පියා උපන් ස්ථානය :————.

(ඇ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා උපන් ස්ථානය :————.

(ඈ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ මීමුත්තා උපන් ස්ථානය :————.

ඉල්ලුම්කරු ලංකාවේ උපන්නෙක් නම් (අ) කොටස ඇතුළුව (ආ) කොටසත් එසේ නැතහොත් (ඇ) සහ (ඈ) යන කොටස් දෙක හෝ සම්පූර්ණ කළ යුතුය. ඉල්ලුම්කරු ලංකාවේ උපන්නෙක් නොවේ නම් (අ) කොටස ද ඇතුළුව (ආ) සහ (ඇ) යන කොටස් දෙ හෝ (ඇ) සහ (ඈ) යන කොටස් දෙක හෝ සම්පූර්ණ කළ යුතුය.

4. (අ) උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.) :————.

(ආ) 1969 පෙබරවාරි 27 වැනි දිනට වයස: අවුරුදු :——, මාස——, දවස් :————.

5. සමත්වූ විභාග (අධ්‍යාපන සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.) :————.

6. විවාහකද, අවිවාහකද යන වග :————.

7. දුම්රිය සේවකයෙක්ද? නැතහොත් දුම්රිය සේවකයෙකුගේ පුත්‍රයෙක්ද? යන වග :————.

8. දුම්රිය සේවකයෙක් නම්, පහත සඳහන් විස්තර සපයන්න : ————.

(අ) ප්‍රථමයෙන් පත්වීම් ලැබූ දිනය :————.

(ආ) දැනට තමා දරණ ශ්‍රේණිය හා දෙපාර්තමේන්තු අංකය :————.

(ඇ) වර්තමාන සේවා ස්ථානය :————.

9. දැනට රක්ෂාවක් තිබේ නම් එය :————.

10. සේවා මුක්ත භටයෙක්ද, යුද සිරකරුවෙක්ද, එක්සත් රාජධානියේ අද්මිරාල්තිය හා ගුවන් අමාත්‍යාංශය සතු ලංකාවේ ආයතනයක හේ වා වසමට අයත් නොවන සේවයෙන් මුදවනු ලැබූවෙක්ද? යන වග :————.

(විස්තර සඳහන් කර එය ඔප්පු කිරීම සඳහා සාධක ඉදිරිපත් කරන්න.)

මා විසින් ඉහත සඳහන් කර ඇති විස්තර මගේ විශ්වාසයේ හැටියටත්, මා දන්නා පමණටත් සත්‍ය බව ප්‍රකාශ කර සිටිමි. මෙම ශ්‍රේණියට බඳවා ගැනීමට අදාල රෙගුලාසි අනුව, මා සුදුස්සෙකු නොවන බව පෙනී ගියහොත් මගේ ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප වන බවද මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

2–301—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

## රත්නපුර දිස්ත්‍රික්කයේ රිදීවිට කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ අටකලං කෝරළේ කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය සහ උඩරට) රෙජිස්ත්‍රාර් ධුරය

රිදීවිට උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිවීම හේතු කොටගෙන ගම් වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිපහට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාම සේවක කාර්යාල, පළාත් පාලන ආයතන, සහ කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳපොලවල්, සහ සමුපකාර සමිති ආදි කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශණය කර ඇති දැන්වීම්වල ඇතුලත්වේ.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස්විය යුතු අතර, ඒවා 1969 මාර්තු 14 වැනි දින හෝ එදිනට ප්‍රථම මාවෙත ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

එක්ස්. එම්. සෙල්ලතාම්බු,
අතිරේක දිසාපති,
දිස්ත්‍රික් ලේකම් වෙනුවට.

1969 පෙබරවාරි මස තුන්වැනි දින,
රත්නපුරේ,
දිස්ත්‍රික් රෙජිස්ත්‍රාර් කාර්යාලයේදී ය.

2–388— 69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

## ලංකා රාජ්‍ය වැවිලි මණ්ඩලය

### කර්මාන්තශාලා නිලධාරී

මෙම මණ්ඩලයේ සේවයේ ඉහත සඳහන් තනතුරට ලාංකිකයින්ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ. තෝරාගනු ලබන අපේක්ෂකයා පොල්ගහවෙල ඊඳල්ල රජයේ වතුයායේ වැඩ භාර ගත යුතුය.

(අ) අධ්‍යාපන සුදුසුකම් :—

(ආ) පඩි ක්‍රමය :—XII වෙනි ශ්‍රේණිය—මසකට මූලික පඩිය රු. 90—5—130 සියලුම ජීවනාධාර දීමනාවන් හවුල් සහා ගිවිසුම අනුව ගෙවනු ලැබේ.

(ඇ) වයස :—1969.2.1 දිනට අවුරුදු 30 අඩු නොවියුතු අතර එම දිනට අවුරුදු 40 වැඩි නොවිය යුතුය.

(ඈ) නිලකාර/කාර්මික සුදුසුකම් හා පලපුරුද්ද :—අඩුවශයෙන් ක්‍රෙප් රබර් නිෂ්පාදනයෙන් අවුරුදු 5ක පලපුරුද්දක් තිබිය යුතුයි.

**සේවා කොන්දේසි :—**

1. ආධුනික කාලය අවුරුදු තුනක් වන අතර, සිංහල ප්‍රවීනතා විභාගයෙන් සමත්වී නම් ආධුනික කාලය අවුරුද්දක් වේ.
2. දැනට සකස් කර ඇති මණ්ඩලයේ විධිවිධාන හා ඉදිරියට ඇතිවන විධිවිධානවලට එකඟ විය යුතුයි.
3. ලංකාවේ කොයි පෙදෙසෙහිත්, මණ්ඩලීය සංවිධානයේ කොයි කොටයාශයෙහිත් සේවය කිරීම.
4. අර්ථසාධක අරමුදලට තමාගේ වැටුපෙන් 10% සම්මාදම් කිරීම හෝ වෙනත් පිළිගත් අර්ථසාධක අරමුදලට සම්මාදම් කළ යුතු අතර තමාගේ දල වැටුපෙන් 15% මණ්ඩලය විසින් සම්මාදම් කරනු ලැබේ.
5. තනතුරුවලට පත්වන්නන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පණතේ විධිවිධානවලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියළුම නීති රීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කල යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

තෝරාගනු ලබන අපේක්ෂකයා ඔහුට ඇති සුදුසුකම් හා පලපුරුද්ද අනුව යථෝක්ත පඩි ක්‍රමයේ සුදුසු පියවරක තැබිය හැකිය.

වයස අධ්‍යාපන හා පලපුරුද්ද, නිලකාර/කාර්මික සුදුසුකම් (ඇතිනම්) මීට ඉහතද කල රක්ෂාව හා ලැබුන වේතනය අයදුම් පතෙහි සඳහන් කල යුතුයි. තමා ගැන දන්නා දෙදෙනෙකුගේ නම් සඳහන් කල යුතුය.

සහතිකපත්වල පිටපත් (මුලික පිටපත් නොවේ) ඉදිරිපත් කල යුතුය.

අයදුම් පත් පහත දක්වෙන උපලේඛනයේ ඇති ආකෘති පත්‍රයේ ආකාරයට විය යුතු අතර, ලියාපදිංචි කරන ලද තැපෑලෙන් 1969.2.27 වෙනි දිනට ප්‍රථම හෝ එදිනට කොළඹ 5, තැ. පෙ. අංක 718, ලංකා රාජ්‍ය වැවිලි මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුයි.

ආකෘති පත්‍ර නිකුත් කරනු නොලැබේ. අයදුම් පත්‍ර ලැබුන බවද දන්වනු නොලැබේ.

සභාපති.

ලංකා රාජ්‍ය වැවිලි මණ්ඩලය,
106, හැව්ලොක් පාර,
කොළඹ 5.

## උපලේඛනය

### ඇබෑර්තුව සඳහා

(1) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.

(2) ලිපිනය :————.

(3) උපන් දිනය :————. 1969.2.7 දිනට නියමිත වයස :————.

(4) ජාතිය :————.

(5) අධ්‍යාපන සුදුසුකම් :————.

(6) කලින් කළ රක්ෂාව :—.

| ස්වාමියාගේ හෝ වතුයායේ නම | තනතුර භාරගත් දිනය | තනතුරෙන් අස්වූ දිනය | තත්ත්වය හා ලැබූ වේතන | ඒ ඒ වතුවල අස්වැන්න හා අක්කර ප්‍රමාණය |
|---|---|---|---|---|
| (අ) | | | | |
| (ආ) | | | | |
| (ඇ) | | | | |
| (ඈ) | | | | |
| (ඉ) | | | | |
| (ඊ) | | | | |
| (උ) | | | | |

(7) තොරතුරු දැනගත හැකි දෙදෙනෙකුගේ නම් හා ලිපිනය :————.

(අ) ————

(ආ) ————

(8) විශේෂ සුදුසුකම්/අයිතිවාසිකම් ඇත්නම් :————.

.......................................................,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

**සැලකිය යුතුයි :—**

පහත සඳහන් අවශ්‍යතාවයන් අනුව පිටපත් (මුලික පිටපත් නොවේ) ඉදිරිපත් කළ යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය/නොමැති නම් ඒ වෙනුවට දිවුරුම් පත්‍රයක් ;

(ආ) අධ්‍යාපන සහතික ;

(ඇ) මෑතකදී ලබා ගන්නා ලද සහතික පත් 3 ක් ;

(ඈ) කලින් කල වෘත්තිය සඳහා සහතික පත්.

2–438—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල

## මහා භාණ්ඩාගාරයේ පරිපාලන අභ්‍යාස ආයතනය

1969 අප්‍රේල්-මැයි කාලය තුළදී කළමනාකාරිත්ව සංවර්ධනය පිළිබඳ කෙටි කාලීන පාඨමාලාවක් කොළඹදී පැවැත්වීමට පරිපාලන අභ්‍යාස ආයතනය විධිවිධාන යොදා තිබේ. සති හයක කාලයක් තුළ පැවැත්වෙන මේ පාඨමාලාව 1969 අප්‍රේල් 17 වැනි දින ආරම්භ කිරීමට නියමිතව ඇති අතර, එය, කොළඹ 3, ග්ලෙන් ආබර් පෙදෙසේ අංක 32 දරණ ස්ථානයෙහි පිහිටි පරිපාලන අභ්‍යාස ආයතනයෙහි පවත්වනු ලැබේ.

2. සංවර්ධන කාර්ය පද්ධතිය සඳහා අවශ්‍ය පරිපාලන සහාය සැපයීම් වස් රාජ්‍ය අංශයේ කළමනාකාරිත්ව ප්‍රවීණතාව වැඩි දියුණු කිරීම මේ පාඨමාලාවෙන් අරමුණු කොට තිබේ.

3. පාඨමාලාවේ පරමාර්ථයෝ නම් :—

(අ) පහත සඳහන් කරුණු පිළිබඳ දැනුමැති බවක් හා අවබෝධයක් ඇති කිරීම :—

(i) රජයේ සම්පූර්ණ කාර්යය හා කාර්ය පද්ධතිය ;

(ii) කළමනාකාරිත්වයේ පරිසරය ;

(iii) සංවිධානාත්මක ආවරණය ;

(iv) කළමනාකාරිත්ව කටයුතුවල අභින්න ස්වභාවය.

(ආ) තීරණයක් ගැනීමේ කාර්ය පද්ධතිය ශක්තිමත් කිරීම.

(ඇ) වර්තමාන පරිපාලන ව්‍යවහාරාදිය සහ ශිල්පීය ධර්මයන් පරීක්ෂා කිරීම.

(ඈ) අදහස් හුවමාරුව වැඩි දියුණු කිරීම.

(ඉ) කළමනාකරුට තමාගේම සංකල්පයන් හා ආකල්පයන් විවේචනාත්මකව පරීක්ෂාකර බැලිය හැකි අර්ථවත් සාකච්ඡා මණ්ඩලයක් සලස්වා දීම.

(ඊ) කාර්ය සාධනයේ වැඩ දියුණුව හා ස්ව සංවර්ධනය පිළිබඳව උනන්දුවෙන් කටයුතු කර ගෙන යාම සඳහා එක් එක් කළමණාකරුවකු තුළ ආශාවක් ජනිත කරවීම.

4. මේ පාඨමාලාව, ලංකා පරිපාලන සේවයේ IV වැනි සහ V වැනි පන්තිවල ස්ථිර නිලධාරීන්ටත්, රාජ්‍ය සේවයේ එම තරාතිරමේම කාර්මික හා විද්‍යාත්මක නිලධාරීන්ට මෙන්ම, රාජ්‍ය සංස්ථාවල හා සන්නද්ධ සේවාවල ඒ හා සමාන ජ්‍යෙෂ්ඨතාවක් ඇති නිලධාරීන්ටත් විවෘත වේ. අඩුම වශයෙන් මාණ්ඩලික තත්ත්වයේ අට අවුරුද්දක පළපුරුද්දක් අවශ්‍ය වනු ඇත. මීට සහභාගිවන්නන් තෝරාගනු ලබන්නේ පළපුරුද්ද හා කාර්ය අංශයන් පිළිබඳ පුළුල් අන්තරයක් නියෝජනය කෙරෙන පරිදිය. සහභාගිවන මුළු සංඛ්‍යාව 32 ක් වනු ඇත.

5. පුහුණුව ලබන්නන් මුළු කාලය යොදා පාඨමාලාවට සහභාගි විය යුතු අතර, මේ කාලපරිච්ඡේදය තුළ ඔවුන්ගේ සාමාන්‍ය රාජකාරිවලින් නිදහස් කරනු ලැබිය යුතුය. පුහුණුව සඳහා රජයේ සේවයෙන් තෝරාගනු ලබන්නන් රාජකාරි නිවාඩු පිට මුදාහරිනු ලබන අතර, මුදල් රෙගුලාසිවලට අනුකූලව සාමාන්‍ය ගමන් වියදම් දීමනා, යැපීම් දීමනා හා නවාතැන් දීමනා ලැබීමට ඔවුන්ට හිමිකම් ඇත.

6. මීට යටින් ඇති ආදර්ශ ආකෘති පත්‍රය පරිදි පිළියෙළ කළ යුතු අයදුම්පත් 1969 මාර්තු 10 වැනි දට හෝ ඊට පළමු කොළඹ 3, ග්ලේන් ආබර් පෙදෙසේ අංක 32 දරණ ස්ථානයෙහි පරිපාලන අභ්‍යාස අධ්‍යක්ෂට ලැබිය යුතුය. අයදුම්පත් දෙපාර්තමේන්තුවේ හෝ සංස්ථාවේ ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතු අතර, පාඨමාලාවට සහභාගිවීම සඳහා සම්පූර්ණ වැටුප් මත නිලධාරියා මුදාහරිනු ලබන බවටත්, පාඨමාලාව පැවැත්වෙන කාලපරිච්ඡේදය තුළ ඔහුට යම් රාජකාරි හෝ වැඩ කොටස් නොපවරනු ලබන බවටත් ඔහු සහතික කළ යුතුය.

එච්. ඇස්. වනසිංහ,
පරිපාලන අභ්‍යාස අධ්‍යක්ෂ,
භා/ලේ. වෙනුවටය.

### පරිපාලන අභ්‍යාස ආයතනය

### කළමනාකාරිත්ව සංවර්ධනය පිළිබඳ කෙටි කාලීන පාඨමාලාව—ඉල්ලුම් පත්‍රය—(1969 අප්‍රේල්-මැයි)

#### I වැනි කොටස

(අයදුම්කරු විසින් පුරවනු ලැබීමටයි)

1. සම්පූර්ණ නම :————.
(වාසගමට යටින් ඉරක් අඳින්න) (පැහැදිලි අකුරින්)

2. වයස :————. උපන් දිනය :————.

3. දෙපාර්තමේන්තුව :————.

4. පදවි නාමය :————.

5. ඔබේ පෞද්ගලික වගකීම ලුහුඩින් දක්වා වර්තමාන රාජකාරි පිළිබඳ විස්තරයක් :————.

6. කලින් පළපුරුද්ද :————.
(ඔබ කලින් දැරූ තනතුරු ඒවාට අදාල දිනයන් සමග දක්වන්න).

7. අධ්‍යාපනය පිළිබඳ වාර්තාව :————.
උපාධිය, ඩිප්ලෝමා සහතික සහ උපාධිය හෝ ඩිප්ලෝමාව සඳහා හැදෑරූ විෂයයන්).

8. මේ පාඨමාලාව හැදෑරීමෙන් ඔබ ලබාගන්නට බලාපොරොත්තු වන දෑ පිළිබඳ වචන 500 වැඩි නොවන කෙටි විස්තරයක් දක්වන්න :————.

9. ලිපිනය හා ටැලිපෝන් අංකය :————.

.............................................. වන මා විසින් සපයා
(සම්පූර්ණ නම)
ඇති ප්‍රකාශයන් මගේ හොඳ විශ්වාසයේ හැටියට සත්‍ය බවත්, නිවැරදි බවත්, සහතික කරමි.

පුහුණුව සඳහා පිළිගනු ලැබුවහොත්, පරිපාලන අභ්‍යාස අධ්‍යක්ෂ විසින් නියම කරනු ලැබිය හැකි උපදෙස් අනුගමනය කිරීමටත්, ඒ කොන්දේසිවලට එකඟවීමටත් මම පොරොන්දු වෙමි.

————
අත්සන.

දිනය :————.

#### II වැනි කොටස

(නාම යෝජක බලධාරියා විසින් පුරවනු ලැබීමටයි)

........................................ මහතා තෝරා ගනු ලැබුවහොත් අභ්‍යාස පාඨමාලාවට සහභාගිවීම සඳහා සම්පූර්ණ වැටුප් පිට ඔහු මුදා හරිනු ලබන අතර, මේ කාලපරිච්ඡේදය තුළදී කිසිම රාජකාරියක් හෝ වැඩ කොටසක් ඔහුට නොපවරනු ලැබේ.

————
නාම යෝජක බලධාරියාගේ අත්සන
සහ පදවි නාමය.

2–400—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව

අධ්‍යක්ෂ විසින් නියම කරන දින සිට අවුරුද්දක කාල සීමාවක් තුළ, කටුනායක්කුරේ ගුවන් තොටුපලේ පරිපාලන ගොඩනැගිල්ලේදී ගුවන් මගීන්ට සහ කාර්ය මණ්ඩලයට, ආහාරපානාදිය සැපයීමේ හා විකිණීමේ වරප්‍රසාදය පැවරීම සඳහා 1969 මාර්තු 1 වන දින පෙ. ව. 10 දක්වා සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ විසින් ලංකාවේ ටැන්ඩර්කරුවන්ගෙන් ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

මෙම කාර්යාලයේදී හෝ කටුනායක්කුරේ සහකාර ගුවන් තොටුපල පාලක තැනගේ කාර්යාලයේදී හෝ කොළඹින් පිටස්තර ඕනෑම කච්චේරියකදී හෝ රු. 25 ක මුදලක් තැන්පත් කරන ලදුව, සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටැන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතු වේ.

ඩබ්ලිව්. ඇල්. පී. ද මැල්,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ.

තැපැල් පෙ. 535,
ලෝටස් පාර, කොළඹ 1,
1969 පෙබරවාරි 7 දින,

2–411—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

## පොලිස් දෙපාර්තමේන්තුව

"රුහුණු රාජ්" ලෝන්ච් යන්ත්‍රයට අවුට්බෝඩ් මෝටරයක් සැපයීම සඳහා කොළඹ නැ. පෙ. අංක 517 පොලිස් මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969 මාර්තු මස 2 වැනි දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් පත්‍ර බාරගනු ලැබේ.

ඉහත සඳහන් වේලාවට ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමේදී එතැනට පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ.

ටෙන්ඩර් කොළඹ පොලිස් මූලස්ථානයේ පොලිස්පතිගෙන් ලබාගන්නා ලද නියමිත ආකෘති පත්‍රයෙහි ලියා පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 50 ක් තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනට ප්‍රථම දින දවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර ලබාගත හැකිය. මෙම තැන්පත් මුදල කොළඹ පොලිස් මූලස්ථානයෙහි හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

මේ පිළිබඳ වැඩි මනත් විස්තර පොලිස්පති කාර්යාලයෙන් ලබා ගත හැකිය.

ආර්. ඊ. පෙරේරා,
පොලිස්පති වෙනුවට.

මගේ අංකය : එකි. ඩී. 24/98-69
පොලිස් මූලස්ථානය, කොළඹ 1,
1969 ජනවාරි මස 30 වැනි දින.

2–306—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

## 1969 මැයි මස 1 වැනි දින සිට 1970 ජනවාරි 31 වැනි දින දක්වා වූ කාල සීමාව තුළ සීදූවේ බණ්ඩාරවත්තේ පිහිටි රජයේ ස්කාගාරයට රා සැපයීම

1969 මැයි මස 1 වැනි දින සිට 1970 ජනවාරි මස 31 වැනි දින දක්වා වූ කාල සීමාව තුළ සීදූවේ බණ්ඩාරවත්තේ පිහිටි රජයේ අරක්කු ස්කාගාරයට රා සැපයීම පිණිස ටැන්ඩර්, කොළඹ 7 තේ ටොරින්ටන් චතුරශ්‍රයේ පිහිටි ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969 මාර්තු 5 වැනි දින පෙරවරු 10 දක්වා භාර ගනු ලැබේ.

සුරාබදු කොමසාරිස්ගෙන් ඉල්ලුම් කිරීමෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු අතර, මේ පිළිබඳව සියලු විස්තර ද ඔහුගෙන් ලබා ගත හැක.

මූ. බ. දිසානායක,
සුරාබදු කොමසාරිස්.

කොළඹ 7,
ටොරින්ටන් පෙදෙස,
සුරාබදු කොමසාරිස් කාර්යාලය,
1969.1.31.

2–315—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—ගාල්ල උප කොට්ඨාශය

1969 මාර්තු 9 වැනි ඉරිදා පෙරවරු 10 දක්වා තංගල්ලේ දකුණු කොට්ඨාශය භාර ප්‍රදේශීය වාරිමාර්ග ඉංජිනේරුතුමා විසින් පහත සඳහන් වැඩ සඳහා ටැන්ඩර්පත් භාරගනු ලැබේ. ටැන්ඩර් විවෘත කිරීම එවේලේම සිදු කෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පිළිවෙලින් රු. 29,000 සහ රු. 24,000 කට ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ලියාපදිංචි සමිතිද, ඇතුළුව මෙම වැඩ සඳහා ටැන්ඩර්පත් ඉදිරිපත් කළ හැක.

i. ගාලු දිස්ත්‍රික්කයේ දේද්දුව ව්‍යාපාරයේ ඔබඩවත්ත ඇල වැඩි දියුණු කිරීම.

ii ගාලු දිස්ත්‍රික්කයේ අක්මීමන අමුණ වැඩිදියුණු කිරීම.

3. 1969 මාර්තු 7 වන දින දවල් 12 වන තෙක් කායාීල වේලාවන් තුළදී මාතර, ගාල්ල, තිස්ස සහ හම්බන්තොට වාරිමාර්ග ඉංජිනේරුවන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකි පෝර්මවල ටෙන්ඩර්පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් ඉදිරිපත් කළ යුතුයි. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම පිළිවෙලින් රු. 50 සහ රු. 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ වෙනුවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

4. මේ ටෙන්ඩර් ගැන වැඩිපුර විස්තර කාර්යාල වේලාව තුළදී ගාල්ල උප කොටසේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

වාරිමාර්ග ඉංජිනේරු තැන,
ගාල්ල උප කොටස.

වාරිමාර්ග කාර්යාලය,
ගාල්ල, 69.1.30.

338—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මොනරාගල උප කොටස

මොනරාගල උප කොට්ඨාශයේ පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත් 1969 මාර්තු මස 13 වන බ්‍රහස්පතින්දා පෙ. ව. 10.00 දක්වා බණ්ඩාරවෙල, ඌව කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවෙලේම එහිදී සිදු කෙරේ :—

| වැඩ විස්තරය | | කොන්ත්‍රාත්කරුගේ ලියාපදිංචි මුදල රු. | | ටෙන්ඩර් තැන්පත් මුදල රු. |
|---|---|---|---|---|
| 1. හඳපනාගල ව්‍යාපාරයේ පිවිසුම් පාරේ දෙවන සැතපුමට තාර දැමීම | ... | 20,000 | ... | 25 |
| 2. හඳපනාගල ව්‍යාපාරයේ වාරිමාර්ග දුෂ්කරතා මහ හැරවීම සඳහා වැව් බැම්ම වැඩි දියුණු කිරීම | ... | 60,000 | ... | 100 |

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉහතින් දක්වෙන ප්‍රමාණයට ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට, සමුපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක. 1969 මාර්තු මස 9 වන දින ප.ව. 4.00 දක්වා කායාීලයීය වේලාවන් තුළදී මොණරාගල, බදුල්ල සහ මහියංගනය යන වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කායාීලවලින් ලබාගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි වාර්තා පොත් හා දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශනයක්, ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ දිය යුතුද ? නැද්ද ? යන්න ගැන සළකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත් නිකුත් කිරීමට ප්‍රථම ඉහත දක්වෙන පිළිවෙලට ටෙන්ඩර් තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කායාීලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතු ය.

3. මෙම වැඩය ගැන සියළුම විස්තර කායාීලයීය වේලාවන් තුළදී මොනරාගල උප කොටස භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැකිය.

ඒ. එෆ්. මහගමගේ,
වාරිමාර්ග ඉංජිනේරු, මොනරාගල උප කොටස.

1969 ජනවාරි මස 30 වැනි දින,
මොනරාගල වාරිමාර්ග කායාීලයේ දී ය.

2–395—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### අම්බලන්තොට බිත්තර වී මධ්‍යස්ථානයේ 3බී නිවාස දෙකක් ගොඩනැගීම

අම්බලන්තොට තැනීමට යෝජිත ඉහත සඳහන් ගොඩනැගිලි ගොඩනැගීම සඳහා පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත්‍ර 1969. 3. 13 වෙනි දින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. කොළඹ 3, ගාලු පාරේ අංක 457, දරණ ස්ථානයේ පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, නියෝජ්‍ය අධ්‍යක්ෂක (ඉංජිනේරු) තැනගෙන් ලබා ගත හැකි පෝර්ම පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන් විශේෂ විස්තර හා වෙනත් තොරතුරුද, ලබා ගත හැක.

3. බලාපොරොත්තුවන ටෙන්ඩර් කරුවන් රු. 50,000 කට නොඅඩු මුදලකට ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ කිරීම සඳහා රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වෙනත් රජයේ දෙපාර්තමේන්තුවක හෝ ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් විය යුතුය.

4. පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කළ විට 1969. 2. 26 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ :—

(අ) 3 වැනි ඡේදයේ සඳහන් ලියාපදිංචි කිරීමේ ලියවිල්ලක්,

(ආ) රු. 100ක ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක්.

5. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂ වරයාගේ අංක 37 දරණ ගිනුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඒ. සී. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1969. 2. 3 වෙනි දින,
කොළඹ 3, ගාලු පාරේ,
අංක 457 දරණ, ස්ථානයේ,
පිහිටි සිවිල් ඉංජිනේරු කාර්යාලයේ දී ය.

2–384—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

වැලිසර සත්ව ගොවිපලේ පයින්ට් 2½ සිට 3 දක්වා ප්‍රමාණයේ කිරි හට්ටි 11,828 ක් විකිණීමට ඇත. ඒවා සම්බන්ධ විස්තර පහත දැක්වේ.

| | |
|---|---|
| කටේ ප්‍රමාණය | අඟල් 6½. |
| ගැඹුර | අඟල් 3½. |

මේවා මිලදී ගැනීම සඳහා සීල් තබා එවන ටෙන්ඩර් කොළඹ 1, **ඩියුක් වීදියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සත්ව පාලන හා සෞඛ්‍ය** අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969. 3. 5 වැනි දින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. කොළඹ 1, ඩියුක් වීදියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (සත්ව පාලන හා සෞඛ්‍ය) ගෙන් ටෙන්ඩර් ෆෝරම ලබාගෙන ඒවායෙහි ටෙන්ඩර් පිළියෙල කොට එවිය යුතුය. සියළුම ටෙන්ඩර් පිටපත් 2 කින් යුක්තව කවරයක බහා සීල් තබා "සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, සත්ව පාලන හා සෞඛ්‍ය අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ඩියුක් වීදිය, කොළඹ 1" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ටෙන්ඩර් බහාලන කවරයේ ඉහල වම් කෙළවරේ "කිරි හට්ටි මිලදී ගැනීම සඳහා ටෙන්ඩර්" යන්න පැහැදිලිව ලිවිය යුතුය. අතින්ම ගෙනවිත් භාරදිය හැකි ටෙන්ඩර් ඉහත සඳහන් ලෙස සකස් කර කොළඹ යථෝක්ත කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට නියමිත අවසාන දින දවල් 12 තෙක් ටෙන්ඩර් ෆෝරම නිකුත් කරනු ලැබේ.

4. ටෙන්ඩර් ෆෝරම නිකුත් කරනු ලබන්නේ එක් ෆෝරමයක් වෙනුවෙන් රු. 10 බැගින් මුදල් තැන්පත් කළ බවට මුදල් කුවිතාන්සියක් ඉදිරිපත් කළහොත් පමණි. මුදල් තැන්පත් කිරීම පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක නැතහොත් කොළඹ, යෝර්ක් වීදියේ ලංකා බැංකු ශාඛාවේ අංක 37 දරණ කෘෂිකර්ම අධ්‍යක්ෂගේ ගිණුමට බැර කළ හැකිය. ලංකා බැංකුවේ මුදල් තැන්පත් කරන්නේ නම් බැංකුව විසින් සපයන අංක 118 දරණ පොදු ආකෘති පත්‍රය සම්පූර්ණ කර බැංකුවට භාර දිය යුතුය.

5. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ඉදිරියේ පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීමට නියමිත අවසාන දින අවසන් වේලාවට ලැබී ඇති ටෙන්ඩර් කොළඹ 1, ඩියුක් වීදියේ සත්ව පාලන හා සෞඛ්‍ය කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

6. විකිණීමට ඇති කිරි හට්ටි පරීක්ෂාකර බැලීමට අවශ්‍ය නම් වැලිසර සත්ව ගොවිපලේ කළමනාකාර තැන සමග කල් ඇතිව යොදාගත් වේලාවල (කාර්යාල වේලාවන් තුළදී) ඒවා පරීක්ෂා කර බැලිය හැක.

7. වැඩි විස්තර වැලිසර සත්ව ගොවිපලේ කළමනාකාර තැනගෙන් හෝ කොළඹ 1, ඩියුක් වීදියේ සත්ව පාලන හා සෞඛ්‍ය කාර්යාල යෙන් ලිපි මඟින් දැනගත හැකිය.

අබේරත්න බණ්ඩාරනායක,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (සත්ව පාලන හා සෞඛ්‍ය.)

1969. 2. 7 වැනි දින,
කොළඹ 1, සත්ව පාලන හා
සෞඛ්‍ය කාර්යාලයේදී ය.

2–424—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

## ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව

### ධාන්‍ය ගබඩා තැනීම සඳහා ටෙන්ඩර්

පහත සඳහන් ස්ථානයන්හි ධාන්‍ය ගබඩා තැනීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1969 මාර්තු මස 7 වෙනි සිකුරාද ප.ව. 2.30 දක්වා කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන/සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

| දිස්ත්‍රික්කය | ගබඩා තනන ස්ථානය | ගොඩනැගිලි ගණන |
|---|---|---|
| මොණරාගල ... | බිබිලේ ... | එකයි (1) |

2. රුපියල් 250 ක් තැන්පත් කර, ඒ සඳහා ලබාගන්නා ලද කුවිතාන්සි ඉදිරිපත් කර, කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ, අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ අංක 60 දරණ ස්ථානයේ ප්‍රධාන ගණකාධිකාරී වෙත හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක මුදල් තැන්පත් කළ යුතුය.

3. රුපියල් 30,000 ක් හෝ ඊට වැඩි ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩ සඳහා රජයේ බලය ලත් කොන්ත්‍රාත්කරුවන්ට පමණක් සටහන් පොත ඉදිරිපත් කිරීමෙන් 1969 මාර්තු මස 6 වැනිද දවල් 12.00 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. තැපැලෙන් ටෙන්ඩර් පත්‍ර ඉල්ලා සිටින ටෙන්ඩර් කරුවන් විසින් ඒවා ලබාගෙන අවසාන දිනට හා වේලාවට ප්‍රථම ටෙන්ඩර් පත්‍ර එවීමට හැකිවන පරිදි කල්වේලා ඇතිව එසේ කළ යුතුය.

4. වැඩි විස්තර සඳහා කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් විමසන්න.

වී. ටී. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1969 පෙබරවාරි 14 වැනි දින,
කොළඹ 7,
තැ.පෙ. 537,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ දීය.

2–379—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය: 3/5/1193

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

කොළඹ 1, මහලේකම් කාර්යාලයේ තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් විසින් ඉබේ පිරවෙන වාරිමාර්ග පොම්පයක් (Self Priming Contrifugal Irrigation Pump.) සැපයීම සඳහා 1969 මාර්තු 7 වැනි දින ප. ව. 2,30 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ. මේ පිළිබඳව අවශ්‍ය විශෙෂ විස්තර මගේ විමසීමෙන් ලබාගත හැකිය.

2. මේ සඳහා ඉදිරිපත් කරනු ලබන මිළ ගණන්වල පොම්පය, ඇන්ජිම, ට්‍රේලරය සහ එහි කොටස් සඳහා ගණන් මෙන්ම කුරුණෑගල දිස්ත්‍රික්කයේ වඩුරුස්ස ජනපදයට ප්‍රවාහණය කිරීමේ ගාස්තුද ඇතුළත් විය යුතුය.

3. 1969 මාර්තු 6 වැනි දින දහවල් 12 දක්වා කාලය තුළදී කොළඹ 1, මහලේකම් කාර්යාලයේ (තැ. පෙ. 500) ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේදී ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ.

4. මෙම සැපයුම සම්බන්ධයෙන් රු. 250 ක මුදලක් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියේ තැන්පත් කොට එම රිසිට් පත් ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර ඉඩම් කොම සාරිස්වරයා වෙත ඉදිරිපත් කරන ලෙස ටෙන්ඩර්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

5. ටෙන්ඩර් අනුපිටපතින් යුතුව ලියා පදිංචි කළ තැපැලෙන් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩරය බහාලූ සීල් තැබූ කවරයෙහි වම්පස ඉහල කෙළවරේ ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනයත් සපයනු ලබන දෙය එනම් ඉබේ පිරවෙන වාරිමාර්ග පොම්පය යන්නත් සඳහන් කළ යුතුය. ටෙන්ඩරය තැපැලෙන් නොඑවන්නේ නම් එය කොළඹ ගාලු මුවදොර මහලේකම් කාර්යාලයේ තුන්වැනි මහලේ 357 වැනි කාමරයේ ටෙන්ඩර් පෙට්ටියට පුද්ගලිකව බහාලිය හැකිය.

6. 1969 මාර්තු 7 වැනි දින ප. ව. 2.30 ට ඉහත සඳහන් 357 වැනි කාමරයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත් විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට එහි පැමිණ සිටිය හැකිය.

7. මේ පිළිබඳ වැඩි විස්තර කොළඹ තැ. පෙ. 500 දරණ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඉඩම් කොමසාරිස්වරයාගෙන් ලබාගත හැකිය.

බී. කේ. අබයරත්න,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව,
කොළඹ.
1969 ජනවාරි මස 31 දින.

2–310—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

## සුළු වාරිමාර්ග වැඩ—හම්බන්තොට දිස්ත්‍රික්කය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් විසින් 1969 මාර්තු මස 9 වැනි දින දවල් 12 දක්වා, මෙම කාර්යාලයේ, හම්බන්තොට දිසාපති කාර්යාලයේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන්, පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ:—

1. මාගම් පත්තුවේ ආරබොක්ක වැව අළුත්වැඩියාකිරීම.
2. මාගම් පත්තුවේ කරමැටිය වැව් කණ්ඩිය අළුත්වැඩියාකිරීම.
3. මාගම් පත්තුවේ වැලිවැවේ කණ්ඩිය තැනීම.
4. මාගම් පත්තුවේ වලගමයාය බස්නා ගේට්ටුව තැනීම.
5. මාගම් පත්තුවේ ගොඩගමයාය ගොඩැල්ලෙ ඇලට ඇනිකට් එකක් තැනීම.
6. මාගම් පත්තුවේ ගගේයාය ඇලගාව කුඹුරට ගේට්ටුව තැනීම.
7. මාගම් පත්තුවේ දීරසේකරයාය සාම්ගෙ ඉඩම ලඟ ගේට්ටුව තැනීම.
8. මාගම් පත්තුවේ මත්තල අනුක්කන්ගල වැව අළුත්වැඩියා කිරීම.
9. මාගම් පත්තුවේ බුත්දල ඌරණිය වැව අළුත්වැඩියාකිරීම.
10. මාගම් පත්තුවේ උඩුවිල අක්කර අටේ බස්නාව තැනීම.
11. මාගම් පත්තුවේ ජයවික්‍රමයාය කුප්පම්මගෙ කුඹුරෙ බස්නා ගේට්ටුව තැනීම.
12. නැගෙනහිර ගිරුවා පත්තුවේ අක්කර 90 ඇලට බැම්මක් බැඳීම (කොලව්වත්ත).
13. නැගෙනහිර ගිරුවා පත්තුවේ මෝදර පිලිවල රවුම් ඇල බැඳීම කොග්ගල්ලයාය).
14. නැගෙනහිර ගිරුවා පත්තුවේ වැටියේ වැව අළුත්වැඩියාකිරීම (ජන්සේගම).
15. නැගෙනහිර ගිරුවා පත්තුවේ වගේගොඩ වේල්ල තැනීම (රොටවල).
16. නැගෙනහිර ගිරුවා පත්තුවේ ලුනම වැව අළුත්වැඩියාකිරීම (ලුනම).
17. දකුණු ගිරුවා පත්තුවේ නාකුළුගමුව පිංලියද්ද රෙගුලේටරය තැනීම.
18. නැගෙනහිර ගිරුවා පත්තුවේ වකමුල්ල කිරිදිවත්ත පීල්ල තැනීම.
19. නැගෙනහිර ගිරුවා පත්තුවේ මැටිගන්වල විජිනිංගම මහවැව අළුත්වැඩියාකිරීම.
20. දකුණු ගිරුවා පත්තුවේ දම්මුල්ල කරහිංගමයායේ ඇල කණ්ඩිය තරකිරීම.
21. දකුණු ගිරුවා පත්තුවේ ගල-දෙද්දුවාවල උණන බිබුල හා ඇලේ මදව්ව තැනීම.
22. උතුරු ගිරුවා පත්තුවේ හම්බුමණ්ඩිය වැලිඅමුණ ඇලට ගේට්ටු දෙකක් තැනීම.
23. උතුරු ගිරුවා පත්තුවේ ඕලුආර රුප්පෙ ඇල අමුණ තැනීම.
24. උතුරු ගිරුවා පත්තුවේ කෝරාලගේ අමුණ වැව අළුත්වැඩියා කිරිම.
25. උතුරු ගිරුවා පත්තුවේ බුද්දියාගම පාලත්කඩ වැව අළුත් වැඩියාකිරීම.
26. උතුරු ගිරුවා පත්තුවේ බැදිගම නුගගහ වැවේ ගොඩ ඇල අළුත්වැඩියාකිරීම.
27. උතුරු ගිරුවා පත්තුවේ බැදිගම අකුල් කැටිය වැව අළුත් වැඩියාකිරීම.
28. උතුරු ගිරුවා පත්තුවේ බැදිගම පෝටාව වැව අළුත්වැඩියා කිරීම.

2. හම්බන්තොට ගොවිජන සේවා සහකාර කොමසාරිස් කාර්යාලයෙන් ටෙන්ඩර් පෝරම ලබාගෙන එක් එක් කර්මාන්තය සඳහා පිටපත් දෙකකින් යුතුව වෙන් වෙන්ව ලියුම් කවරයක බහා කවරයෙහි වම් කෙලවරෙහි "සුළු වාරිමාර්ග වැඩ සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කර හම්බන්තොට ගොවිජන සේවා සහකාර කොමසාරිස් වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එසේ නැතහොත් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුය.

3. ටෙන්ඩර් පෝරම 1969 මාර්තු මස 2 වැනි දින පෙරවරු 10 තෙක් මෙම කාර්යාලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් පෝරම දෙනු ලබන්නේ එක් එක් කර්මාන්තය වෙනුවෙන් රුපියල් දහයක් (රු. 10) හම්බන්තොට දිසාපති කාර්යාලයේ තැන්පත් කොට කුවිතාන්සි ඉදිරිපත් කළ විටය. ගිවිසුම් අත්සන් කිරීමෙන් පසු ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ලැබේ.

4. ටෙන්ඩර් තෝරීමේදී සාර්ථකත්වය ලැබූ ටෙන්ඩර්කරු විසින් එම කර්මාන්තය පිළිබඳ ටෙන්ඩරගත වටිනාකමින් සියයට පහක මුදලක් හම්බන්තොට දිසාපති කාර්යාලයේ තැන්පත් කොට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසු ගිවිසුම් අත්සන් කළ හැක.

5. 1969 මාර්තු මස 9 වැනි දින පස්වරු 2.30ට ටෙන්ඩර් විවෘත කර පරීක්ෂා කරන අවස්ථාවේදී සෑම ටෙන්ඩර්කරුවෙකුටම එයට සහභාගි විය හැක.

6. මෙම ටෙන්ඩර් පිළිබඳ වැඩි විස්තර හම්බන්තොට ගොවිජන සේවා සහකාර කොමසාරිස් කාර්යාලයෙන් විමසිය යුතුය.

සී. ඩී. එස්. රත්නවීර,
හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස්.

1969.1.29 වැනි දින,
හම්බන්තොට ගොවිජන සේවා සහකාර
කොමසාරිස් කාර්යාලයේ දිය.

2–331—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### වශී අගලකට රාත්තල් 80ක ප්‍රමාණයේ පීඩනයක් සහිත ගල්විනයන් 10ක් සැපයීම

ඉහත සඳහන් ගල්විදිනයන් සැපයීම සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් 1969. 3. 7 වන දින පෙරවරු 11 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර්කරුවන් විසින් සැපයීම කළ යුත්තේ (ඒ) තිබෙන තොගයෙන් කිරුළපනයේ මධ්‍යම ගබඩාවට භාරදීමට හෝ (බී) ආනයනය කරන තොගයෙන් කිරුළපනයේ මධ්‍යම ගබඩාවට භාර දීමටත් ය. ටෙන්ඩර්කරුවන් විසින් භාරදිය හැකි ඉතාම නුදුරු කාල සීමාව සඳහන් කළ යුතුය.

3. 1969. 3. 6 වෙනි දින දාවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් ෆෝර්මයක අනු පිටපතකුත් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්මේන්තු කාර්යාලයේ හෝ කොළඹ යෝර්ක් විදියේ ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ අංක 1 දරන ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක හෝ රු. 25 ක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

4. ටෙන්ඩර් පෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නො හැකි වූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල් ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනයට හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළහොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

5. සියලු ටෙන්ඩර් කවරයන්හි වම් පස ඉහළ කෙළවරේ "ගල් විදිනයන් 10 ක් සැපයීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ, එච්ලන් චතුරශ්‍රය, කොළඹ 1, යන ලිපිනයට එවිය යුතුයි. කවරයේ වම් පස පහළ කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි කළ තැපෑලෙන් පුද්ගලික නියෝජිතයෙකුගේ මාර්ගයෙන් හෝ තමා විසින් හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනට භාරදිය යුතුයි.

6. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදාල නොවිය යුත්තේ ය. ටෙන්ඩර් සලකා බැලීමට ඇති හෙයින් විවෘත කළ දින සිට දින 30 ක් යන තෙක් ඒවා ආපසු ගෙන්වා ගත නොහැකිය.

7. ටෙන්ඩර්කරුවන් සැපයීම පිළිබඳව සම්පූර්ණ විස්තරයක් ඉදිරිපත් කළ යුතුයි. පිළිගත් විස්තරයකට යම්කිසි වෙනස්වීමක් වෙතොත් ඒ බැව් සඳහන් කළ යුතුයි.

8. සාර්ථක වූ ටෙන්ඩර්කරු සැපයීම පැහැර හැරියොත් තැන්පත් මුදල රාජසන්තක වනවා පමණක් නොව, රජයේ කොන්දේසි කඩ කරන කොන්ත්‍රාත් කරුවන්ගේ ලේඛනයට ඔහුගේ නමද ඇතුළත් වන්නේ ය.

9. කොළඹ එච්ලන් චතුරශ්‍රයේ, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 1969. 3. 7 වැනි දින පෙරවරු 11ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

10. කිසියම් ප්‍රශ්න කිරීමක් නොමැතිව ටෙන්ඩරයක කොටසක් හෝ සම්පූර්ණයෙන්ම හෝ ප්‍රතික්ෂේප කිරීමට හෝ ටෙන්ඩරයේ කොටසක් පිළිගැනීමට අයිතිය රජය සතුය.

11. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතැන විමසන්න.

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

සීපී/2/354
ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලය,
කොළඹ, 1969.2.7.

2–421—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

## තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුව

මරදාන සහ ජාවත්තෙහි පිහිටි තැපැල් සහ විදුලි සංදේශ ගබඩාවල තබා ඇති සේවයට නුසුදුසු බඩු බාහිරාදිය විකිණීම සඳහා, කොළඹ ඩියුක් වීදියේ නව මධ්‍යම විනිමය ගොඩනැගිල්ලේ ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලයේ ගැණුම්පත් මණ්ඩලයේ සභාපති විසින් 1969 මාර්තු 13 වෙනි දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

කොළඹ 1 ඩියුක් වීදියේ නව මධ්‍යම විනිමය ගොඩනැගිල්ලේ 5 වන මහලේ ප්‍රධාන විදුලි සන්දේශ ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත් ෆෝර්ම වලින් පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතුයි. ඉහත සඳහන් කාර්යාලයේදී ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂාකර බැලීමටද අවශ්‍ය විස්තර දැනගැනීමටද පුළුවන.

තැපැල් කාර්යාලයක ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රුපියල් 100 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමෙන් 1969 මාර්තු 6 වෙනි දින පස්වරු 4 වනතෙක් බලාපොරොත්තු ටෙන්ඩර් කරුවනට ටෙන්ඩර් ඉල්ලුම් පත් ලබාගත හැකිවේ.

ජී. ඊ. ද ඇස්. එල්ලාවල,
ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සංදේශ
අධ්‍යක්ෂ වෙනුවට.

ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලය,
කොළඹ 1.

2–321—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන නිලධාරී—කොළඹ

1968-69 වර්ෂයේ දෙවන භාගය සඳහා ගොඩනැගිලි තැනීමේ ද්‍රව්‍ය සැපයීම සඳහා පහත සඳහන් කොට්ඨාශයන් වෙනුවෙන් ටෙන්ඩර් මවිසින් කැඳවනු ලැබේ :—

(අ) කළුතර දිස්ත්‍රික්කයේ : හැඩිගල්ල, වරතල්ගොඩ, ඉහල හෙවැස්ස, පැලවත්ත සහ පැණියාවල ;

(ආ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ : හක්වටුණාඔය, විල්ගම්දෙමටාව, වෙල්ලන්ගිරිය සහ කලුගල්ල ;

(ඇ) රත්නපුර දිස්ත්‍රික්කයේ : අයගම, දෙල්ගොඩ, කරවිට, කුකුලේගම, මඩලගම සහ වරතල්ගොඩ ;

(ඈ) කොළඹ දිස්ත්‍රික්කයේ : කිරිලපන මධ්‍යම කාර්මික හල සහ ගබඩාව කොළඹ 6, වැල්ලම්පිටිය, රත්මලාන, ප්‍රධානකායභීලය දිර්ඝ කිරීමේ අංශය, කොළඹ 1.

කොළඹ 2, ඇල්ස්ටන් පෙදෙසේ කොළඹ ඉඩම් සංවර්ධන නිලධාරී විසින් 1969 මාර්තු 13 වෙනි දින පෙරවරු 10 දක්වා 1968-69 මුදල් වර්ෂයේ දෙවන භාගය සඳහා පහත සඳහන් ගොඩනැගිලි උපකරණ සැපයීමේ ටෙන්ඩර්පත් භාරගනු ලැබේ :—

1. වියන ලද ජෝඩු පොල්අතු (අඩි 7 ක් දික්වූද අගල් 14 ක් පළල්වූද ජෝඩු පොල්අතු 1,000 ක මිල).
2. අලුහුණු බුසල් 1 (එකක්) (රා. 44 කට නොඅඩු බර තිබිය යුතුය.)
3. තම්බාපු හුණු බුසල් 1 (එකක්).
4. කළුගල් 6 × 9 කියුබ්වලින්.
5. කළුගල් 6 × 4 කියුබ්වලින්.
6. කළුගල් තලාපු 2″ කියුබ්වලින්.
7. කළුගල් තලාපු 1 1/2″ කියුබ්වලින්.
8. කළුගල් තලාපු 1″ කියුබ්වලින්.
9. කළුගල් තලාපු 3/4″ කියුබ්වලින්.
10. කළුගල් තලාපු 1/2″ කියුබ්වලින්.
11. පිළිස්සු ගඩොල් 1,000 (4 1/2″ × 2 3/4″—8 1/4″)
12. ගං වැලි කියුබ් ගනණින්.

2. පොල්අතු සහ හුණු සැපයීම සම්බන්ධයෙන් හැර අනිකුත් ද්‍රව්‍යයන් වෙනුවෙන් එක ව්‍යාපාරයක් සඳහා ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 50 ක් බැගින්ද පොල්අතු සහ හුණු වෙනුවෙන් එක් එක් දිස්ත්‍රික්කයක් වෙනුවෙන් රු. 50 ක් බැගින්ද තැන්පත්කර ලබාගත් රිසිට්පත් ටෙන්ඩර් අයදුම් ආකෘති ලබාගැනීමට ප්‍රථම මා වෙත ඉදිරිපත් කළයුතුය. ටෙන්ඩර් අයදුම් ආකෘති 1969 මාර්තු 12 වෙනි දින පස්වරු 4.30 දක්වා මගේ කායභීලයේදී නිකුත්කරනු ලැබේ.

4. සෑම ටෙන්ඩර් අයදුම්කරුවෙක්ම ඔහුගේ නම සහ ලිපිනය ඉතා පැහැදිළිව සඳහන් කළ යුතුය. හුණු සහ පොල්අතු වෙනුවෙන් දිස්ත්‍රික්ක වශයෙන් සහ අනිකුත් ද්‍රව්‍යයන් වෙනුවෙන් සෑම ව්‍යාපාරයකට පිටපත් දෙක බැගින්ද පිළියෙල කළ යුතුය. සියළුම ටෙන්ඩර් අයදුම්පත් ලියාපදිංචි කරන ලද තැපැලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. කවරයෙහි වම්පස උඩ කෙලවරහි " කොළඹ ඉඩම් සංවර්ධන කොට්ඨාශයට ගොඩනැගිලි උපකරණ සැපයීම සඳහා ටෙන්ඩර්පත් " යනුවෙන් ඉතා පැහැදිලිව සටහන් කල යුතුය.

කොළඹ ඉඩම් සංවර්ධන නිලධාරී,
කොළඹ ඉඩම් සංවර්ධන කායභීලය,
අංක 120, ඇල්ස්ටන් පෙදෙස,
කොළඹ 2.

නැතහොත් කොළඹ ඉඩම් සංවර්ධන නිලධාරීගේ කායභීලයෙහි ටෙන්ඩර් පෙට්ටියට පැමිණ දැමිය යුතුයි. 1969 මාර්තු මස 13 වෙනි දින පෙරවරු 10 ට ටෙන්ඩර් වැසීමෙන් පසුව ලැබෙන ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

5. සාර්ථකවූ ටෙන්ඩර්කරු ඒ බව දන්වීමෙන් සති දෙකක් ඇතුලත ද්‍රව්‍ය භාරදීමට හැකිවිය යුතුය. යමෙකුට එසේ කිරීමට නොහැකිවුවහොත් ඔහුගේ නම කොන්දේසි කඩ කළ කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට ඇතුලත් වන්නේය.

6. ටෙන්ඩර්කරුවන්හට අවශ්‍යනම් 69.3.13 දින පෙරවරු 10.15 ට ටෙන්ඩර් විවෘතකරනු ලබන අවස්ථාවේදී පෙනීසිටිය හැක.

7. ටෙන්ඩර් ගණනාවක් හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය හෝ ටෙන්ඩරයක කොටසක් භාරගැනීමේ අයිතිය හෝ විශේෂ විස්තරයකට අනුකූල නොවූ සැපයීම් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ඉඩම් සංවර්ධන නිලධාරී සතුය.

එම්. අයි. එම්. නාලීර්,
කොළඹ ඉඩම් සංවර්ධන නිලධාරී.

1969 ජනවාරි 21 වන දින,
කොළඹ 2 හි පිහිටි ඇල්ස්ටන් පෙදෙසේ
අංක 120 දරණ ස්ථානයෙහි කොළඹ
ඉඩම් සංවර්ධන කායභීලයේ දීය.

2–393—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

### මාතර දිස්ත්‍රික්කය තුළ (i) කොස්ගස් හේන පාර (බෝක්කු) (ii) අනපත්තුකන්ද පාර, (iii) දේවාලගම-මහමඩවල පාර 2 සැතපුම, (iv) බවේහේන පුස්සහේන ජලනල ක්‍රමය

රජයේ වැඩ, වාරිමාර්ග හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පහත දැක්වෙන පරිදි ලියාපදිංචිව ඇති, කොන්ත්‍රාත්කරුවන්ගෙන් සහ සමුපකාර කම්කරු සමිති, විවිධසේවා සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති වලින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. සියළු ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව එක කවරයක බහා සීල් තබා, කොළඹ, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති නමට එවිය යුතුයි.

3. ටෙන්ඩර්, ගාලු මුවදොර මහලේකම් කාර්යාලයේ 3 වැනි තට්ටුවේ අංක 357 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමිය යුතුයි. නොඑසේනම් ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

4. ටෙන්ඩර් පත්‍රය බහාලන ලියුම් කවරයේ මුදුනේ වම් කෙලවරෙහි "(දිස්ත්‍රික්කයේ නම හා වැඩයේ නම සඳහන් කරන්න) සඳහා වූ ටෙන්ඩර්" යයි ලියා 69. 3. 7. වැනිදා පස්වරු 2.30 ට පෙර ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත ලැබෙන සේ එවිය යුතුයි. එදින එම වේලාවේදීම ටෙන්ඩර් පත් විවෘත කරනවා ඇත. ටෙන්ඩර් කරුවන්ට ද එම වේලාවේදී පැමිණ සිටිය හැක.

5. 1969.3. 1 වැනි දින දවල් 12 දක්වා මාතර දිසාපති කාර්යාලයෙන් ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැක. නියමිත ෆෝර්මයේ ඉල්ලුම් නොකරන ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. ටෙන්ඩර්කරු විසින් එවන ටෙන්ඩර් පත්‍රයේ කරනු ලැබූ මැකීම් කවුකැම් හෝ පසුව වෙනස් කිරීම් ආදී සෑම ස්ථානයකම ඔහුගේ කෙටි අත්සන තැබිය යුතුයි.

ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර රුපියල් 50 ක් මාතර දිසාපති කාර්යාලයේ තැන්පත් කර ඒ වෙනුවෙන් ලත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි. ලියාපදිංචි කළ කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති යනාදිය මෙම මුදල් තැන්පත් කිරීමෙන් නිදහස්ය.

8. තමාගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලිපියකින් දැන්වීමක් ලත් පසු යම් අයෙක් ගිවිසුම්පත් අත්සන් කිරීමට හෝ ඇප තැබීමට හෝ දින 10 ක් ඇතුළත අපොහොසත් වුවහොත් ඔහු විසින් තැන්පත් කරන ලද මුදල රාජසන්තක කරනු ලැබේ.

9. ටෙන්ඩර් පිළිගත් බවට යැවෙන දැන්වීම ටෙන්ඩර්කාරයා විසින් දෙන ලද ලිපිනයට තැපෑලෙන් යවනු ලැබුවහොත් හෝ ලිපිනයෙන් අදහස් කරන ස්ථානයෙහි තබනු ලැබුවහොත් ඒ දැන්වීම ටෙන්ඩර් කාරයාට ලැබුණාක් මෙන් සලකනු ලැබේ. ගිවිසුම් පත අත්සන් කිරීමෙන් පසු අනිත් සියළුම තැන්පත් මුදල් ආපසු දෙනු ලැබේ.

10. තෝරාගත් ටෙන්ඩර්කරු නියම කරන ලද කාලසීමාවක් තුළ නිසි අන්දමට වැඩ කරන බවට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට පහක මුදලක් තැන්පත් කරන ලෙස මාතර දිසාපති විසින් දැනුම් දෙනු ඇත. ලියාපදිංචිවූ කම්කරු සමිති, විවිධ සේවා සමුපකාර සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති මෙම ඇප තැබී මෙන් නිදහස් ය.

11. ටෙන්ඩර්වලින් කොටසක් හෝ සියල්ලම ප්‍රශ්නකිරීමෙන් තොරව ප්‍රතික්ෂේප කිරීම හෝ ටෙන්ඩරයකින් කොටසක් භාරගැනීම මුළුමනින්ම රජය කෙරෙහි පවත්නේ ය.

12. ටෙන්ඩර් මණ්ඩලයේ අවසරය නො මැතිව කිසිම කොන්ත්‍රාත්තුවක් වෙන කෙනෙකුට පැවරීම හෝ එහි කොටසක් වෙන කෙනෙකුට කුලියට දීම හෝ නොකළ යුතුයි. කොන්ත්‍රාත්කාරයා වෙනුවට කරගෙන යාමට යම් කිසි පුද්ගලයෙකුට බලය දෙමින් කොන්ත්‍රාත්කාරයා විසින් දෙන ලද ඇටෝර්නි බලයක් පිලිගැනීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිවාසිකම් රජය කෙරෙහි පවත්නේ ය.

13. කොන්ත්‍රාත්කරු යටතේ සේවය කරන යම් කිසිවකුගේ සේවය සම්බන්ධයෙන් ප්‍රමාණවත් යයි හැඟී යන කරුණු උඩ මාතර දිසාපති විසින් ලියවිල්ලකින් විරුද්ධත්වය දැක්වූ විට, කොන්ත්‍රාත්කරු විසින් එවැනි අයගේ සේවය නතර කළ යුතුයි.

14. කොන්ත්‍රාත්කරු සහ ලංකාණ්ඩුව වෙනුවෙන් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තැනද, මෙම කොන්ත්‍රාත්තුවට අත්සන් කළ යුතුයි. ලංකාණ්ඩුව වෙනුවෙන් කොන්ත්‍රාත්තුවට අත්සන් කරන අයගේ නිල තත්වයට අනුව එවකට සහ ඉන් පසු මෙහි නිලයෙහි අත්සන් කරන අයද අයත් වේ.

15. මෙයට පෙර භාරගන්නා ලද කොන්ත්‍රාත් වැඩ කරගෙන යන අපේක්ෂකයින් කල් වේලා ඇතුව ඔවුන් දැනට කරගෙන යනු ලබන වැඩවල තත්වය දැක්වෙන, එම වැඩ භාරව සිටින පරිපාලක නිලධාරීන්ගෙන් ලබා ගන්නා ලද සහතික පත්‍ර ටෙන්ඩර් ඇප මුදල් තැන්පත් කොට ලබා ගන්නා ලද ලදුපත් සමග මාතර දිසාපති වෙත ඉදිරිපත් කළ යුතුයි.

16. යම් ටෙන්ඩර් පත්‍රයක් පිළිගැනීමේදී ඇපකරුවන් අවශ්‍ය වුවහොත් තෝරාගත් ටෙන්ඩර්කරු මෙම අවශ්‍යතාවය සපුරාලීමට සමත් විය යුතුයි.

17. රජයේ වෙනත් දෙපාර්තමේන්තුවලට අයත් කොන්ත්‍රාත් වැඩ කර තිබෙන කොන්ත්‍රාත්කරුවෙක් වෙතොත් සේවය කොට ඇති දෙපාර්තමේන්තුවේ නම සහ දිස්ත්‍රික්කය සඳහන් කළ යුතුයි.

18. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛණයේ නම් ඇතුළත් කොන්ත්‍රාත්කරුවන් ගෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

19. කොස්ගහහේන පාර බෝක්කු සඳහා හා බටේහේන පුස්සහේන ජලනල ක්‍රමය සඳහා රු. 20,000 කට හෝ ඊට වැඩිවද, දේවාලගම-මහමඩවල පාර 2 සැතපුම සඳහා රු. 50,000 කට නොඅඩුවද, අත පත්තුකන්ද පාර සඳහා රු. 60,000 කට නොඅඩුවද ලියාපදිංචිය අවශ්‍යය.

පී. ඩබ්ලිව්. සී. ද සිල්වා,
මාතර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1969. 3. 5 දින,
මාතර කච්චේරියේ දීය.

2–416—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

## ආහාර දෙපාර්තමේන්තුව

### ප්‍රයෝජනයට ගත නොහැකි ගෝනි

කොළඹ චාමස් ධාන්‍යාගාරයේ තිබෙන 27,039 ක් පමණ වූ ප්‍රයෝජනයට ගත නොහැකි ගෝනි මිලදී ගැනීම සඳහා ටෙන්ඩර්පත් 1969 පෙබරවාරි මස 21 වෙනි දින සිකුරාදා සවස 2.30 දක්වා අංක 330, යූනියන් පෙදෙසේ ආහාර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් භාරගනු ලැබේ.

රු. 300 ක් තැන්පත් කිරීමෙන් පසුව මෙම කාර්යාලයේ ලබාගත හැකි ෆෝර්මවල ටෙන්ඩර් පිළියෙල කළ යුතුය. ටෙන්ඩර් පිළිබඳ විස්තර වාර්තාවක් මෙම කාර්යාලයෙන් ඉල්ලුම් කළ විට ලබාගත හැකි වේ.

ආ. මතියාපරනම්,
ආහාර කොමසාරිස් වෙනුවට.

1969.2.5 දින,
කොළඹ, 330, යූනියන් පෙදෙසේ දීය.

2–382—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

රාත්තල් 1, 2, 3 සහ 5 යන ප්‍රමාණ හතරින් 'රුලං' ඇසිරීම සඳහා යෝග්‍ය එක් පාටකින් මුද්‍රණය කරන ලද ගේජ් 200යේ නල හැඩයෙන් සැපයිය යුතු පොලිතින් බෑග් 1,20,000 ක් සැපයීම සඳහා, කොළඹ 1, චැතැම් වීදියේ අංක 62 දරණ තැන අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969. 3. 7 දින අ. භා. 2.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

බෑග්වල මුද්‍රණය කළයුතු චිත්‍රය අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේදී පරීක්ෂා කර බැලීමට පිළිවන.

කොළඹ 1, චැතැම් වීදියේ අංක 62 දරණ තැන අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රුපියල් 100 ක් බැඳ ලබා ගන්නා කුවිතාන්සිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ පසු 1969 මාර්තු මස 7 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැක. ටෙන්ඩර් ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි.

වැඩි විස්තර අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබාගැනීමට පිළිවන.

අ. වි. ර. පෙරේරා,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1969. 2. 7 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව.

2–413—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ, ආයතනයන්ට 1969.4.1 සිට 1969.9.30 දින දක්වා ගවමස් සැපයීම සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත්, කොළඹ, 1, චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්, 1969. 3. 7 දින අ. භා. 2.30 වන තුරු භාර ගනු ලැබේ. කොළඹ 1 චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 200ක් බැඳ ලබා ගන්නා කුවිතාන්සිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ විට, 1969. 3. 7 දින දවල් 12හ දක්වා ටෙන්ඩර් ෆෝමර් ලබා ගත හැක. ටෙන්ඩර් ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි.

වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැන ගැනීමට පුළුවන.

ඇම්. ඊ. අල්විස්,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1969. 2. 6. දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේදී ය.

2–381—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ, ආයතනයන්ට 1969. 4. 1 සිට 1969. 9. 30 දින දක්වා කුකුල් මස් සැපයීම සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත්, කොළඹ 1, චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්, 1969. 3. 7 දින අ. භා. 2.30 වන තුරු භාර ගනු ලැබේ. කොළඹ 1 චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 200 ක් බැඳ ලබා ගන්නා කුවිතාන්සිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ විට, 1969. 3. 7 දින දවල් 12 දක්වා ටෙන්ඩර් ෆෝර්ම ලබා ගත හැක. ටෙන්ඩර් ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි.

වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැන ගැනීමට පුළුවන.

ඇම්. ඊ. අල්විස්,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1969. 2. 6 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේදී ය.

2–380—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

1969. 4. 1 සිට 1969. 12. 31 දක්වා කාලය තුළ අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ මූළුතැන්ගෙය, බේකරිය හා ට්‍රිපොලි වෙළඳ සැලෙහි එකතුවන සත්වාහාර සඳහා සුදුසු ද්‍රව්‍ය මිළදී ඉවත්කරගෙන යාම සඳහා මිළ ගණන් කොළඹ 1, චැතැම් වීදියේ අංක 62 දරණ තැන අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969 මාර්තු මස 7 දින අ. භා. 2.30 දක්වා භාරගනු ලැබේ.

මිළ ගණන් ෆෝර්ම 1969. 3. 7 දින දවල් 12 දක්වා කොළඹ 1, චැතැම් වීදියේ අංක 62 දරණ තැන අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක. මිළ ගණන් ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුය.

වැඩි විස්තර අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ඇම්. ඇස්. විජේරත්න,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1969. 2. 6 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව.

2–412—69.2.14 දින අංක 14,841-දරන ගැසට් පත්‍රය

---

## පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

### මිහින්තලේ මහාසෑයට ලෝකඩ කොතක් සැපයීමේ සහ ගෙනත් භාරදීමේ ටෙන්ඩර්

දෙපාර්තමේන්තු සැලැස්ම අංක 16 අනුව මිහින්තලේ මහාසෑයට ලෝකඩ කොතක් සැපයීමේ සහ ගෙනත් භාරදීමේ ටෙන්ඩර් 1969 මාර්තු 5 වැනි දින පස්වරු 3 වන තෙක් මෙම දෙපාර්තමේන්තුවේදී භාරගනු ලැබේ.

වැඩබලන පුරාවිද්‍යා කොමසාරිස්ගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල දෙවැනි පිටපතක් සහිත ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවීමෙන් 1969 මාර්තු 4 වැනි දින අඟහරුවාදා පස්වරු 3 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත් ලබාගත හැක. මෙකී මුදල මෙම කාර්යාලයේදී හෝ ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කොට කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් නැතහොත් වැඩ බලන පුරාවිද්‍යා කොමසාරිස්ගේ නමට මුදල් ඇනවුමක්/තැපැල් ඇනවුමක් එවීමෙන් ටෙන්ඩර් පත් ලබාගත හැකිවේ.

වැඩිමනත් විස්තර වැඩබලන පුරාවිද්‍යාකොමසාරිස්ගෙන් ලබාගත හැකිවේ.

ආර්. එච්. ද සිල්වා,
වැඩබලන පුරාවිද්‍යා කොමසාරිස්.

අංක : එස්.එස්/89
1969 පෙබරවාරි 3 වැනි දින,
කොළඹ 7, සර් මාර්කස් ප්‍රනාන්දු මාවත,
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේදීය.

2–313—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### බම්බලපිටිය නිවාස ක්‍රමයේ 56" වටය ඇති විදුලි පංකා හසුරුවන නැවත එතීම සහ අළුත්වැඩියා කිරීම

බම්බලපිටිය නිවාස ක්‍රමයේ 56" වටය ඇති විදුලි පංකා හසුරුවන නැවත එතීම සහ අළුත්වැඩියා කිරීම සඳහා ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මංඩලයේ සභාපති විසින් 1969 මාර්තු 7 වැනිදා උදේ 10 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවාක් මෙන්ම වැඩි විස්තර ද ඔහුගෙන් ලබාගත හැක.

රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන කොන්ත්‍රාත්කරුවන්ට 1969 පෙබරවාරි 27 වැනි දා දවල් 12 වන තුරු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

ඞී. රාජේන්ද්‍රා,
ජාතික නිවාස කොමසාරිස්.

1969 ජනවාරි 24 දින,
ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැ. පෙ. අංක 544,
කොළඹ 2.

2–450—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ—ගාල්ල කොට්ඨාශය

### සේවයට අයෝග්‍ය මෝටර් වාහන සඳහා ටෙන්ඩර් කැඳවීම

(1) ගාල්ල සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයට අයත් සේවයට අයෝග්‍ය 33 ශ්‍රී 2275 දරණ බෙඩ්ෆෝඩ් ගිලන් රථය මිලට ගැනීම සඳහා ටෙන්ඩර් පත් 1969 මාර්තු 19 වෙනි දින දවල් 12 වන තුරු ගාල්ල සෞඛ්‍ය සේවා අධිකාරි වන මා විසින් භාරගනු ලැබේ.

2. ඉහත කී ගිලන් රථය දැනට කොළඹ නාරාහේන්පිට මැලේරියා නාශක ව්‍යාපාර අධිකාරිගේ ගරාජයේ නවතා ඇත.

3. මැලේරියා නාශක ව්‍යාපාරයේ අධිකාරිගේ අවසරය ඇතිව, ටෙන්ඩර්කරුවන්ට මෙම රථය පරීක්ෂා කර බැලීමට හැක.

4. රු. 4,500 කට වැඩියෙන් මිළ ගණන් ඉදිරිපත් කරන ටෙන්ඩර් පත් පමණක් භාර ගන්නා අතර, අනික් ටෙන්ඩර් පත් පිටුදකින බව මෙයින් නිවේදනය කරමි.

5. ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කල යුතු අතර, රු. 100ක් මුදලක් කච්චේරියක තැන්පත් කර, ඒ සඳහා ලබා ගන්නා ලද රිසිට් පත මෙම කාර්යාලයේ මුදල් අංශයට ඉදිරිපත් කිරීමෙන් අවශ්‍ය ටෙන්ඩර් පත 1969 මාර්තු මස 2 දින පෙ. ව. 10 තෙක් ලබාගත හැකිය.

6. සීල් තබන ලද ටෙන්ඩර් පත් ගාල්ල සෞඛ්‍ය සේවා අධිකාරිගේ ලිපිනයට ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස උඩ කෙලවරේ "සේවයට අයෝග්‍ය මෝටර් රථ මිළදී ගැනීම" යන්න සඳහන් කළ යුතුවාක් මෙන්ම, පහළ කෙළවරේ ටෙන්ඩර් කරුගේ ලිපිනය පැහැදිලි ලෙස සඳහන් කල යුතුය.

7. ටෙන්ඩර් භාරගැනීමේ නියමිත වේලාවෙන් පසුව ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන් පැමිණ සිටිය යුතුය. ඉල්ලුම් කරුවන්ගේ නම් සහ ඔවුන් ඉදිරිපත් කර ඇති මිළ ගණන් ඔවුන් ඉදිරියේ ප්‍රකාශ කරනු ලැබේ.

8. ටෙන්ඩර් විවෘත කිරීමෙන් දින 3ක් ඇතුලත සම්පූර්ණ මුදල් ගෙවා ගිලන් රථය ගෙනයා යුතුය. එසේ නොකළහොත් ඔහු විසින් තැන්පත් කර ඇති ඇප මුදල් රාජසන්තක කරනු ලැබේ.

9. ටෙන්ඩර්පත් සියල්ලම හෝ කොටසක් භාරගැනීම හෝ සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කිරීම සඳහා බලතල ගාල්ල සෞඛ්‍ය සේවා අධිකාරි වන මා වෙත පවරා ගනිමි.

1969. 2. 3, ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි.
සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී ය.

2–389—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—කුරුණෑගල කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1969 මාර්තු 1 වෙනිදා සිට 1969 දෙසැම්බර් 31 වෙනිදා දක්වා (දින දෙකම ඇතුළත්) කාලය තුල මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකික යන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනුලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කුරුණෑගල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්‍යාලයේදී සෞඛ්‍යසේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ 2 වන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුයි. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සමාගම්වල හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්‍යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්‍යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නො ලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුය. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත් කල්වෙලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට සැලකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුය. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහාපෑමට කරුණු ඉදිරිපත් කරණ ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැනගැනීමට, මේ සමග ඇති උපලේඛනයෙහි 5 වෙනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා '' සෞඛ්‍ය සේවා අධිකාරි, කුරුණෑගල '' කියා එවිය යුතුයි. සීල් තබනලද ටෙන්ඩර්පත් බහා එවන කවරයෙහි වම්පස උඩකෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිළිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්‍යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය යුතුය. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරි/ලේකම්තැනට භාර දෙන්නේ නම් ටෙන්ඩර් පත්‍රිකා ලැබුණ බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 4 වෙනි තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්‍යාලයේ දී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වෙලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිල ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනක මා විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයකුගේ අනුමැතිය ඇතුව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර්පත් තෝරා ගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ '' බී '' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තුවන මිල ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයේ 'සී'' උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිල ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිල ගණන හෝ එවකට වෙළඳපොළේ පවතින මිල ගණන හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිලක් පවතී නම් එම පාලන මිල ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. ටෙන්ඩර්කරුවන්, තමන් ඉදිරිපත් කරන මිල ගණන් ටෙන්ඩර් බාරගැනීම අවසන් වන දවසේ සිට හය මාසයක් දක්වා පිළිගත හැකි සේ තබාගත යුතුයි. ඉදිරිපත් කළ ටෙන්ඩර් පත්‍ර පසුව අස්කළ හැකි නොවේ.

10. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිල ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කරනැතිනම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

11. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩරකරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

12. **බඩුබාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩුබාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

13. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුට රෝගීන් සහ සේවකයින් විසින් භාරදී ඇති කූපන් වෙනුවෙන් සහන මිල යටතේ හෝ නොමිලයේ හෝ 1966.12.19 දින සිට පවතින ක්‍රමයට අවශ්‍ය සහල් ආහාර දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට ආයතන භාර ප්‍රධානියා විසින් බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

14. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ද ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුය.

ඇල්. ඇන්. රාජේන්ද්‍රා,
කුරුණෑගල සෞඛ්‍ය සේවා අධිකාරි වෙනුවට.

1969 පෙබරවාරි 6 වැනි දින,
සෞඛ්‍ය සේවා අධිකාරි කාර්‍යාලය,
කුරුණෑගල.

### උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | (3) ඇප මුදල රු. | (4) ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය හා වේලාව | ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයන්ට — මාලු | මස් | කරවල | එළවලු | නොගෙවන රෝගීන්ට — මාලු | මස් | කරවල | එළවලු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. බිංගිරිය ගැ. රෝ. | 100 ... | 400 | 1969 පෙබරවාරි 27 වෙනි දින පෙ. ව. 10 ට | 200 ... | 200 ... | 200 ... | 800 ... | 400 ... | 400 ... | 400 ... | 1,600 |
| 2. කොස්හේන මා. නි. | 100 ... | 300 | | 100 ... | 100 ... | 100 ... | 400 ... | 50 ... | 50 ... | 50 ... | 200 |
| 3. සඳලංකාව මා. නි. | 100 ... | 300 | | 100 ... | 100 ... | 100 ... | 400 ... | 50 ... | 50 ... | 50 ... | 200 |

2–386—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 මාර්තු මස 7 වැනි දින පෙරවරු 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර්පත්‍ර අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

| | පාඨශාලාවේ නම | | වැඩෙහි ස්වභාවය |
|---|---|---|---|
| 1. | කු/මහව මධ්‍ය මහා විද්‍යාලය | ... | රැස්වීම් ශාලාව |

**සංලක්ෂ්‍යය.**—කු= කුරුණෑගල දිස්ත්‍රික්කය

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්‍යාලයේ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් අංක 1 සඳහා රු. 80,000 හෝ ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 මාර්තු මස 6 වැනි දින බ්‍රහස්පතින්දා දවල් 12 දක්වා ටෙන්ඩර්පත්‍ර නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාර ගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාර දීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ ගෙන් ලබාගත හැක. මුදල් භාර දීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලිපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලට ද ටෙන්ඩර්පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර්පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර්පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදිය ද බලා ගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපැලෙන් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපැලෙන් නො එවන ටෙන්ඩර්පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ කාර්යාල සහකාර වෙත භාර දිය යුතුය. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාර ගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබා ගත යුතුයි.

5. 1969 මාර්තු මස 7 වැනි දා පෙරවරු 10.30 ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්‍යාලයේ දී ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර්පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර්පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගත වන තුරු තමන් සඳහන් කරන ලද මිල ගණන් වලට එම් වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තරයක් වේතොත් කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්‍යාලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්‍යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර්පත්‍ර නිකුත් කිරීමේ දී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

සී. එස්. කළුගම්පිටිය,
ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969 ජනවාරි මස 29 දින,
කුරුණෑගල අධ්‍යාපන කාර්‍යාලයේ දීය.

**2–337—69.2.14** දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 මාර්තු මස 7 වැනි සිකුරාදා පෙ.ව. 10.30 වනතෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර, නුවරඑළිය අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

| | පාඨශාලාවේ නම | | වැඩයේ සවභාවය |
|---|---|---|---|
| 1. | නු/ ශ්‍රී පරාක්‍රම මහා වි. | ... | විද්‍යාගාරය |
| 2. | නු/තෙරිපැහැ මහ වි. | ... | හස්ත කර්මාන්ත ශාලාව |
| 3. | බ/ගම්පහමස්පැන්න මහා වි. | ... | එම |
| 4. | බ/දියබෝකඳුර මහ වි. | ... | පාසැල් ගොඩනැගිල්ල |
| 5. | මහ/ශාන්ත මේරිස් දෙ. වි. | ... | එම |
| 6. | මහ/දික්ඔය වි. ... | ... | එම |
| 7. | නු/ගාමිණී මහා වි.... | ... | විද්‍යාගාරය |
| 8. | නු/ගහපලාත මහා වි. | ... | එම |
| 9. | නු/තලවාකැලේ සුමන මහා වි. | ... | ගුරු නිවාසය |
| 10. | නු/ගහපලාත මහා වි. | ... | එම |
| 11. | නු/තෙරිපැහැ මහා වි. | ... | එම |
| 12. | නු/මල්දෙනිය මහා වි. | ... | පාසැල් ගොඩනැගිල්ල |
| 13. | නු/නිල්දන්ඩාහින්න මහා වි. | ... | එම |
| 14. | නු/නිල්දන්ඩාහින්න මහා වි. | ... | ගුරු නිවාසය |
| 15. | නු/ශුද්ධ ත්‍රිත්ව මහා වි. | ... | එම |
| 16. | මහ/ලක්ෂපාන මහා වි. | ... | හස්ත කර්මාන්ත ශාලාව |
| 17. | නු/ගාමිණී මහා වි.... | ... | කෘෂිකර්ම විද්‍යාගාරය |
| 18. | බ/වැලිමඩ මධ්‍ය ම. වි. | ... | එම |
| 19. | නු/හැඳුනු වැව ම. ම. වි. | ... | වාණිජ විද්‍යා ගොඩනැගිල්ල |
| 20. | නු/ලිඳුල ම. වි. ... | ... | පාසැල් ගොඩනැගිල්ල |
| 21. | නු/වටද්දර වි. ... | ... | එම |
| 22. | නු/පුණ්ඩලුඔය දෙමල ම. වි. | ... | එම |
| 23. | නු/මා පිල්ල වි. ... | ... | එම |
| 24. | නු/නා වෙල වැලිමඩ වි. | ... | එම |
| 25. | බ/මා දෝවිට වි. ... | ... | එම |
| 26. | බ/පන්වැව වි. ... | ... | එම |
| 27. | බ/බුස්දුල්ල වි. ... | ... | එම |
| 28. | බ/උඩපේරුව වි. ... | ... | එම |
| 29. | බ/මැදිපොකුණ වි. | ... | එම |
| 30. | බ/ගුරුතලාව මුස්ලිම් වි. | ... | එම |
| 31. | නු/ ශ්‍රී පියතිස්ස වි. | ... | එම |
| 32. | නු/බෝපත්තලාව ... | ... | ගුරු නිවාස |
| 33. | නු/සෙනරත්පුර වි. | ... | එම |
| 34. | බ/හිඳුරුගමුව මලියදේව වි. | ... | එම |
| 35. | බ/එරබැද්ද වි. ... | ... | එම |
| 36. | බ/පන්වැව වි. | | ගුරු නිවාස |
| 37. | බ/දියබෝකඳුර වි. | | එම |
| 38. | කෝල් බෲක් වි. | | එම |
| 39. | නු/ධර්මපාල වි. | | එම |
| 40. | නු/හක්ගල වි. | | එම |
| 41. | නු/ගාමිණී ම. වි. | | ගුරු නිවාසයේ ඉතිරි වැඩ |
| 42. | මහ/ශාන්ත ජෝන් බොස්කො ම. වි. | | වහල අළුත් වැඩියා ආදිය |
| 43. | බ/ගම්පහමස්පැන්න ම. වි. | | පාසැල් ගොඩනැගිල්ල |
| 44. | නු/පදියපැලැල්ල ම. වි. | | පාසැල් ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ |
| 45. | මහ/මොරහේනගම වි. | | අළුත් වැඩියාව |
| 46. | නු/මීපිලිමාන වි. | | වහල අළුත් වැඩියා කිරීම |
| 47. | ම/කලුගල මහ වි. | | එම |
| 48. | නු/පදියපැලැල්ල (ප්‍රාථ.) වි. | | එම |
| 49. | නු/ ශ්‍රී පරාක්‍රම (මැදකුඹුර) මහ වි. | | ගුරු නිවාසයේ ඉතිරි වැඩ |
| 50. | මහ/හැබබැකන්ද වි. | | වීදුරු ජනේල |
| 51. | මහ/දෙහිගස්තැන්න වි. | | පැති බැම්ම |
| 52. | බ/ගම්පහ මස්පැන්න මහ වි. | | විද්‍යාගාරයේ ඉතිරි වැඩ |
| 53. | නු/නිල්දන්ඩහින්න (ප්‍රාථ.) වි. | | මාණ්ඩලික අධ්‍යාපන නිලධාරී කාර්යාලය |
| 54. | බ/වැලිමඩ (ප්‍රාථ.) වි. | | එම |
| 55. | බ/පන්නලවෙල වි. | | එම |
| 56. | නු/රත්නායක පතන වි. | | ජලපහසුව සැපයීම |
| 57. | නු/කොටගේ වි. | | එම |
| 58. | නු/ ශ්‍රී මලියදේව (විජේබාහු කන්ද) වි. | | එම |
| 59. | නු/කීනගොල්ල වි. | | එම |
| 60. | නු/වලුගම වි. | | එම |
| 61. | නු/මඩුල්ල වි. | | එම |
| 62. | නු/සෙනරත්පුර වි. | | එම |
| 63. | බ/ගම්බැද්ද වි. | | ලිඳ |
| 64. | නු/වටගොඩ වි. | | එම |
| 65. | බ/දඹවින්න වි. | | අළුත්වැඩියාව |
| 66. | නු/කඳපොල මහින්ද මහ වි. | | ගුරු නිවාස අළුත්වැඩියාව |
| 67. | මහ/සමන්එලිය මහ වි. | | ගුරු නිවාස සිලිම |
| 68. | නු/අරක්ගම වි. | | වැසිකිලි 2 |
| 69. | බ/සපුගොල්ල වි. | | වැසිකිළි 3 |
| 70. | නු/ශුද්ධ ත්‍රිත්ව මහ වි. | | වැසිකිලි 2 |
| 71. | නු/නිල්දන්ඩාහින්න ප්‍රා. වි. | | වැසිකිලි 2 |
| 72. | බ/මාදෝවිට වි. | | වැසිකිලි 1 |
| 73. | නු/දෙනිකේ වි. | | වැසිකිලි 3 |

| | | |
|---|---|---|
| 74. | නු/මානකොල වි. | වැසිකිලි 2 |
| 75. | නු/උඩගලඋඩ වි. | වැසිකිලි 2 |
| 76. | මහ/මාදෙනිය වි. | වැසිකිලි 2 |
| 77. | නු/මතුරට වි. | වැසිකිලි 3 |
| 78. | බ/උඩපේරුව වි. | වැසිකිලි 3 |
| 79. | නු/මීපිලිමාන වි. | වැසිකිලි 2 |
| 80. | බ/ගම්පහ මස්පන්න මහ වි. | වැසිකිලි 3 |
| 81. | නු/ඔකඳගල වි. | වැසිකිලි 1 |
| 82. | නු/තවලම්පොල වි. | වැසිකිලි 2 |
| 83. | නු/බලගොල්ල වි. | වැසිකිලි 2 |
| 84. | බ/කරගහඋල්පොත වි. | වැසිකිලි 2 |
| 85. | බ/බදූපොල වි. | වැසිකිලි 1 |
| 86. | බ/බොරගස්කෙටිය වි. | වැසිකිලි 2 |
| 87. | මම/ශාන්ත ජෝන් බොස්කෝ වි. | වැසිකිලි 1 |

අංක 1.—සංලක්ෂායය

නු=නුවරඑළිය දිස්ත්‍රික්කය
බ=බදුල්ල දිස්ත්‍රික්කය
මහ=මහනුවර දිස්ත්‍රික්කය.

අංක 2.—අවශ්‍ය ලියාපදිංචි කිරීම

අංක 1 සිට 6 දක්වා රු. 35,000 ට හෝ ඊට වැඩි
අංක 7 සිට 12 දක්වා රු. 30,000 ට හෝ ඊට වැඩි
අංක 13 සිට 16 දක්වා රු. 25,000 ට හෝ ඊට වැඩි
අංක 17 සිට 42 දක්වා රු. 20,000 ට හෝ ඊට වැඩි
අංක 43 සිට 45 දක්වා රු. 15,000 ට හෝ ඊට වැඩි
අංක 46 සිට 52 දක්වා රු. 10,000 ට හෝ ඊට වැඩි
අංක 53 සිට 87 දක්වා රු. 5,000 ට හෝ ඊට වැඩි.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය නුවරඑළියේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන්, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ගොඩනැගිලි වැඩ සඳහා ඉහත අංක 2 හි සඳහන් ගණනට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවනට 1969 මාර්තු මස 6 වැනි බ්‍රහස්පතින්දා දහවල් 12.00 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙති). චැක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සිය කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ නුවරඑළියේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සිය නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක්ය.

3. දෙවැනි අංකයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවී ඇති අනුමත සමිතිවලට ද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි අංකයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. පූර්වෝක්ත 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි නුවරඑළියේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුය. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලාගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර් පත් ලියාපදිංචි කළ තැපැලෙන්, නුවරඑලියේ අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපැලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් පුද්ගලිකව, නුවරඑළියේ අධ්‍යාපන කාර්යාලයේ කායර්ාල සහකාර/ප්‍රධාන ලිපිකාර වෙත භාරදිය යුතුය. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබා ගත යුතුය.

5. 1969 මාර්තු මස 7 වැනි සිකුරාදා පෙ.ව. 10.30 ට නුවරඑළියේ අධ්‍යාපන කායර්ාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් කරුවනට ටෙන්ඩර් පත්විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් පත් විවෘතකරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවනගේ නම් හා මිළ ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවන තුරු තමන් සඳහන් කරන ලද මිළ ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර් කරුවන් කැමැති විය යුතුය.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් නුවරඑළියේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කායර්ාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත් කරුවන්ගේ ලියාපදිංචි කිරීම අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සළකනු ලැබේ.

පී. ඊ. ජී. මැන්දිස්,
නුවරඑළිය ප්‍රදේශයේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969 පෙබරවාරි මස 6 වැනි දින,
නුවරඑළියේ අධ්‍යාපන කාර්යාලයේ දී.

2–401—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

## මීරිගම රජයේ මහළු නිවාසය

### දර ප්‍රවාහණය පිළිබඳ කොන්ත්‍රාත් තුව

1969 මාර්තු මස 1 වැනි දින සිට 1969 සැප්තැම්බර් 30 දක්වා මීරිගම රජයේ මහළු නිවාසයට දර ප්‍රවාහණය කිරීම සඳහා ටෙන්ඩර පත් මින් කැඳවනු ලැබේ. මේ ගැන වැඩි විස්තර මීරිගම රජයේ මහළු නිවාසයේ අධිකාරී තැනගෙන් හෝ මෙම කාර්යාලයෙන් ලබා ගත හැක.

2. ටැන්ඩරය ඇතුලත් ලියුම් කවරයේ වම් පස උඩ කෙලවරෙහි "1968/69 වර්ෂයේදී මීරිගම රජයේ මහළු නිවාසයට දර ප්‍රවාහනය සඳහා ටෙන්ඩරය" යනු ලියා සීල් තබා රෙජිස්ටර් තැපැල් මාගීයෙන් කොළඹ ගාලු මුවදොර, බාලදක්ෂ මාවතේ සමාජ සේවා අධ්‍යක්ෂ වෙත 1969 පෙබරවාරි 26 වනදා දහවල් 12 ට ප්‍රථමයෙන් එවිය යුතුය. ටෙන්ඩර්කරුවනට කැමති නම් ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ ඇති ටෙන්ඩර පෙට්ටියට දැමිය හැකිය.

3. 1969 පෙබරවාරි 26 වැනි දින පස්වරු 2.30 ට ටෙන්ඩර පත්‍ර විවෘත කරනු ඇත. ඒ වේලාවේදී ටෙන්ඩර්කරුවනට යථෝක්ත ස්ථානයට පැමිණ පෙනී සිටිය හැකිය.

4. මෙම කාර්යාලයෙන් හෝ මීරිගම රජයේ මහළු නිවාසයේ අධිකාරී තැනගෙන් හෝ ලබා ගන්නා ෆෝර්මවල ටෙන්ඩර ඉදිරිපත් කළ යුතුය. ටැන්ඩර් ෆෝර්ම ලබා ගන්නට පැමිණි විට අවශ්‍ය නම් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි ටෙන්ඩර්කරුවන්ට තේරුම් කර දෙනු ඇත.

5. ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කිරීමට පෙර රු. 10 ක මුදලක් ටැන්ඩර් භාර ගන්නා නිලධාරි වෙත තැන්පත් කළ යුතුය. මේ මුදල පිළිගත් ටැන්ඩරය හිමි අය විසින් තැන්පත් කළ යුතු ඇප මුදලේ කොටසක් වශයෙන් සලකනු ඇත. පොරොන්දුවට බැඳී වැඩ අරඹන්නට මත්තෙන්, පිළිගත් ටෙන්ඩරය හිමි අය විසින් තැන්පත් කළ යුතු ඇප මුදලේ ඉතිරි කොටස වශයෙන් තවත් රු. 90 ක මුදලක් තැන්පත් කළ යුතුවේ. ප්‍රතික්ෂේප කරනු ලැබූ ටෙන්ඩර් කරුවන්ගේ ඇප මුදල් ආපසු ගෙවනු ලැබේ.

6. ටැන්ඩර්කරුවන් විසින් නියමිත ටැන්ඩර පත්‍ර සෑම අයුරින්ම සම්පූර්ණව පිළියෙල කිරීමට වග බලා ගත යුතුවෙයි. නියමිත අන්දමට පිළියෙල කර නොමැති ටෙන්ඩර පත් ප්‍රතික්ෂේප කිරීමට සමාජ සේවා අධ්‍යක්ෂ තැනට බලය තිබේ.

7. යම් ටැන්ඩර්කරුවකුගේ ටැන්ඩරය භාරගත් බවට ඔහුට දැන්වීමෙන් පසු ඔහු විසින් කොන්ත්‍රාත්තුවට බැඳීම ප්‍රතික්ෂේප කළහොත්, නැතහොත් භාර ගැනීමෙන් පසු එය සෑහැර හැරියොත් හෝ අවශ්‍ය අවස්ථාවේදී ඇප මුදල තැන්පත් නොකළහොත් ඔහුගේ ටැන්ඩර් ඇප මුදල රාජසන්තක කර ටෙන්ඩරය අවලංගු කරනු ලැබේ.

8. යම් ටැන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර කිසිම විරුද්ධවීමකට ඉඩ නොමැතිව ප්‍රතික්ෂේප කරන්නටත්, අවුරුද්දකට නොවැඩි ඕනෑම කාලසීමාවකට යම් ටැන්ඩරයක් පිළිගන්නටත් ආණ්ඩුවට බලය තබා ගනු ලැබේ.

සී. නිච්කුණානන්තන්,
සමාජ සේවා අධ්‍යක්ෂ වෙනුවට.

සමාජ සේවා දෙපාර්තමේන්තුව,
බාලදක්ෂ මාවත, ගාලුමුවදොර,
කොළඹ 3,
1969 ජනවාරි 30 දින දීය.

2–417—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 මාර්තු මස 7 වෙනි දින ප. ව. 2.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

| පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| 1. අ/නිකවැව අනුර මහා විද්‍යාලය | විද්‍යා රසායනාගාරයක් තැනීම. |
| 2. අ/අනුරාධපුර කාන්තා ගුරු විද්‍යාලය ... | ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය |
| 3. අ/මකුලෑව විද්‍යාලය ... | ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ සම්පූර්ණ කිරීම. |
| 4. අ/හොරොව්පොතාන මහා විද්‍යාලය ... | ක්‍රීඩා භූමියක් තැනීම. |
| 5. අ/කහටගස්දිගිලිය මහා විද්‍යාලය ... | ක්‍රීඩා භූමියක් තැනීම. |
| 6. අ/ගල්කුලම මහා විද්‍යාලය ... | මාණ්ඩලික අධ්‍යාපන නිලධාරීගේ කාර්යාලයේ වැඩ සම්පූර්ණ කිරීම. |

**සංලක්ෂ්‍යය.**—අ=අනුරාධපුර දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ හෝ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය අනුරාධපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන්, ඉහත අංක 1 සඳහා රු. 30,000 ට හෝ ඊට වැඩි ගණනකටද, අංක 2 හා 3 සඳහා රු. 10,000 හෝ ඊට වැඩි ගණනකටද, අංක 4 සිට 6 සඳහා රු. 5,000 හෝ ඊට වැඩි ගණනකටද අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාතීමේන්තුවේ හෝ වාරිමාගී දෙපාතීමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 මාර්තු 6 වැනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. (වාරිමාගී දෙපාතීමේන්තුවේ රු. 15,000කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්.) චැක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාර ගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ අනුරාධපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණි.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාතීමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලට ද මේ වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය ය. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන්, මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වෙනි හා 3 වෙනි ඡේදවල සඳහන් පරිදි අනුරාධපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගතහැකි අතර සැලැස්ම ආදියද බලාගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් පුද්ගලිකව අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර වෙත භාර දිය යුතුයි. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1969 මාර්තු මස 7 වැනිදා ප. ව. 2.30 ට අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති 6 ක් ගත වන තුරු තමන් සඳහන් කරන ලද මිල ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුයි.

7. වෙනත් අවශ්‍ය විස්තරයක් වෙතොත් අනුරාධපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂාකර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 1966. 9. 30 දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන් ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

එල්. බී. ගුණසේකර,
ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ,
අනුරාධපුර.

1969 පෙබරවාරි 6 වැනිදා,
අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයේදීය.

2–405—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1969 මාර්තු මස 7 වැනි සිකුරාදා පෙ. ව. 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| 1. කො/මරදාන ශ්‍රී සංඝරාජ මධ්‍ය— මහා විද්‍යාලය | දෙමහල් ගොඩනැගිල්ලක් තැනීම |
| 2. කො/කොල්ලුපිටිය මහනාම— විද්‍යාලය | දෙමහල් ගොඩනැගිල්ල සම්පූර්ණ කිරීම |

**සංලක්ෂ්‍යය.** කො/කොළඹ දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ හෝ කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයේ හෝ රු. 100ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් අංක 1 රු. 1,20,000, අංක 2 රු. 90,000 හා ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාගී දෙපාතීමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1969 මාර්තු මස 6 වැනි දින පෙ. ව. 10.30 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. චැක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාතීමේන්තුවේ හෝ වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදිය ද බලාගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපෑලෙන් කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් නොඑවන පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ කාර්යාල සහකාර/ප්‍රධාන ලිපිකාර වෙත භාරදිය යුතුයි. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1969 මාර්තු මස 7 වැනි සිකුරාද පෙ.ව. 10.30 ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයයේ දී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන් ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති 6 ක් ගත වන තුරු තමන් සඳහන් කරන ලද මිල ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ කාර්යාලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 1966. 9. 30 දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන් ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

වී. ජී. බී. මූණසිංහ,
අධ්‍යාපනාධ්‍යක්ෂ/කොළඹ ප්‍රදේශය.

1969. 2. 7,
කොළඹ 7, ග්‍රීන්පාත්,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී.

2–399—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

## පරන්තන් රසායන ද්‍රව්‍ය සංයුක්ත මණ්ඩලය

### ටැන්ඩර් දැන්වීම

මෙම සංයුක්ත මණ්ඩලයට එවන බඩු වරායෙන් ඉවත් කිරීම, පැටවීම සහ බෑම සහ (ගෙනියෑම) සඳහා ටැන්ඩර් කැඳවනු ලැබේ. ටැන්ඩර් භාර ගැනීම අවසන් වන්නේ 1969 මාර්තු 8 වෙනි සෙනසුරාදා පෙරවරු 9.30සි. සම්පූර්ණ විස්තර කොළඹ 3, අබ්දුල් කපූර් මාවතේ අංක 21 දරණ ස්ථානයේ පිහිටි සංයුක්ත මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයෙන් ලබාගත හැක.

සභාපති.

පරන්තන් රසායන ද්‍රව්‍ය සංයුක්ත මණ්ඩලය,
තැපැල් පෙට්ටි අංක 1489,
21, අබ්දුල් කපූර් මාවත,
කොළඹ 3.

...

2–357—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

## රත්නපුර කච්චේරිය

### රත්නපුර පොලිස් ස්ථානයේ ගංවතුර සහනාධාර කටයුතුවලට යාන්ත්‍රික බෝට්ටු තබාගැනීම සඳහා ඇන්ජින් කාමරයක් සහිත මඩුවක් සෑදීම

රත්නපුර පොලිස් ස්ථානය අසල යාන්ත්‍රික බෝට්ටු තබා ගැනීමට මඩුවක් සහිත ඇන්ජින් කාමරයක් සෑදීම සඳහා 1969 මාර්තු මස 14 වැනි දා පස්වරු 2 වනතෙක් රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති තැන විසින් ටැන්ඩර්පත් භාරගනු ලැබේ.

2. රජයේ දෙපාර්තමේන්තුවල රු. 15,000 ක් හෝ ඊට වැඩි මුදලක් සඳහා කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි වී සිටින අයට හෝ ග්‍රාම සංවර්ධන සමිති, විවිධ සේවා සමුපකාර සමිති හෝ වඩු කම්මාන්ත සමිතිවලට 1969 මාර්තු 7 වැනි සිකුරාද දවල් 12 වනතෙක් රත්නපුර දිසාපති කායභාලයේ දී ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම අපේක්ෂකයින් විසින් දිසාපති කාර්යාලයේ දී මේ වැඩ වෙනුවෙන් රු. 25 ක මුදලක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් දිසාපති කායභාලයට ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. යථෝක්ත සමිති විසින් මෙම මුදල තැන්පත් කිරීම අනවශ්‍යය. චැක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර්පත්‍ර සම්පූර්කොට අනුපිටපතක්ද සමග ලේඛණගත තැපැලෙන් එවිය යුතුය. සීල් තබන ටෙන්ඩරය බහා එවන කවරයේ උඩ වම් කෙලවරේ ටෙන්ඩර්කරුගේ නමද, ලිපිනයද, වැඩෙහි නමද ලියා තිබිය යුතුය. ටෙන්ඩර්පත්‍ර තැපැලෙන් නොවන්නේ නම් රත්නපුර දිසාපති කායභාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ හැක.

5. 1969 මාර්තු මස 14 වැනි සිකුරාදා පස්වරු 2 ට මෙම දිසාපති කායභාලයේ දි ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිත වරුන්ට හෝ පැමිණ සිටිය හැක.

6. ටෙන්ඩර්කරුවන් මෙම කොන්ත්‍රාත්තුව යටතේ වැඩ කරවා ගැනීමට ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට එකඟවිය යුතුය.

7. වැඩි විස්තර රත්නපුර දිසාපති කායභාලයේ සමාජසේවා අංශයෙන් ලබාගත හැක.

වී. ඊ. කුලසිංහ,
රත්නපුර දිසාපති වෙනුවට.

1969 පෙබරවාරි මස 5 වැනි දින,
රත්නපුර කච්චේරිය.

2–387—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

## රාජ්‍ය දැව සංස්ථාව

### නුවර ප්‍රදේශයට අයත් දැදුරුඔය යෝජනා ක්‍රමයට යටවන යෝජිත රක්ෂිත කැලෑවල දැව ඉවත් කිරීම

දැදුරුඔය යෝජනා ක්‍රමයට යටවන පහත සඳහන් ප්‍රදේශවලින් එක් එක් ප්‍රදේශයෙන් රු. 5,000 වටිනාකමට කඳන් සැපයීම සහ ගබඩාවනට සපයනු නොලබන දර සහ රවුන් කණු විකිණීම සඳහා කොළඹ 5, තිඹිරිගස්යාය පාරේ අංක 265 දරණ ස්ථානයේ රාජ්‍ය දැව සංස්ථාවේ ක්‍රියාකාරී කළමනාකරුගේ අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් රජයේ හා සංස්ථාවල ලියා පදිංචි වූ I සහ II වන පෙළ කොන්ත්‍රාත්කරුවන්ගෙන් හා කොන්ත්‍රාත්වල වටිනාකමට වත්කම් සහතික ඉදිරිපත් කළ හැකි අනෙක් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

ප්‍රදේශය

(i) මිනිවන්ගැටේ යෝජිත රක්ෂිතය.
(ii) පොතුවැව යෝජිත රක්ෂිතය.
(iii) ගෝනාගම යෝජිත රක්ෂිතය.
(iv) තිඹිරිවැව යෝජිත රක්ෂිතය.
(v) ජන් වැව යෝජිත රක්ෂිතය.

2. 1969.3.4 වැනි දින අ. භා. 2 දක්වා ටෙන්ඩර් ආකෘති පත් නිකුත් කරනු ඇත.

3. 1969.3.5 වැනි දින පූ. භා. 11 ට ටෙන්ඩර් පත් බාර ගැනීම අවසන් කරණු ඇත.

වැඩි විස්තර රාජ්‍ය දැව සංස්ථාවේ මහනුවර ප්‍රදේශයේ ප්‍රාදේශීය කළමනාකරුගෙන් හෝ කොළඹ 5, තිඹිරිගස්යාය පාරේ අංක 265 දරණ ස්ථානයේ ක්‍රියාකාරි කළමනාකරුගෙන් හෝ ලබාගත හැකිය.

1969,2,6,
ක්‍රියාකාරී කළමනාකරුගේ අංශය,
රාජ්‍ය දැව සංස්ථාව,
265, තිඹිරිගස්යාය පාර,
කොළඹ 5.

ඒ. සී. ආර්. රත්නරාජා,
සභාපති වෙනුවට,
රාජ්‍ය දැව සංස්ථාව.

2–452/1—69.2.41 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

## රාජ්‍ය දැව සංස්ථාව

### උතුරු ප්‍රදේශයට අයත් ප්‍රදේශයන්ගෙන් සිල්පර හා කඳන් සැපයීම

පහත සඳහන් ප්‍රදේශවලින් එහි දැක්වෙන වටිනාකමට සිල්පර හා කඳන් සැපයීම සඳහා කොළඹ 5, තිඹිරිගස්යාය පාරේ අංක 265 දරණ ස්ථානයේ රාජ්‍ය දැව සංස්ථාවේ ක්‍රියාකාරී කළමනාකරු අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් රජයේ හෝ සංස්ථාවල ලියා පදිංචි වූ I සහ II වන පෙළ කොන්ත්‍රාත්කරුවන්ගෙන් හා කොන්ත්‍රාත්තුවල වටිනාකමට වත්කම් සහතික ඉදිරිපත් කළ හැකි අනෙක් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

ප්‍රදේශය

(i) වලෙයි වට්ටකුලම් ර. අ. කැ.
කඳන් සැපයීම සඳහා රු. 50,000 වටිනාකමට.

(ii) මන්නිය කුලම්.
සිල්පර හා කඳන් සැපයීම සඳහා රු. 75,000 වටිනාකමට.

2. 1969.3.4 වැනි දින ප. ව. 2 දක්වා ටෙන්ඩර් ආකෘති පත් නිකුත් කරණු ලැබේ.

3. 1969.3.5 වැනි දින පෙ. ව. 11 ට ටෙන්ඩර්පත් බාර ගැනීම අවසන් කරණු ඇත.

වැඩි විස්තර යාපනයේ රාජ්‍ය දැව සංස්ථාවේ උතුරු ප්‍රදේශයේ ප්‍රාදේශීය කළමනාකරුගෙන් හෝ කොළඹ 5, තිඹිරිගස්යාය පාරේ අංක 265 දරණ ස්ථානයේ ක්‍රියාකාරී කළමනාකරුගෙන් හෝ ලබාගත හැකිය.

ඒ. සී. ආර්. රත්නරාජා,
සභාපති වෙනුවට,
රාජ්‍ය දැව සංස්ථාව.

1969,2,6,
ක්‍රියාකාරී කළමනාකරුගේ අංශය,
රාජ්‍ය දැව සංස්ථාව,
265, තිඹිරිගස්යාය පාර,
කොළඹ 5.

2–452/2—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

## රාජ්‍ය දැව සංස්ථාව

### රත්නපුර ප්‍රදේශයට අයත් ප්‍රදේශයන්ගෙන් සිල්පර හා කඳන් සැපයීම

පහත සඳහන් ප්‍රදේශවලින් එහි දැක්වෙන වටිනාකමට සිල්පර හා කඳන් සැපයීම සඳහා කොළඹ 5, තිඹිරිගස්යාය පාරේ අංක 265 දරණ ස්ථානයේ රාජ්‍ය දැව සංස්ථාවේ ක්‍රියාකාරී කළමනාකරු අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් රජයේ හෝ සංස්ථාවල ලියා පදිංචි වූ I සහ II පෙළ කොන්ත්‍රාත්කරුවන්ගෙන් හා කොන්ත්‍රාත්වල වටිනාකමට වත්කම් සහතික ඉදිරිපත් කළහැකි අනෙක් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

ප්‍රදේශය

(i) මාවර කන්ද මූකලාන.
සිල්පර සහ කඳන් සැපයීම සඳහා රු. 60,000 වටිනාකමට.

(ii) පේඩිකන්ද යෝජිත රක්ෂිතය.
(කුරුළු වගා ව්‍යාපාරය සඳහා මුදවා හරින ලද කොටස).
සිල්පර සහ කඳන් සැපයීම සඳහා රු. 45,000 වටිනාකමට.

(iii) රම්මල් කන්ද 3 වන කොටස.
සිල්පර සහ කඳන් සැපයීම සඳහා රු. 50,000 වටිනාකමට.

2. 1969.3.4 වැනි දින ප. ව. 2 දක්වා ටෙන්ඩර් ආකෘති පත් නිකුත් කරනු ලැබේ.

3. 1969.3.5 වැනි දින පෙ. ව. 11 ට ටෙන්ඩර් පත් බාර ගැනීම අවසන් කරණු ඇත.

වැඩි විස්තර රත්නපුරයේ රාජ්‍ය දැව සංස්ථාවේ රත්නපුර ප්‍රදේශයේ ප්‍රාදේශීය කළමනාකරුගෙන් හෝ කොළඹ 5, තිඹිරිගස්යාය පාරේ අංක 265 දරණ ස්ථානයේ ක්‍රියාකාරී කළමනාකරුගෙන් හෝ ලබාගත හැකිය.

ඒ. ඞී. ආර්. රත්නරාජා,
සභාපති වෙනුවට,
රාජ්‍ය දැව සංස්ථාව.

1969,2,6,
ක්‍රියාකාරී කළමනාකරුගේ අංශය,
රාජ්‍ය දැව සංස්ථාව,
265, තිඹිරිගස්යාය පාර,
කොළඹ 5.

2–452/3—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

## වාත්තු කම්හලට ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩරය

මෙම කාර්යාලයෙන් හෝ කොළඹ 5 හැව්ලොක් පාරේ අංක 242 වෙනි ස්ථානයේ පිහිටි අපගේ ප්‍රධාන කාර්යාලයෙන් හෝ ආපසු ගෙවන රුපියල් 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් හා ආපසු නොගෙවන රුපියල් දහයක (රු. 10) ටෙන්ඩර් ගාස්තුවක් ගෙවීමෙන් ලබාගතහැකි ටෙන්ඩර් පත්වල 1969 අප්‍රේල් මස 7 වෙනි දින පෙරවරු 10 වන තෙක් ගල් අඟුරු තාර, බෙන්ටෝ නයිට් මැටි, ගල් අඟුරු කුඩු, චැප්ලට්ස්, මීටර් රූල්ස්, ආයුධ වානේ, ලින් සීඩ් තෙල් යනාදිය සැපයීම උදෙසා ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් මුදල් 1969 අප්‍රේල් මස 6 වෙනි දින දහවල් 12.00 න් පසුව භාරගනු නොලබන අතර, ටෙන්ඩර් පත් ටෙන්ඩරය අවසාන වන දිනයේදී නිකුත් කරනු නොලැබේ. අවලංගු කරන ලද ටෙන්ඩර් පිටපත් රුපියල් දහයක් (රු. 10) බැගින් ගෙවීමෙන් ලබාගත හැක.

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව,
කර්මාන්තශාලාව, යක්කල.

මිළට ගැනුම් නිලධාරී.

2–348—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

1969 වර්ෂය තුළ අනුරාධපුර දිස්ත්‍රික්කයේ 'බී' කොටසට අයත් රජයේ ගොඩනැගිලි නඩත්තු කිරීම සහ සුළු වැඩි දියුණු කිරීම් සඳහා වූ ටෙන්ඩර් පත්, අනුරාධපුර උ. මැ. කො. අ. ඉ. කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1969 මාර්තු මස 12 වැනි බදාදා පස්වරු 2.30 වන තෙක් භාරගනු ලැබේ.

2. අනුරාධපුර රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනු පිටපතක්ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගතහැකි වන අතර, සැලැස්මද ඔහුගේ කායාලයේදී බලා ගැනීමට පිළිවන.

3. ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 51,000 කට නොඅඩු ගණනකට ලියා පදිංචිවූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 100 ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය වර්ෂ 1969 පෙබරවාරි මස 27 වැනි බ්‍රහස්පතින්දා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරී තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම් කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුවේ.

5. "ටෙන්ඩර් ලබාගැනීමට බලාපොරොත්තුවන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය."

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ඇම්. ආර්. ප්‍රනාන්දු,
අධිකාරී ඉංජිනේරු.

අනුරාධපුර,
අධිකාරී ඉංජිනේරු කායාලය,
1969. 1. 31.

2–324—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

1969 වර්ෂය තුළ අනුරාධපුර දිස්ත්‍රික්කයේ 'ඒ' කොටසට අයත් රජයේ ගොඩනැගිලි නඩත්තු කිරීම සහ සුළු වැඩි දියුණු කිරීම් සඳහා වූ ටෙන්ඩර් පත්, අනුරාධපුර උ. මැ. කො. අ. ඉ. කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1969 මාර්තු මස 12 වැනි බදාදා පස්වරු 2.30 වන තෙක් භාරගනු ලැබේ.

2. අනුරාධපුර රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනු පිටපතක්ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගතහැකි වන අතර, සැලැස්මද ඔහුගේ කායාලයේදී බලා ගැනීමට පිළිවන.

3. ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 68,000 කට නොඅඩු ගණනකට ලියා පදිංචිවූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 100 ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය වර්ෂ 1969 පෙබරවාරි මස 27 වැනි බ්‍රහස්පතින්දා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරී තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම් කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුවේ.

5. "ටෙන්ඩර් ලබාගැනීමට බලාපොරොත්තුවන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය."

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ඇම්. ආර්. ප්‍රනාන්දු,
අධිකාරී ඉංජිනේරු,
උතුරු මධ්‍යම කොට්ඨාශය.

අනුරාධපුර,
අධිකාරී ඉංජිනේරු කායාලය,
1969. 1. 31.

2–325—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

1969 වර්ෂය තුල නාලන්ද දිස්ත්‍රික්කයට අයත් රජයේ ගොඩ නැගිලි නඩත්තු කිරීම සහ සුළු අළුත්වැඩියා දියුණු කිරීම සඳහා වූ ටෙන්ඩර්පත්, අනුරාධපුර ර. වැ. දෙ. ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1969 මාර්තු මස 12 වැනි බදාදා පස්වරු 2.30 වන තෙක් භාරගනු ලැබේ.

2. නාලන්ද රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිර්මාන /ප්‍රධාන විධායක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර්පත් පිළියෙල කොට අනු පිටපතක්ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගතහැකි වන අතර, සැලැස්මද ඔහුගේ කාර්‍යාලයේදී බලා ගැනීමට පිළිවන.

3. ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 20,700 කට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර්පත් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය වර්ෂ 1969 පෙබරවාරි මස 27 වැනි බ්‍රහස්පතින්දා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර්පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර්පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරිතැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුවේ.

5. " ටෙන්ඩර් ලබාගැනීමට බලාපොරොත්තුවන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘතිපත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. "

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්‍යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ඇම්. ආර්. ප්‍රනාන්දු,
අධිකාරි ඉංජිනේරු, උතුරු මැද කොට්ඨාශය.

අනුරාධපුර,
අධිකාරී ඉංජිනේරු කාර්‍යාලය,
1969.2.5.

2–396—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

ඌව කොට්ඨාශය සඳහා දියතලාවේ රජයේ වැඩ දෙපාර්තමේන්තු ශාඛා වැඩපොලක් තැනීම සඳහා වූ ටෙන්ඩර් පත්, කොළඹ 1, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1969 මාර්තු මස 5 වැනි බදාදා පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ.

2. දියතලාව රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනුපිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර, සැලැස්ම ද ඔහුගේ කාර්‍යාලයේදී බලා ගැනීමට පිළිවන.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 3,50,000කට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 250 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1969 පෙබරවාරි මස 21 වැනි සිකුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම්කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමා වීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළයුතු වේ.

5. " ටෙන්ඩර් ලබාගැනීමට බලාපොරොත්තුවන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළයුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. "

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්‍යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

ආර්. ඇලෙක්සැන්ඩර්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය,
කොළඹ 1, 1969. 2. 4.

2-415—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාතීමේන්තුව

යාපනය ආයුර්වේද රෝහල තැනීම සඳහා වූ ටෙන්ඩර් පත්, කොළඹ 1, රජයේ වැඩ, තැපැල් හා විදුලි සංදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1969 මාර්තු මස 19 වැනි බදාදා පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ.

2. යාපනයේ රජයේ වැඩ දෙපාතීමේන්තුවේ විධායක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනුපිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර, සැලැස්ම ද ඔහුගේ කාර්‍යාලයේදී බලා ගැනීමට පිළිවන.

3. ර. වැ. දෙපාතීමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා "ඒ" සහ 'බී' ශ්‍රේණි යටතේ ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 250 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1969 පෙබරවාරි මස 27 වැනි බ්‍රහස්පතින්දා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමා වීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළයුතු වේ.

5. ටෙන්ඩර් ලබා ගැනීමට බලාපොරොත්තු වන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුයි.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ර. වැ. දෙපාතීමේන්තුවේ ප්‍රධාන කාර්‍යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

වී. ගුණරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

ර. වැ. දෙ. ප්‍රධාන කාර්යාලය,
කොළඹ 1.
1969. 2. 7

2-422/1—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

## රජයේ වැඩ දෙපාතීමේන්තුව

1969 වර්ෂය තුළ නැගෙනහිර කොළඹ අංක 6 (රීජන්ට් වීදිය) ප්‍රදේශයේ රජයේ ගොඩනැගිලි හා රජයේ ගොඩනැගිලිවල ජල සම්පාදනය හා ජල ප්‍රවාහනය නඩත්තු කිරීම සහ සුළු වැඩිදියුණු කිරීම් සඳහා වූ ටෙන්ඩර් පත්, කොළඹ 1, රජයේ වැඩ දෙපාතීමේන්තුවේ ප්‍රධාන කායඝීලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1969 මාර්තු මස 12 වැනි බදාදා පෙරවරු 11.00 වන තෙක් භාර ගනු ලැබේ.

2. කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ රජයේ වැඩ දෙපාතීමේන්තුවේ නැගෙනහිර කොළඹ ගොඩනැගිලි විධායක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනු පිටපතක් ද සහිතව ඉදිරිපත් කළයුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර, සැලැස්ම ද ඔහුගේ කායඝීලයේදී බලා ගැනීමට පිළිවන.

3. ර. වැ. දෙපාතීමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 1,80,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 200 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1969 පෙබරවාරි මස 27 වැනි බ්‍රහස්පතින්දා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමා වීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරී තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළයුතු වේ.

5. ටෙන්ඩර් ලබා ගැනීමට බලාපොරොත්තු වන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුයි.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ර. වැ. දෙපාතීමේන්තුවේ ප්‍රධාන කායඝීලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

පී. ගුණරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

ර. වැ. දෙ. ප්‍රධාන කාර්යාලය,
කොළඹ 1,
1969. 2. 7.

2–422/2—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාතීමේන්තුව

1969 වර්ෂය තුළ නැගෙනහිර කොළඹ අංක 7 (අංගොඩ) ප්‍රදේශයේ රජයේ ගොඩනැගිලි හා රජයේ ගොඩනැගිලිවල ජල සම්පාදනය හා ජල ප්‍රවාහනය නඩත්තු කිරීම සහ සුළු වැඩිදියුණු කිරීම් සඳහා වූ ටෙන්ඩර් පත්, කොළඹ 1, රජයේ වැඩ දෙපාතීමේන්තුවේ ප්‍රධාන කායඝීලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1969 මාර්තු මස 12 වැනි බදාදා පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ.

2. කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ නැගෙනහිර කොළඹ ගොඩනැගිලි විධායක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙල කොට අනු පිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර, සැලැස්ම ද ඔහුගේ කායඝීලයේදී බලා ගැනීමට පිළිවන.

3. ර. වැ. දෙපාතීමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 1,42,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පත් තැන්පත් මුදල වන රු. 200 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1969 පෙබරවාරි මස 27 වැනි බ්‍රහස්පතින්දා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමා වීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. ටෙන්ඩර් ලබා ගැනීමට බලාපොරොත්තුවන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුයි.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ, ර. වැ. දෙපාතීමේන්තුවේ ප්‍රධාන කායඝීලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

පී. ගුණරත්නම්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

ර. වැ. දෙ. ප්‍රධාන කාර්යාලය,
කොළඹ 1,
1969. 2. 7.

2–422/3—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

## සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි

මෙම කාර්යාලයේ, පලාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන්, විවිධ සේවා සමුපකාර සමිතිවලින්, ග්‍රාමසංවර්ධන සමිතිවලින් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

### හෝමාගම ගම්වගා නිලධාරි කොට්ඨාශය

| | | |
|---|---|---|
| 1. | හෝකන්දර ගො.ක,ස. ප්‍රදේශයේ ... | පාලම් ඇල කඩාංඩු පිරවීම |
| 2. | එම ... | පාලම් ඇල ශුද්ධ කිරීම |
| 3. | එම ... | පන්සල් කුඹුර පැති බැම්ම බැඳීම |
| 4. | පිට්පන උතුර ගො.කා.ස. ප්‍රදේශයේ... | දෙල්ගහ කුඹුර අමුනට රුදවුම් ලෑලි සැපයීම |

### නුගේගොඩ ගම්වගා නිලධාරි කොට්ඨාශය

| | | |
|---|---|---|
| 5. | පමුනුව-දෙපානම ගො.කා.ස. ප්‍රදේශයේ | දෙනියෙ කුඹුර ජල දෙර තැනීම |
| 6. | අඹතලෙන් පහල බටහිර ගො.කා.ස. ප්‍රදේශයේ | කිඹුලා ඇල කුඹුරේ ඇල ප්‍රතිසංස්කරණය කිරීම |

### පිලියන්දල ගම්වගා නිලධාරි කොට්ඨාශය

| | | |
|---|---|---|
| 7. | වෙනිවැල්කොල ගො.කා.ස. ප්‍රදේශයේ | වෙනිවැල් කොල මහ අමුනට පැති බැම් තැනීම |

### කඩවත ගම්වගා නිලධාරි කොට්ඨාශය

| | | |
|---|---|---|
| 8. | කරගහමුන ගො.කා.ස. ප්‍රදේශයේ ... | වැවේ කුඹුර පිටල් ශුද්ධ කිරීම |
| 9. | කිරිල්ලවල ගො.කා.ස. ප්‍රදේශයේ ... | ඉදිගහයාය අමුන තැනීම |
| 10. | දරණගම ගො.කා.ස. ප්‍රදේශයේ ... | රග්ගහ ඇල ශුද්ධ කිරීම |

### කඳන ගම්වගා නිලධාරි කොට්ඨාශය

| | | |
|---|---|---|
| 11. | ඒකල දකුණ ගො.කා.ස. ප්‍රදේශයේ ... | පහල මාළිලිය ජලදෙර අළුත්වැඩියාව |
| 12. | එම ... | පාලු ඇලට පයිප්ප සැපයීම |
| 13. | එම ... | මැදමාළිලිය අමුන තැනීම |
| 14. | එම ... | ගොරකගහ ඇල හරක් පැන්නුම තැනීම |
| 15. | රාගම ගො.කා.ස. ප්‍රදේශයේ ... | රාගම දුම්රිය පල ළඟ සිට යන ඇලේ අමුන තැනීම |
| 16. | ඒකල උතුර ගො.කා.ස. ප්‍රදේශයේ ... | පිනිබරුව ජල දෙරට ලෑලි සහ ඉබි යතුරු සැපයීම |

### කිරිඳිවැල ගම්වගා කොට්ඨාශය

| | | |
|---|---|---|
| 17. | ඉදුරුගල්ල කන්නිමහර ගො.කා.ස. ප්‍රදේශයේ | පන්සල් ගොඩැල්ල අමුන තැනීම |
| 18. | පැලහැල ගො.කා.ස. ප්‍රදේශයේ ... | පැලහැල ගව මංකඩ තැනීම |
| 19. | ඌරාපොල ගො.කා.ස. ප්‍රදේශයේ ... | පොලොන්න කුඹුර අමුන තැනීම |
| 20. | දියාවල වෙරලුගම්පල ගො.කා.ස. ප්‍රදේශයේ | දංගහ කුඹුර අමුන තැනීම |
| 21. | එම ... | කොස්වත්ත අමුනට ලෑලි සැපයීම |

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල ය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසිවලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1969 පෙබරවාරි මස 22 දින දවල් 12 දක්වා කොළඹ

දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචන වලින් ද දැක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි වියයුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සැමෙකක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොද සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොද, සීල් තබන ලද ලියුම් කවරවල බහා, කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ උඩ වම් කෙළවරේ ''..............................................සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය '' යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර, 1969 පෙබරවාරි මස 23 දින දවල් 12 ට පෙර කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති '' ටෙන්ඩර් පෙට්ටියට '' දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරිතැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දස දිනක් ඇතුළත දී එම ටෙන්ඩර්කරු විසින් කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුලත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරනවගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 10%ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාමලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැති ව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමඟ නම ඇතුළත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතුන් උඩ, කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමඟ හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුලදී සැලසුම් පරීක්ෂා කර බැලීමට කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුළත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුලදී කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන්ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. ''ලාංකික'' යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අය යි.

12. තෝරාගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටිනු කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමඟ ගිවිසුමකට ඇතුළත් විය යුතුය. '' ගොවිජන සේවා සහකාර කොමසාරිස් '' යනුවෙන් හැඳින්වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරී තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු වියයුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය සුතුය.

13. කොළඹ දිස්ත්‍රික්කයේ ගොවි ජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1969 පෙබරවාරි මස 25 දින පෙ.ව. 9.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන් ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරී තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර් කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

ඊ. ඇස්. ගුනතිලක,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
කොළඹ දිස්ත්‍රිකය.

කොළඹ දිස්ත්‍රික්කයේ
ගොවිජන සේවා සහකාර කොමසාරිස්තැන ගේ කාර්යාලය,
1969 පෙබරවාරි මස 6 දින දීය.

2–385—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

## තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

### ටෙන්ඩර් ප්‍රතිඵල

| අංකය | ටෙන්ඩරයේ සඳහන් ප්‍රමාණය | වර්ගය | අවසන් කළ දිනය | ඇණවුම් කළ ප්‍රමාණය | ලැබුණු ටැන්ඩර් ගණන | සාර්ථක ටැන්ඩර්කරු | නිෂ්පාදිත රට | මිළ |
|---|---|---|---|---|---|---|---|---|
| 1. | ...දිගටොන් 600 | ...බලිවිඩ ක්‍රාප්ට කල්ක | 68. 6. 7 | ...දිගටොන්... 600 | 11 | ...එලොප් හැන්සන් සමාගම, ගොටෙබෝග්, ස්වීඩනය | ...ස්වීඩනය | ...කොළඹට දිග ටොන් 1 ක් ආ.මි.වා. සහිත ස්වීඩන් ක්‍රෑරු 870 |
| 2. | ...දිගටොන් 300 | ...අන්බලිවිඩ ක්‍රාප්ට් කල්ක | 68. 6. 7 | ...දිගටොන්... 300 | 9 | ...සීමාසහිත ඇක්මන් සහ සමාගම, ගොතෙන්බර්ග්, ස්වීඩනය | ස්වීඩනය | ...කොළඹට දිග ටොන් 1 ක් ආ.මි.වා. සහිතව පවුම් 56/18 |
| 3. | ...දිගටොන් 100 | ...රොසින් ... | 68. 8.31 | ...දිගටොන්... 100 | 20 | ...සීමාසහිත මිට්ෂු සහ සමාගම, ඔසාකා මධ්‍යම, ජපානය | ජපානය | ...කොළඹට දිගටොන් 1 ක් ආ.මි.වා. සහිතව පවුම් 90 |
| 4. | ...දිගටොන් 20 | ...ස්ටාච් ... | 68. 8.31 | ...දිගටොන්... 20 | 22 | ...හර්මන් පෝල්සන් සමාගම, හැම්බර්ග්, බටහිර ජර්මනිය | බටහිර ජර්මනිය | ...කොළඹට දිග ටොන් 1 ක් ආ.මි.වා. සහිතව ඩොයිෂ් මාක් 1,109.85 |
| 5. | ...දිගටොන් 1,000 | රීල් වශයෙන් යුත් ක්‍රාප්ට් කඩදාසි | 68.10.25 | ...දිගටොන්... 250 | 21 | ...පර්සි වැන් ෂොල්ට්ස් සමාගම, ස්වීඩනය | ස්වීඩනය | ...කොළඹට දිගටොන් 1 ක් ආ.මි.වා. සහිතව පවුම් 80/13/7 |
| | | | | දිගටොන් 250 | | මෝබර්ග් සහ සමාගම, ගොටෙබර්ග්, ස්වීඩනය | ස්වීඩනය | එම |
| | | | | දිගටොන් 250 | | එලොප්හැන්සන් සමාගම, ගොටෙන්බර්ග්, ස්වීඩනය | ස්වීඩනය ... | එම |

| අංකය | ටෙන්ඩරයේ සඳහන් ප්‍රමාණය | වර්ගය | අවසන් කළ දිනය | ඇණවුම් කළ ප්‍රමාණය | ලැබුණු ටෙන්ඩර් ගණන | සාර්ථක ටෙන්ඩර් කරු | නිෂ්පාදිත රට | මිළ |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | දිගටොන් 250 | | ස්කැන්ඩිනේවියන් ඕවර්සීස් ස්වීඩනය පේපර් සමාගම, ඇක්ටියො-බලැක්, ස්වීඩනය | ...කොළඹට ආ.මි.වා. 80/13/7 | දිගටොන් 1 ක් සහිතව පවුම් |
| 6. | ...දිගටොන් 600 | සල්පර් | ... 68.10.31... | දිගටොන් 600 | 29 | ...කෙමිෂි ඉන්ඩස්ට්‍රියල් බටහිර ගෙසෙල්ෂාපට් ප්‍රැන්ක්පර්ට්, ජර්මනිය බටහිර ජර්මනිය | කොළඹට ආ.මි.වා. සහිතව ඇමෙරිකානු ඩොලර් 96.25 | දිගටොන් 1 ක් |
| 7. | ...දිගටොන් 600 | ඇලුමිනියම් සල්පේට් | ... 68.11.15... | දිගටොන් 600 | 45 | ...සීමාසහිත කෙමිකල් කෝප සිංගප්පූරුව රේෂන් සමාගම, සිංගප්පූරුව | ...කොළඹට ආ.මි.වා. සහිතව පවුම් 22/9 | දිගටොන් 1 ක් |

ති. බ. නාරන්පනාව,
සාමාන්‍යාධිකාරි,
නැගෙනහිර කඩදසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

කොළඹ 2, යූනියන් පෙදෙසේ අංක 135 දීය.

2–439—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

# බඩු බාහිරාදිය විකිණීම

## කැලෑ දෙපාර්තමේන්තුවේ දැව දඬු වෙන්දේසියේ විකිණීම

කැලෑ දෙපාර්තමේන්තුවේ දකුණු දිසාභාර වන නිලධාරි විසින් තවලම අඩවියේ තිබෙන වන අපරාධවලට අයත් (කඳන් සහ ආයුධ ඇතුළුව) හොර, මිල්ල, දියපර, වල්ජම්බු, කටබොඩ, පොල්හුන්න, කීන, දුන්, හැඩවක, බදුල්ල, නා, තිනිය, ගුරුකීන, වැලිපැන්න කම් පොත්ත, පෙලන්, යකහලු, කොකුන්, අළුබෝ, ගොඩපර සහ කණු ආදිය තොග 19 ක් 1969 පෙබරවාරි මස 26 වෙනි දින පෙරවරු 11.30ට තවලම අඩවි වන නිලධාරි කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වෙන්දේසියේ දැව ඉල්ලුම් කිරීමට අදහස් කරන්නන්ට ඒ ඒ ස්ථානයන් වෙත ගොස් දැව පරීක්ෂා කිරීමට අවසර දෙනු ලැබේ.

2. වෙන්දේසියේ දැව ඉල්ලුම් කිරීමට අදහස් කරන අය වෙන්දේසි අවස්ථාවේදී කියවනු ලබන කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කල යුතුයි. මෙම වෙන්දේසිය සම්බන්ධයෙන් වැඩිදුරටත් විස්තර අවශ්‍ය අයට දකුණු දිසාභාර වන නිලධාරිතුමා ගේ කාර්යාලයෙන් හෝ තවලම අඩවි වන නිලධාරි කාර්යාලයෙන් හෝ පැමිණ ලබාගත හැක.

ඒ. ඩබ්ලිව්. සෙනෙවිරත්න,
දකුණු දිසා වන නිලධාරි.

1969 ජනවාරි මස 21 වෙනි දින,
ගාල්ලේ දකුණු දිසා වන නිලධාරි කාර්යාලයේදීය.

2–403—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

## රාජකීය ලංකා නාවික හමුදාව

### පරණ රට උළු ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1969 පෙබරවාරි 26 වෙනි බදාදා පෙරවරු 10 ට කොළඹ කොටුවේ ගල්බොක්කේ පිහිටි රාජකීය ලංකා නාවික හමුදා මූලස්ථානයේ මාර්ගස්ථ ගබඩා භූමියේදී පරණ රට උළු ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

විකුණනු ලබන උළු 1969 පෙබරවාරි මස 26 වැනි දින පෙරවරු 8 සිට 10 දක්වා වේලාව තුළදී පරීක්ෂා කළ හැකිය.

වෙන්දේසිය අවසානයේ දී සම්පූර්ණ මුදල ගෙවීම අවශ්‍ය වේ. මිළදී ගත් උළු එදින පස්වරු 4 ට පෙර ඉවත් කර ගත යුතුය.

ආර්. කදිර්ගාමර්,
නාවික හමුදාධිපති.

1969 ජනවාරි මස 30 දින,
කොළඹ 1,
රාජකීය ලංකා නාවික හමුදා මූලස්ථානයේදීය.

2–414—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම උසාවියේ ඇති පහත සඳහන් භාණ්ඩ 1969.3.2 දින ප. ව. 2 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මෙයින් දන්වමි.

1. උසාවියේ නියෝගයන් අනුව විකිණීමට නියම කර ඇති භාණ්ඩ.
2. පොලිසිය විසින් උසාවියට ඉදිරිපත් කරණ ලද, මෙතෙක් හිමිකරුවන් ඉදිරිපත් වී නො මැති භාණ්ඩ.
3. උසාවියේ නියෝගයන් අනුව විනාශ කිරීමට නියමව ඇති, එහෙත් ප්‍රයෝජනයට ගත හැකි භාණ්ඩ.

බයිසිකල් සහ වෙනත් භාණ්ඩයන් මේ අතර ඇති බව සලකන්න. වෙන්දේසියේදී මෙම භාණ්ඩ ගැනුම්කරුවන් විසින් එකවර මුදල් ගෙවා එදිනම රැගෙන යා යුතු බවද දන්වමි. ගෙවීම මුදලින් කළ යුතුය. චෙක්පත් භාරගනු නො ලැබේ.

සී. ඊ. මැන්දිස්,
මහෙස්ත්‍රාත් තැන, දකුණු කොළඹ.

1969 ජනවාරි මස 29 වන දින,
දකුණු කොළඹ මහෙස්ත්‍රාත් උසාවියේ දීය.

2–336—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

## දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### පරිහව කළ බඩු වෙන්දේසියක්

කොළඹ 1, නව මහ ලේකම් ගොඩනැගිල්ලේ, දේශීය ආදායම් කායසීලයේදී පහත සඳහන් බඩු තොගය 1969 පෙබරවාරි මස 25 වැනි දින ප. ව. 2 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථමයෙන් මෙම කාර්යාලයට පැමිණ එකී භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැක.

ජයග්‍රාහී ඉල්ලුම්කරුවන් විසින් වෙන්දේසිය අවසන් වූ වහාම භාණ්ඩවල වටිනාකම මුදලින්ම ගෙවා ඔවුන් මිලදී ගත් භාණ්ඩ ඉවත් කර ගත යුතුය.

ආර්. තිරුමේනි,
දේශීය ආදායම් කොමසාරිස් වෙනුවට.

මගේ අංකය : ආර්. පී. එෆ්. 18
1969 ජනවාරි 30 දින,
කොළඹ, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දීය.

| | | |
|---|---|---|
| යතුරු ලියන (ඉංග්‍රීසි) | ... | 5 |
| උෂ්ණ උඳුන් | ... | 2 |
| විදුලි ලිපවල් ලොකු | ... | 2 |
| විදුලි බලෙන් සෝදන යන්ත්‍ර | ... | 1 |
| විදුලි ශීතකරණයක්, | ... | 1 |
| ලෝහ තහඩු තොගයක්. | | |

2–305—69.2.14. දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

## ධීවර දෙපාර්තමේන්තුව

### ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පහත දැක්වෙන ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම, 1969 පෙබරවාරි 21 වැනි දින පෙ. ව. 10 ට මීගමුව, මැල්ලවීදියේ පිහිටි මීගමුවේ ධීවර අභ්‍යාස මධ්‍යස්ථානයේ දී සිදු කරනු ලැබේ.

එන්ජින් බඳක්, සිලින්ඩර් ස්ලීව් එකක්, පාර්සන් ගියර් පෙට්ටියක්, රොකර් ආර්ම් බ්‍රැකට් එකක්, සිලින්ඩර් හෙඩ් එකක්, ජව රෝද, තනි සිලින්ඩර දඟර කඳක්, ක්ලච් බ්ලොක් කොටස්, වතුර පොම්පයක්, ටයිමිං කේස් කවර්, ලිස්ටර් ස්ටාටිං හැන්ඩ්ල්, ගෑස් සිලින්ඩර, බොයිලර් පයිප්පයක්, ඩයිනමෝවක්, ගවනර් කේසිං, රෙඩක්ෂන් ගියර් කේසය් හා කවර්, ක්‍රෑන්ක් ෂාෆ්ට් ඔයිල් සීල් එන්ඩ් එකක්, එන්ජින් සයිඩ් කවර් එකක්, වෙන්ෂන් ස්ප්‍රිං සහිත ක්ලච් එකක්, රොකර් ආම් ඇසැම්බ්ලි, නැංගුරමක්, එන්ජින් සම්ප් එකක්, ඩෙවුට්ස් වායු ශෝධකයක්, ඉන්ධන ටැංකි (කුබෝටා, ලිස්ටර්, ආන්ෂානි සහ යන්මාර්) සයිලන්සරයක්, දඟර කඳක්, (දෙණ) එන්ජින් බඳක්, එන්ජින් හෙඩ් කවර් එකක්, මෝටරයක්, පිටාර කවුළුවක් (එක්ස්හෝස්ට් පයිප්පයක්) සමුද්‍ර ඩීසල් ඇන්ජින් (කුබෝටා සහ ලිස්ටර්) හෝල්ට් බල්බ් ඇන්ජිමක්, සම්පූර්ණ ක්ලච් පෙට්ටියක්, මැරයින් ඩීසල් කවෙන්ට්රි කෑන්ක්කේස්, ටනිං වීල්ස් සහිත 6 සිලින්ඩර් කඳන් සහ ට්‍රෝලර් බොයිලර් ටියුබයක්.

මීගමුවේ ධීවර මධ්‍යස්ථානයේ සිටින ධීවර පරීක්ෂක තැන සමග කලින් වේලාවක් නියම කර ගෙන, මෙම භාණ්ඩ වෙන්දේසියට පෙර කාර්යාල වේලාව තුළදී පරීක්ෂා කර බැලිය හැකිය.

ජයග්‍රාහී ඉලාලුම්කරුවන් විසින්, දමුලින් ගෙවීම් කළ යුතු අතර, වෙන්දේසිය අවසන් වූ වහාම මිළදී ගන්නා ලද භාණ්ඩ ඉවත් කර ගත යුතුය.

ධීවර අධ්‍යක්ෂ.

ධීවර දෙපාර්තමේන්තුව,
කොළඹ 3.

2–322—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිනීම්

## වවුනියා දිස්ත්‍රික්කයේ රා රේන්ද නැවත විකිණීම

### 1969 මාර්තු මස 1 සිට 1969 සැප්තැම්බර් 30 දින කාලය දක්වා

1969 මාර්තු මස 1 ද සිට 1969 සැප්තැම්බර් මස 30 දක්වා වූ කාලය සඳහා වවුනියාව දිස්ත්‍රික්කයේ රා තැබෑරුම්වල සිල්ලරට රා විකිණීමේ අයිතිය පමණක් විකිණීම සඳහා (පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට) සුරාබදු බලපත්‍රයනට අදාළ පොදු කොන්දේසි මාලාවට යටත්ව 1968-69 කාලය සඳහා අංක 14,819 හා 1968.9.13 වැනි දින ප්‍රකාශයට පත් ගැසට් පත්‍රයේ සඳහන් කොන්දේසිවලට අනුකූලව ටෙන්ඩර්පත් මෙයින් කැඳවනු ලැබේ.

2. පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් කර ඇති වේලාවට කලින් වවුනියාව දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා වෙත ලැබෙන පරිදි ටෙන්ඩර් පත්‍ර "1968-69 වර්ෂය සඳහා වවුනියාව දිස්ත්‍රික්කයේ රා රේන්ද මිළයට ගැනීමේ ටෙන්ඩරය" යි සඳහන් කර 1969 පෙබරවාරි මස 23 වැනි දිනට ප්‍රථම එවිය යුතුයි.

3. එක් එක් තැබෑරුම සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත්‍රය බැගින් එවිය යුතුයි. තවද, එක් අයකු විසින් එක තැබෑරුමක් සඳහා එක ටෙන්ඩරයකට වැඩි ගණනක් නොඑවිය යුතුය. එක් තැබෑරුමක් සඳහා පස් දෙනෙකුට නොවැඩි ගණනකට සාමූහිකව ටෙන්ඩරයක් එවිය හැකිය.

4. පහත සඳහන් කොන්දේසිවලට අනුකූල නොවූ ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ :—

(අ) ටෙන්ඩර් පත්‍රය එවනු ලැබූ අය පුද්ගලිකව නොපැමිණියහොත්,

(ආ) සෑම ටෙන්ඩර් පත්‍රයකටම ටෙන්ඩර්කරුගේ නිශ්චල දේපල පිහිටි කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරියා විසින් නිකුත් කරන ලද වත්කම් සහතිකයේ මුල් පිටපතද අමුණා තිබිය යුතු අතර, එක් තැබෑරුමකට වැඩියෙන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කරන අවස්ථාවල මෙහි පහත දක්වා ඇති පරිදි, මුල් පිටපත සහ එහි විධිමත් ලෙස සහතික කරන ලද පිටපතක් අමුණා තිබිය යුතුය. එවැනි වත්කම් සහතිකයක් අමුණා නොමැත්තාවූද, ටෙන්ඩරයේ දැක්වෙන මුදල් ප්‍රමාණයෙන් 25—කට අඩු වටිනාකමක් ඇති වත්කම් සහතිකයක් අමුණා ඇත්තාවූද, ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් ප්‍රතික්ෂේප කළ හැකිය. තැබෑරුම් එකකට වැඩි ගණනකට ටෙන්ඩර් ඉදිරිපත් කරන ටෙන්ඩර්කරුවන් විසින් එම රේන්ද වර්ෂයේදීම අනික් එක් ටෙන්ඩරයක් සමග වත්කම් සහතිකයේ මුල් පිටපත අමුණා යවා ඇත්නම් අනිකුත් ටෙන්ඩරවලට එම සහතිකයේ, සහතික පිටපත් අමුණා යැවිය හැකිය. එවැනි අවස්ථාවලදී මුල් වත්කම් සහතිකය අමුණා යැවූ ටෙන්ඩරයට අදාළ තැබෑරුමේ පිහිටීම, නම සහ අංකය දැක්වෙන සටහනක් අනික් ටෙන්ඩර්පත්‍ර සමග ඉදිරිපත් කරන සහතික පිටපත්වල තිබිය යුතුය.,

5. ටෙන්ඩර්පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් එවීම හෝ වවුනියාව දිසාපති කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ දැමීම හෝ වවුනියාව දිසාපතිතුමාට හෝ එතුමාගේ කායසීල සහකාර තැනට හෝ පුද්ගලිකව භාරදීම කළ හැකි නමුත්, ටෙන්ඩර්පත්‍ර එවනු ලබන ලියුම් කවරයේ වම් කෙළවරේ ටෙන්ඩරය එවනු ලැබූ තැබෑරුමේ නම හා අංකය සඳහන් කර කවරය සීල් තබා එවිය යුතුය. එක් එක් ටෙන්ඩරය සම්බන්ධයෙන් එක් ලියුම් කවරය බැගින් පාවිච්චි කළ යුතු අතර එක් එක් ලියුම් කවරයේ ඉහතින් සඳහන් කර ඇති පරිදි තැබෑරුමේ නම හා අංකය සඳහන් කළ යුතුය.

6. විකිණීමේ කොන්දේසි සපුරාලීම වශයෙන් සෑම ටෙන්ඩර් පත්‍රිකාවක් සමගම රු. 1,000ට කච්චේරි කුවිතාන්සියක් ඇමිණිය යුතුයි. සියළු තැන්පත් කිරීම් වවුනියා දිස්ත්‍රික්කයේ දිසාපති නමින් එවිය යුතුය. සාර්ථක වූ ටෙන්ඩර් පත්‍රිකාව ඉදිරිපත් කළ අය ඔහුට එම වරප්‍රසාද හිමි වූ විගසම විකිණීමේ කොන්දේසිවලට අත්සන් තැබීමට ඉදිරිපත් නොවුවහොත් ඇප මුදල රාජසන්තක වේ.

7. ඕනෑම ටෙන්ඩරයක් ප්‍රතික්ෂේප කිරීමේ බලය වවුනියාව දිසාපතිතුමා සතුය.

8. සාර්ථක ලෙස ටෙන්ඩරය ඉදිරිපත් කරන ලද ටෙන්ඩර්කරු රා රේන්ද මිළට ගත් ලෙස ප්‍රකාශයට පත්කළ වහාම වවුනියා දිසාපතිතුමා විසින් ඇප මුදල් වශයෙන් නියම කරනු ලබන මුදල වහාම දිසාපතිතුමා වෙත ගෙවිය යුතු අතර, ටෙන්ඩර්කරු විසින් අවශ්‍ය මුද්දර ඉදිරිපත් කර කොන්දේසිමාලාවකට හා කොන්ත්‍රාත්තුවකට අත්සන් තැබිය යුතුය.

9. සාර්ථක ලෙස ටෙන්ඩර් කරන ලද අය ගැනුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම තමා විසින් තැබෑරුම පවත්වාගෙන යාමට තෝරාගත් ස්ථානය දිසාපතිතුමාට දැන්විය යුතු අතර, ඒ සඳහා එතුමාගෙන් අනුමැතිය ලබාගත යුතුය.

10. පූර්වෝක්ත විකිණීම සම්බන්ධ කොන්දේසි හා වෙනත් විස්තර සඳහා වවුනියාව දිසාපති කායසීලයට ලියා විමසන්න.

## උපලේඛනය

| අංකය හා ප්‍රදේශය | තැබෑරුම් පිහිටි පළාත් පාලන කොට්ඨාශය | ටෙන්ඩර් භාරගැනීම නවත්වන වේලාව |
|---|---|---|
| 2 වලයන්මඩම | ... ගම්සීමාව තුළ | ... පෙ.ව. 10.00 ට |

බී. සී. පෙරේරා,
වවුනියා දිසාපති.

1969 පෙබරවාරි මස 10 වැනි දින,
වවුනියා දිසාපති කායයාලයේදීය.

2–547—69.2.14 දින අංක 14,841 දරන ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳ වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වෙලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්‍යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

## උපලේඛනය

**1969**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 3. 1.69 | සිකුරාද | 24.12.68 | අඟහරුවාද | ප.ව. | 3.30 |
| | 9. 1.69 | බ්‍රහස්පතින්ද | 3. 1.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 16. 1.69 | බ්‍රහස්පතින්ද | 9. 1.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 24. 1.69 | සිකුරාද | 16. 1.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 31. 1.69 | සිකුරාද | 24. 1.69 | සිකුරාද | දවල් | 12.00 |
| පෙබරවාරි | 7. 2.69 | සිකුරාද | 31. 1.69 | සිකුරාද | දවල් | 12.00 |
| | 14. 2.69 | සිකුරාද | 7. 2.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 21. 2.69 | සිකුරාද | 14. 2.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 27. 2.69 | බ්‍රහස්පතින්ද | 20. 2.69 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| මාර්තු | 7. 3.69 | සිකුරාද | 27. 2.69 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 14. 3.69 | සිකුරාද | 7. 3.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 21. 3.69 | සිකුරාද | 14. 3.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 28. 3.69 | සිකුරාද | 21. 3.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| අප්‍රේල් | 3. 4.69 | බ්‍රහස්පතින්ද | 27. 3.69 | බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 11. 4.69 | සිකුරාද | 31. 3.69 | සඳුද | ප.ව. | 3.30 |
| | 18. 4.69 | සිකුරාද | 8. 4.69 | අඟහරුවාද | දවල් | 12.00 |
| | 25. 4.69 | සිකුරාද | 18. 4.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 30. 4.69 | බදාද | 23. 4.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| මැයි | 9. 5.69 | සිකුරාද | 30. 4.69 | බදාද | ප.ව. | 3.30 |
| | 15. 5.69 | බ්‍රහස්පතින්ද | 9. 5.69 | සිකුරාද | ප.ව. | 3.30 |
| | 22. 5.69 | බ්‍රහස්පතින්ද | 15. 5.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | 30. 5.69 | සිකුරාද | 22. 5.69 | බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| ජූනි | 6. 6.69 | සිකුරාද | 30. 5.69 | සිකුරාද | දවල් | 12.00 |
| | 13. 6.69 | සිකුරාද | 6. 6.69 | සිකුරාද | දවල් | 12.00 |
| | 20. 6.69 | සිකුරාද | 13. 6.69 | සිකුරාද | දවල් | 12.00 |
| | 27. 6.69 | සිකුරාද | 20. 6.69 | සිකුරාද | ප.ව. | 3.30 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1968 දෙසැම්බර් මස 20 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණාලය. කොළඹ.**

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි.